වෙළුම 17, 2024

ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව

වෙළුම 17, 2024

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව

© ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය 2024

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකගේ අවසරයකින් තොර ව මෙම පර්යේෂණ සඟරාව හෝ එහි කොටස් උපුටා ගැනීම හෝ ලිඛිත ඉලෙක්ට්‍රොනික් කවර හෝ කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම පළ කිරීම විකාශනය කිරීම අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

ISSN 2279 – 3216

ISSN (Online) 3084-268

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

http://research.nie.ac.lk/nie

මුද්‍රණය: මුද්‍රණ සහ ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව

සංස්කාරක මණ්ඩලය

මහාචාර්ය ප්‍රසාද් සේතුංග	ජාතික අධ්‍යාපන ආයතනය
මහාචාර්ය දයාලතා ලේකම්ගේ	ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
ආචාර්ය චින්තක චන්ද්‍රකුමාර	කොළඹ විශ්ව විද්‍යාලය
ආචාර්ය එස්. ඩී. කේ. විජේසුන්දර	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු	ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික)

සංස්කාරක

එච්. එම්. ඩී. එස්. හේරත් මයා

පූර්ව සංස්කාරක මණ්ඩලය

අමරා පීරිස් මිය

එම්. ඒ. පී. මුණසිංහ මයා

ඩබ්ලිව්. කේ. ශිරානි පුෂ්පමාලා මෙය

මහාචාර්ය එම්. වී. විතානපතිරණ

ආචාර්ය එල්. ඒ. ඩී. කරුණාදාස

සංස්කාරක කාර්යාලය

එම්. පී. ආර්. ධනවර්ධන මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
ආචාර්ය එස්. කේ. ප්‍රභාහරන්	අධ්‍යක්ෂ
එන්. ඩී. දිසානායක මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඩී. හෙට්ටිගේ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
එම්. ඩී. ඩී. අයි. ද සිල්වා මෙය	සහකාර අධ්‍යාපනඥ
එච්. ඒ. එස්. නිදේශ් මයා	සහකාර කථිකාචාර්ය
වී. අගල්යා මිය	සහකාර කථිකාචාර්ය
බී. පී. ජී. එස්. ගුණරත්න මිය	සහකාර කථිකාචාර්ය

පටුන

පිටු අංකය

01 පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කරන අංශ 01 - 17
වනසිංහ, පී. කේ., වනසිංහ, එස්.

02 කන්නන්ගර යුගයේ ලොග් සටහන්වලින් හෙළි වන විදුහල්පති කළමනාකරණ භූමිකාව 18 - 33
මහතන්තිල, එම්. එස්.

03 පිරිවෙන් විද්‍යායතනවල සංගීත විෂයය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය 34 - 49
යටිවැල්ල, වයි. කේ. යූ. බී.

04 ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළපොත්වල ජනවර්ග සංකල්පය නියෝජනය: පර්යේෂණ සාහිත්‍ය විචාරයක් 50 - 57
දිසානායක, එන්. ඩී., වෙඩිකන්දගේ, එල්. එන්. පී.

05 අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා 58 - 72
කුමාර, ඩී. එල්. ආර්. ඒ.

SRI LANKAN JOURNAL OF EDUCATIONAL RESEARCH

Sri Lankan Journal of Educational Research 2024
Volume 17, Pages 1– 17
Department of Research and Development

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කරන අංශ

වනසිංහ, පී. කේ., වනසිංහ, එස්.
පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
pkwanasinghe@gmail.com, wmwan@ou.ac.lk

සංක්ෂිප්තය: *ගුණාත්මක බව අධ්‍යාපනයේ හදවත වන අතර ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ගුරුවරු සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරති. ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරීමට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන (School Based Teacher Professional Development - SBTPD) වැඩසටහන් දායකත්වය සපයයි. එමගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කරන අංශ අනාවරණය කර ගැනීම අධ්‍යයනයේ පරමාර්ථය විය. ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිත කළ අධ්‍යයනයේ නියැදිය ලෙස සරල අහඹු නියැදි ක්‍රමය යටතේ උතුරු මැද පළාතේ ගුරුවරුන් 700ක් තෝරා ගන්නා ලදි. දත්ත එකතු කිරීමේ උපකරණය ලෙස ප්‍රශ්නාවලියක් භාවිත කරන ලද අතර ප්‍රතිශත සහ මධ්‍යන්‍ය ඇසුරෙන් දත්ත විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණය අනුව පන්ති කාමර කළමනාකරණ කුසලතාව සංවර්ධනය, ආත්ම විශ්වාසය තහවුරු කිරීම, නව ඉගැන්වීම් උපායමාර්ග අධ්‍යයනය සඳහා යොමු වීම, සිසුන් ඉගෙනීමට යොමු කරන ආකාරයෙන් SBTPD වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ යෑම, ගුරුවරයා හෝ පන්ති කාමර ඇගයීම මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ යෑම, පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වී ලබන වෘත්තීය සංවර්ධනය තුළින් ශිෂ්‍ය විශ්වාසය ඉගෙනුම්කරුවකු ලෙස වර්ධනය වීම සිදු වන බව තහවුරු විය. එම නිසා SBTPD වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරීමට එකී වැඩසටහන් ප්‍රායෝගික වීම, ගුරු කුසලතා සංවර්ධනය වන ලෙසට SBTPD වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ එය ශිෂ්‍ය සාධනයට බලපාන බව නිගමනය කළ හැකි ය. තව ද යථෝක්ත වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය සංවර්ධනය කිරීමට ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරමින් එය උසස් වීම් සඳහා නිර්දේශ කිරීම, වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සක්‍රිය ව සම්බන්ධ වීම සහ ප්‍රායෝගික ව භාවිත කිරීම වෘත්තීය සමාලෝචනයේ දී සලකා බැලීම, වෘත්තීය සංවර්ධන පුහුණුව ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරන්නන් ජාතික මට්ටමින් ඇගයීම සහ වෘත්තීය සංවර්ධන පරිසරයක් ගොඩ නැගීම කළ යුතු බවට යෝජනා කරන ලදි.*

මුඛ්‍ය පදඃ ***වෘත්තීය සංවර්ධනය, පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්, ඉගැන්වීම, ගුණාත්මකභාවය***

හැඳින්වීම

ගුරුවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ පන්ති කාමර භාවිතය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය යාන්ත්‍රණයක් ලෙස වෘත්තීය සංවර්ධනය සැලකේ. එමගින් ගුණාත්මක වෘත්තීය සංවර්ධනයක් ඇති වී ධනාත්මක පාසල් සංස්කෘතියක් නිර්මාණය කිරීම, පුරවැසිභාවය, ගුරු කුසලතා වැඩි දියුණු කිරීම සහ සමපදස්ථ ඉගෙනුම් අවස්ථා වැඩි දියුණු කිරීම වැනි ගුණාත්මක ප්‍රතිඵල ලබා ගත හැකි වේ. සිසුන්ගේ ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා එක් මාර්ගයක් වන්නේ පාසල්වල ගුරුවරුන්ට වඩාත් ඵලදායි වෘත්තීය ඉගෙනුම් ක්‍රියාකාරකම් සැපයීම යි. එම ක්‍රියාකාරකම් ගුරුවරුන් සහ සිසුන් තුළ ධනාත්මක වෙනසක් ඇති කරන බව Opfer සහ Pedder (2011) සඳහන් කර ඇත. ගුරුවරයාගේ හැකියාව, වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ කැප වීම මත අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රඳා පවතින බව Rahman සහ තවත් අය (2011) ප්‍රකාශ කර ඇත. ඒ සඳහා ගුරුවරුන්

පුහුණු කිරීම, පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් කළ යුතු වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිද්ධාන්ත සහ භාවිතය අතර පවතින නොගැළපීම මෙන් ම සිද්ධාන්ත සහ ප්‍රායෝගික භාවිතය අතර ඇති පරතරය සම්බන්ධයෙන් ගැටලුවක් මෙන් ම විවේචනයක් ද පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශය (2012) සඳහන් කර ඇත. එම නිසා ගුරුවරුන්ට විවිධ වූත් අර්ථවත් වූත් අධ්‍යාපන අවස්ථා සුලභ කරමින් ගුරු පුහුණුව වඩාත් කාර්යක්ෂම ව සංවිධානය කිරීමේ වගකීම පාසල වෙත පැවරිය යුතු බව යෝජනා කරන ලදි. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා 2013 වර්ෂයේ දී පාසල් පාදක ගුරු සංවර්ධනය හඳුන්වා දෙනු ලැබුවත් නැවතත් 2019 වර්ෂය වන විට පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙමින් පාසල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බවට ප්‍රකාශ කිරීමෙන් ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ඵලදායි ව ක්‍රියාත්මක නො වන බවත් එය ගුරුවරයාගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හේතු වී නොමැති බවත් හෙළි වේ. පාසල්වල ක්‍රියාත්මක වන ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් අපේක්ෂිත ඉලක්ක ඉටු නොවීම ගැටලු සහගත තත්ත්වයකි.

වෘත්තීය සංවර්ධනයක අවශ්‍යතාව අවබෝධ කර ගත් විදුහල්පති තම කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය උදෙසා ක්‍රියා කරන බව Baron (2008) සඳහන් කර ඇත. ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කිරීම විදුහල්පති විසින් කළ යුතු වේ. විදුහල්පතිගේ නායකත්වය යටතේ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ගන්නා ක්‍රියාමාර්ග ගුරුවරුන්ගේ ආකල්ප සමග ඍජු ව ම සම්බන්ධ වන බව Bossi (2009) සඳහන් කර ඇත. වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තුළ ඒ සම්බන්ධයෙන් පවතින ආකල්ප ඍණාත්මක වූ විට එය ක්‍රියාත්මක කිරීමට විදුහල්පතිට හැකියාවක් නොමැත. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගුරුවරුන් සමග සාකච්ඡා කර පිළියෙල කරන ලද ඉදිරි සැලසුමට අනුව විදුහල්පතිවරුන් විසින් පාසල පදනම් කර ගත් ගුරු සංවර්ධන වැඩසටහන් සංවිධානය කළ යුතු බව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2016) නිර්දේශ කර ඇත. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව එලෙස නිර්දේශ කරන්නේ විදුහල්පතිවරුන් පාසල්වල වෘත්තීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගුරුවරුන්ගේ අවශ්‍යතා සහ ආකල්ප පිළිබඳ සැලකිලිමත් නො වන නිසා ය.

ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය පිළිබඳ ව බොහෝ අර්ථකථන ඉදිරිපත් ව ඇත. පාසල්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සිසුන්ගේ ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා වැදගත් උපක්‍රමයක් ලෙස වෘත්තිය සංවර්ධනය භාවිත කළ හැකි බව Witte සහ Jansen (2016) සඳහන් කර ඇත. Darling-Hammond ගුරුවරයාගේ ගුණාත්මකභාවය පර්යේෂණ ඇසුරින් සාමාන්‍ය අධ්‍යයන හැකියාව සහ බුද්ධිය, විෂය දැනුම, ඉගැන්වීම සහ ඉගෙනීම, ඉගැන්වීමේ පළපුරුද්ද සහ සහතික කිරීමේ තත්ත්වය යනුවෙන් කාණ්ඩ පහක් යටතේ හඳුනා ගෙන ඇත. එය සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල සංවර්ධනය කිරීමට දායක වන බව Darling-Hammond (2000) වැඩිදුරටත් පෙන්වා දී ඇත. ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය නිශ්චිත අරමුණුවලට ප්‍රතිචාර වශයෙන් වෙනස් ලෙස අවබෝධ කර ගත යුතු අතර ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය එක් සුවිශේෂී ලක්ෂණයක් මත පදනම් වී නොමැති බව ඉන් පැහැදිලි වේ. ඒ අනුව ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් සිසු සාධනය වර්ධනය කිරීමත් කළ හැකි බව පැහැදිලි වේ.

අධ්‍යයනයේ අරමුණ සහ පර්යේෂණ ප්‍රශ්න

උතුරු මැද පළාතේ අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක ඇසුරින් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කරන අංශ අනාවරණය කර ගැනීම පර්යේෂණ අරමුණ වූ අතර ඒ සඳහා පහත සඳහන් පර්යේෂණ ප්‍රශ්න භාවිත කරන ලදි.

1. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධනය නිසා ගුරුවරුන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රදර්ශනය කරන කුසලතා කවරේ ද?
2. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ක්‍රමෝපාය භාවිත කරන්නේ ද?
3. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සුදුසු ඇගයීම් ක්‍රමවේද භාවිත කරන්නේ ද?

ක්‍රමවේදය

ප්‍රමාණාත්මක ප්‍රවේශය යටතේ කරන ලද අධ්‍යයනය සඳහා සාරම්මන නියැදි ක්‍රමය භාවිත කරමින් උතුරු මැද පළාතේ 1AB, 1C, 2 සහ 3 වර්ගයේ පාසල් නියෝජනය වන පරිදි පාසල් 40ක් තෝරා ගනිමින් ගුරුවරුන් 700ක් සරල අහඹු නියැදි ක්‍රමයෙන් තෝරා ගන්නා ලදි. සමීක්ෂණ ක්‍රමය අනුගමනය කරමින් ප්‍රශ්නාවලි මගින් දත්ත රැස් කරන ලදි. ගුරු නියැදියට ලබා දුන් ප්‍රශ්නාවලියෙන් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සිදු වන ක්ෂේත්‍ර 15ක් අනාවරණය කර ගනු ලැබී ය. එකී ප්‍රකාශ සඳහා "තරයේ විශ්වාස නොකරමි, විශ්වාස නොකරමි, තරමක් දුරට විශ්වාස කරමි, විශ්වාස කරමි, තරයේ විශ්වාස කරමි" යන පංච ලක්ෂ්‍ය පරිමාණයට අදාළ ව, දත්ත විශ්ලේෂණය, ප්‍රතිශත සහ මධ්‍යන්‍ය ඇසුරින් සිදු කරන ලදි.

දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනය

ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය කිරීම ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල මූලික අභිමතාර්ථය වේ. ගුරු කුසලතා සංවර්ධනය කිරීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කළ හැකි ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන කුසලතා සංවර්ධනය කිරීමට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපාන්නේ දැයි අනාවරණය කර ගැනීම පළමු පර්යේෂණ ප්‍රශ්නය විය.

ක්‍රියාත්මක කරන පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ගුරු කුසලතා සංවර්ධනය වීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වන බවට විශ්වාසයක් නොමැති බවට නියැදියෙන් 51%ක් ප්‍රතිචාර දැක්වීමෙන් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය නො කරන බව අනාවරණය විය. නියැදියෙන් 30%කට පමණක් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය වන බවට විශ්වාසයක් පවතින බව අනාවරණය විය. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය නො වන බවට ප්‍රතිශතාත්මක ව ඉහළ අගයක් ගනු ලැබුවත් නියැදිය ලබා දුන් සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු

මධ්‍යන්‍ය අගයයෙන් ($\bar{x}$=2.75, SD=.946) ඉගැන්වීම් කුසලතා සංවර්ධනය වීම පිළිබඳ තරමක් දුරට විශ්වාස කරන බව අනාවරණය විය (1 වන වගුව).

1 වන වගුව

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධනය නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන් තුළ ප්‍රදර්ශනය කරන කුසලතා පිළිබඳ ගුරු ප්‍රතිචාර

ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කරන අංශ	විශ්වාස නොකරමි		තරමක් දුරට විශ්වාස කරමි		විශ්වාස කරමි		මධ්‍යන්‍ය	සම්මත අපගමනය
	සං.	ප්‍රති.	සං.	ප්‍රති.	සං.	ප්‍රති.		
ඉගැන්වීම් කුසලතා සංවර්ධනය වේ	357	51%	134	19%	209	30%	2.75	.95
පන්ති කළමනාකරණ කුසලතා සංවර්ධනය වේ	53	08%	124	18%	523	75%	3.89	.86
විෂය දැනුම පුළුල් වේ	418	60%	163	23%	119	17%	2.54	.87
නව අධ්‍යාපනික භාවිතයන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කෙරේ	388	56%	226	32%	82	12%	2.55	.70
ගුරුවරයකු ලෙස ආත්ම විශ්වාසයෙන් කටයුතු කෙරේ	-	-	111	16%	589	84%	4.21	.70
වැඩි දුර ඉගෙනුමට පොලඹවයි	402	57%	160	23%	138	20%	2.60	.83

$\leq$ 1.80 - තරයේ විශ්වාස නො කරමි 1.81-2.60 - විශ්වාස නො කරමි
2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි 3.41- 4.20 - විශ්වාස කරමි
$\geq$ 4.21 තරයේ විශ්වාස කරමි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන පන්ති කාමරය තුළ විවිධ මට්ටමේ සිසුන් දක ගත හැකි ය. එක් එක් විෂය කරුණු සිසුන්ට සම්ප්‍රේෂණය කිරීමේ දී සමස්ත සිසුන්ට ඇසෙන පෙනෙන ලෙස ඉගෙනුම් ආධාරක වැනි දෑ භාවිත කළ හැකි අයුරින් පන්ති කාමරය සකස් කළ යුතු වේ. වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරයකු ලෙස පන්ති කාමර කළමනාකරණය කර ගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් කුසලතාවක් හිමි වේ. ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වන ලෙසට පන්ති කාමර කළමනාකරණය පිළිබඳ කුසලතාව වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් සිදු වන්නේ දැයි විමසන ලදු ව 75%ක් පන්ති කාමර කළමනාකරණ කුසලතාව සංවර්ධනය වන බවට එකඟ වන ලදි. පන්ති කාමර කළමනාකරණය පිළිබඳ කුසලතාව සිදු නො වන බවට 8%ක් ප්‍රතිචාර දක්වන ලදි. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=3.89, SD=.86) පන්ති කාමර කළමනාකරණය පිළිබඳ කුසලතාව සංවර්ධනය වන ලෙසට වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන බව තහවුරු විය. පන්ති කාමර කළමනාකරණය පිළිබඳ නිසි පුහුණුවක් ගුරුවරුන්ට ලැබෙන බවත් ගුරුවරුන්ගේ

ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනයට එය බලපාන බවත් නිගමනය කළ හැකි ය.

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය වීම පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී පාසල් වර්ග හතර ම (3 වර්ගය $\overline{x}$=2.60, SD=.90, 1C වර්ගය $\overline{x}$=2.71, SD=.96, 1AB වර්ගය $\overline{x}$=2.80, SD=.93, 2 වර්ගය $\overline{x}$=2.87, SD=.98) පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය වීමෙන් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීම තරමක් දුරට සිදු වන බවට විශ්වාසයක් පවතින බව අනාවරණය විය. එසේ ම 3 වර්ගයේ පාසල්වල ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා වර්ධනය වීමට වඩා 2 වර්ගයේ පාසල්වල ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා සංවර්ධනය වී ඉගැන්වීමේ ගුණාත්මකභාවය තරමක් දුරට වර්ධනය කරන බව හෙළි විය (2 වන වගුව).

2 වන වගුව

පාසල් වර්ගය අනුව පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධනය නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන් තුළ ප්‍රදර්ශනය කරන කුසලතා පිළිබඳ ගුරු ප්‍රතිචාර

පාසල් වර්ගය		1	2	3	4	5	6
1 AB වර්ගය	මධ්‍යන්‍ය	2.80	3.80	2.56	2.60	4.12	2.58
	සංඛ්‍යාව	252	252	252	252	252	252
	ස. අපගමනය	.93	.88	.86	.70	.69	.82
1C වර්ගය	මධ්‍යන්‍ය	2.71	4.05	2.46	2.52	4.25	2.62
	සංඛ්‍යාව	225	225	225	225	225	225
	ස. අපගමනය	.96	.79	.86	.69	.63	.83
2 වර්ගය	මධ්‍යන්‍ය	2.87	3.64	2.67	2.62	4.09	2.74
	සංඛ්‍යාව	129	129	129	129	129	129
	ස. අපගමනය	.98	.86	.92	.77	.77	.88
3 වර්ගය	මධ්‍යන්‍ය	2.60	4.09	2.48	2.38	4.54	2.44
	සංඛ්‍යාව	94	94	94	94	94	94
	ස. අපගමනය	.90	.85	.81	.61	.67	.74
එකතුව	මධ්‍යන්‍ය	2.75	3.89	2.54	2.55	4.21	2.60
	සංඛ්‍යාව	700	700	700	700	700	700
	ස. අපගමනය	.95	.86	.87	.70	.70	.83

$\leq$ 1.80 - තරයේ විශ්වාස නොකරමි 1.81-2.60 - විශ්වාස නොකරමි
2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි 41-4.20 - විශ්වාස කරමි
$\geq$ 4.21 තරයේ විශ්වාස කරමි

පන්ති කාමර කළමනාකරණ කුසලතාව ඇති වන ලෙසට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම පිළිබඳ ගුරු සංජානන පාසල්

වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී පාසල් වර්ග හතරෙහි (2 වර්ගය $\bar{x}$=3.64, SD=.86, 1AB වර්ගය $\bar{x}$=3.80, SD=.88, 1C වර්ගය $\bar{x}$=4.05, SD=.79, 3 වර්ගය $\bar{x}$=4.09, SD=.85) පන්ති කාමර කළමනාකරණ කුසලතාව සංවර්ධනය වන බවට ගුරුවරුන් පිළිගන්නා ලදි. පාසල් වර්ග අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගය පාසල්වල පන්ති කාමර කළමනාකරණය ඉහළින් ක්‍රියාත්මක වන බව අනාවරණය විය. 3 වර්ගයේ පාසල්වල ප්‍රාථමික පන්ති පමණක් ක්‍රියාත්මක වන අතර ගුරුවරුන්ට පන්ති කාමර කළමනාකරණය කිරීම පහසු වීම එයට හේතු විය හැකි ය.

වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරු වෘත්තීය කුසලතා සංවර්ධනය කිරීම මෙන් ම විෂය දැනුම ලබා දීම ද සිදු කෙරේ. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් විෂය දැනුම පුළුල් වීම මගින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ යන්නේ දැයි විමසන ලදි. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් විෂය දැනුම පුළුල් කිරීමේ වැඩසටහන්වලින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය නො වන බවට නියැදියෙන් 60%ක් ප්‍රතිචාර දැක්වීමෙන් විෂය සම්බන්ධ දැනුම නොලැබීම නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට බලපෑමක් සිදු නො කරන බව අනාවරණය විය. නියැදියෙන් 17%ක් පමණක් විෂය දැනුම පුළුල් වන බවට ප්‍රතිචාර දක්වන විට නියැදියෙන් 23%ක් තරමක් විෂය දැනුම පුළුල් වන බවට ප්‍රතිචාර දක්වන ලදි. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් විෂය දැනුම පුළුල් කිරීම සිදු නො වන බවට ප්‍රතිශතාත්මක ව අනාවරණය වූ අතර සමස්ත ප්‍රතිචාර සඳහා වන මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.54, SD=.87) ද තහවුරු විය. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවත් එමගින් තමන් උගන්වන විෂයයට අදාළ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම නිසා ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය නො වන අතර පාසල් තුළ එක් එක් විෂයය ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපහසු වීම එයට හේතු වූවා විය හැකි ය.

ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 1C ($\bar{x}$=2.46, SD=.86), 3 ($\bar{x}$=2.48, SD=.81) සහ 1AB ($\bar{x}$=2.56, SD=.86) වර්ගයේ පාසල්වල ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් විෂය දැනුම පුළුල් නො වන බවට ප්‍රතිචාර දක්වන විට 2 වර්ගයේ ($\bar{x}$=2.67, SD=.92) පාසල්වල ගුරුවරුන් තරමක් දුරට විෂය දැනුම පුළුල් කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. පාසල් අතර ප්‍රතිචාරවල වෙනසක් පවතින බව ඉන් අනාවරණය විය.

විෂය දැනුම පුළුල් කිරීමේ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පාසල් පාදක ව සිදු නොවීම නිසා ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අපහසු බවත් එම නිසා ම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීමක් සිදු නො වන බවත් තහවුරු විය.

වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව අධ්‍යාපනික ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රායෝගික ව භාවිත කිරීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි ය. නමුත් ගුරු නියැදිය ලබා දුන් ප්‍රතිචාර අනුව වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් නව අධ්‍යාපනික භාවිතයන් පිළිබඳ අවබෝධය ලබා දෙනු ලැබුවත් එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත නො කරන බවට නියැදියෙන් 56%ක් ප්‍රතිචාර දැක්වීමෙන් අනාවරණය විය. නමුත් 32%ක් නව අධ්‍යාපනික ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රායෝගික ව භාවිත කිරීම තරමක් දුරට සිදුවන බව විශ්වාස කරන බවට ප්‍රතිචාර දක්වන විට නියැදියෙන් 12%ක් පමණක් එකඟ වීමෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් නව අධ්‍යාපනික භාවිතයන් පිළිබඳ අවබෝධය ලබා දෙනු ලැබුවත් එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත නො

කරන නිසා ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමක් සිදු නො වන බව අනාවරණය විය. ඒ බව සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.55, SD=.70) ද වඩාත් තහවුරු විය.

පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගයේ ($\bar{x}$=2.38, SD=.61), 1C වර්ගයේ ($\bar{x}$=2.52, SD=.69) සහ 1AB වර්ගයේ ($\bar{x}$=2.60, SD=.70) පාසල්වල ගුරුවරුන් අධ්‍යාපනික ව්‍යවහාර පිළිබඳ නව දැනුම පන්ති කාමරයේ දී භාවිත කිරීම පිළිබඳ විශ්වාසයක් නොමැති බවට ප්‍රතිචාර දක්වන ලදි. එසේ ම 2 වර්ගයේ ($\bar{x}$=2.62, SD=.77) පාසල්වල ගුරුවරුන් නව අධ්‍යාපනික ව්‍යවහාර පිළිබඳ දැනුම පන්ති කාමරයේ දී භාවිත කිරීම පිළිබඳ විශ්වාසයක් ඇති බව අනාවරණය විය. 1AB වර්ගය, 1C වර්ගය සහ 3 වර්ගයේ පාසල් ගුරුවරුන්ට නව අධ්‍යාපනික ව්‍යවහාර පන්ති කාමරය තුළ භාවිත නොකළත් 2 වර්ගයේ පාසල් ගුරුවරුන් තරමක් දුරට හෝ භාවිත කිරීම සතුටුදායක ය.

ගුරුවරයෙකුට තමන් උගන්වන විෂය කරුණු පිළිබඳ ව, භාවිත කරන ඉගෙනුම් ආධාරක සහ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ව, ක්‍රියාත්මක කරන ඇගයීම් සහ තක්සේරු ක්‍රම පිළිබඳ ව අවබෝධයක් ඇති විට ආත්ම විශ්වාසයෙන් කටයුතු කළ හැකි වේ. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ට ඉහත කරුණු සම්බන්ධ ව පුළුල් අවබෝධයක් ලබා දීමෙන් ගුරුවරයාට තමන්ට තමන් පිළිබඳ ව විශ්වාසයක් තහවුරු කළ හැකි වේ. එය ඉගැන්වීමේ ගුණාත්මකභාවයට බලපානු ලැබේ. ගුරු නියැදියෙන් ලැබුණු ප්‍රතිචාර අනුව 84%ක් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ආත්ම විශ්වාසය තහවුරු කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. ගුරුවරුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නැගීම තරමක් දුරට සිදු වන බවට නියැදියෙන් 16%ක් විශ්වාස කරන බව අනාවරණය විය. ප්‍රකාශය සමග එකඟ නො වුණු එක ම ගුරුවරයකු හෝ නොසිටීම විශේෂත්වයකි. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=4.21, SD=.70) ද පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ආත්ම විශ්වාසය වඩාත් තහවුරු කරන බවට අනාවරණය විය. වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් තමන් නොදන්නා දෙයක් පිළිබඳ ව හෝ අලුත් දෙයක් පිළිබඳ ව හෝ ගුරු කුසලතා සංවර්ධනය වීමක් සිදු වන නිසා වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ආත්ම විශ්වාසය වර්ධනය වන බවට ප්‍රතිචාර දක්වන්නට ඇත. වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය වීමට යම් බලපෑමක් සිදු කරන නිසා ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීම නොවැළැක්විය හැක්කකි.

ගුරුවරයෙකු ලෙස ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමට වෘත්තීය සංවර්ධන වැඩසටහන් උපකාරී වීම සම්බන්ධයෙන් ලබා දුන් ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 2 වර්ගයේ ($\bar{x}$=4.09, SD=.77) සහ 1AB වර්ගයේ ($\bar{x}$=4.12, SD=.69) ගුරුවරුන්, වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගුරුවරුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නගන බවට ප්‍රතිචාර දක්වන විට 1C වර්ගයේ ($\bar{x}$=4.25, SD=.63) සහ 3 වර්ගයේ ($\bar{x}$=4.54, SD=.67) පාසල් ගුරුවරු වඩාත් විශ්වාස කරන බවට එකඟ වූහ. පාසල් වර්ග හතරෙහි ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වීමෙන් ගුරු කුසලතා සංවර්ධනය වන බවත් එයින් ආත්ම විශ්වාසය ගොඩ නැගෙන බවට පිළිගැනීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවයට බලපෑමක් සිදු කරන බව අනාවරණය විය.

ගුරුවරුන්ගේ ප්‍රතිචාර මගින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් ආත්ම විශ්වාසයෙන් යුතු ව කටයුතු කරන බව අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වර්ධනය සිදු නොවීමට මෙය බලපෑම්

කළ හැකි ය. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඉගෙනුම් පාඩම් සැලසුම සකස් කිරීම, ඒ අනුව ඉගෙනුම් ආධාරක සකස් කිරීම සහ භාවිත කිරීම, පාඩමට අදාළ ව තක්සේරුකරණය සහ ඇගයීම සිදු කිරීම ප්‍රයෝගික ව ක්‍රියාත්මක නොකරන නිසා ආත්ම විශ්වාසයෙන් යුතු ව ක්‍රියා නොකිරීම එයට හේතු විය හැකි ය. එසේ ම විදුහල්පතිවරුන් නිසි අධීක්ෂණයක් නොකිරීම මෙන් ම වෘත්තීය සංවර්ධන වැඩසටහන් පිළිබඳ පසු විපරමක් නොකිරීම ගුරුවරුන් පාඩම් සැලසුම් ලිවීම, ඉගෙනුම් ආධාරක භාවිතය සිදු නොකිරීමට හේතු වි හැකි ය.

වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වන්නන්ට ඒ කෙරෙහි නැවත නැවත සම්බන්ධ වීමට ආශාවක් කුතුහලයක් ඇති වන අයුරින් වැඩසටහන් පැවැත්වීමට සම්පත්දායකයින් උපක්‍රමශීලී විය යුතු වේ. යම් වෘත්තීය සංවර්ධන වැඩසටහනකට සම්බන්ධ වූ අයෙකු සහභාගි වූ වැඩසටහනට අදාළ ව වැඩිදුර ඉගෙනුමකට පොලඹවයි නම් එය සාර්ථක වෘත්තීය සංවර්ධන වැඩසටහනක් ලෙස සැලකිය හැකි ය. එසේ ම එය ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට රුකුලක් වේ. වෘත්තීය සංවර්ධන වැඩසටහනින් පසු වැඩි දුර ඉගෙනුමකට යොමු කරන්නේ දැයි විමසූ විට නියැදියෙන් 57%ක් එසේ සිදු නො වන බවට ප්‍රතිචාර දක්වන ලදි. එසේ ම නියැදියෙන් 23%ක් තරමක් දුරට වැඩි දුර ඉගෙනුමට පොලඹවන බවට ප්‍රතිචාර දක්වන විට නියැදියෙන් 20%ක් වෘත්තීය සංවර්ධන වැඩසටහනින් පසු වැඩි දුර ඉගෙනුමකට යොමු කරන බවට පිළිගත්හ. ප්‍රතිශතාත්මක අගය අනුව වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගුරුවරුන් වැඩිදුර ඉගෙනුමකට යොමු නො කරන බව අනාවරණය කරන විට සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.60, SD=.83) ද වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් වැඩිදුර ඉගෙනුමකට යොමු නො කරන බවට තහවුරු විය. ඉන් පැහැදිලි වනුයේ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වැඩි දුර ඉගෙනුමකට යොමු නො කරන නිසා ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට බල නො පාන ආකාරයයි.

ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගයේ ($\bar{x}$=2.44, SD=.74) සහ 1AB වර්ගයේ ($\bar{x}$=2.58, SD=.82) පාසල් ගුරුවරුන් වැඩි දුර ඉගෙනුමකට යොමු නො කරන බව අනාවරණය වුවත් 1C වර්ගය ($\bar{x}$=2.62, SD=.83) සහ 2 වර්ගය ($\bar{x}$=2.74, SD=.88) පාසල් ගුරුවරුන් තරමක් දුරට යොමු කරන බවට අනාවරණය විය. වැඩසටහන්වලට සම්බන්ධ වන සම්පත්දායකයින්ගේ වැඩසටහන් මෙහෙයවීමේ හැකියාව, කුසලතාව ගුරුවරුන් වැඩි දුර ඉගෙනුමකට පෙලඹවීමට හේතු විය හැකි ය.

ගුරු ප්‍රතිචාර අනුව පාසල් පාදක ව ක්‍රියාත්මක කරන වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් වැඩි දුර ඉගෙනුමකට යොමු නොකිරීමෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් නිසා ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනයට බලපෑම් නො කරන බව අනාවරණය විය.

ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ක්‍රමෝපාය භාවිත කළ යුතු වේ. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දුන් පුහුණුව ගුරුවරුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී භාවිත කරන්නේ දැයි අනාවරණය කර ගැනීම දෙවන පර්යේෂණ ප්‍රශ්නයේ අරමුණ විය.

ගුරුවරයකු බවට පත්වීමට පෙර සමහරුන් වෘත්තීය පුහුණුව ලබන අතර ඇතැමෙක් ගුරුවරයෙකු ලෙස පත්වීම ලබා ගැනීමෙන් වෘත්තීය පුහුණුව ලබා ගනු ලබයි. ඉන් පසු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ද ඒ පිළිබඳ ව නව දැනුම

අත්පත් කර ගනු ලැබේ. එලෙස ලබන දැනුම ප්‍රායෝගික ව භාවිත කරන්නේ දැයි ගුරුවරුන්ගෙන් විමසූ විට 60%ක් ශිෂ්‍ය ඉගෙනීම සම්බන්ධ අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව භාවිත නො කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. නියැදියෙන් 22%ක් ශිෂ්‍ය ඉගෙනීම සම්බන්ධ අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව භාවිත කිරීම තරමක් දුරට සිදුවන බවට ප්‍රතිචාර දක්වන විට නියැදියෙන් 17%ක් පමණක් අධ්‍යාපනික න්‍යාය ප්‍රයෝගික ව භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන න්‍යායාත්මක දැනුම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත නො කරන බවට ප්‍රතිචාර දැක්වීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපෑමක් සිදු නො කරන බව අනාවරණය විය. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයයෙන් ($\bar{x}$=2.52, SD=.83) ද තහවුරු වූයේ වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන ශිෂ්‍ය ඉගෙනීම පිළිබඳ අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව පන්ති කාමරයේ දී භාවිත නො කරන බවයි (3 වන වගුව).

3 වන වගුව

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන විවිධ ක්‍රමෝපාය පිළිබඳ ගුරු ප්‍රතිචාර

ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කරන අංශ	විශ්වාස නොකරමි		තරමක් දුරට විශ්වාස කරමි		විශ්වාස කරමි		මධ්‍යනය	සම්මත අපගමනය
	සං.	ප්‍රති.	සං.	ප්‍රති.	සං.	ප්‍රති.		
ශිෂ්‍ය ඉගෙනීම සම්බන්ධ අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව භාවිත කෙරේ.	422	60%	157	22%	121	17%	2.52	.83
නව ඉගැන්වීම් උපාය මාර්ග සඳහා කැප වේ.	8	01%	139	20%	553	79%	4.00	.68
නව උපදේශන, උපාය මාර්ග සමඟ පුහුණු වීම සිදු කෙරේ.	344	49%	140	20%	216	31%	2.82	.89
ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් සටහන් කෙරේ.	365	52%	147	21%	188	27%	2.74	.87
සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් ඇති කරයි.	370	53%	152	22%	178	25%	2.72	.85

$\leq$ 1.80 - තරයේ විශ්වාස නොකරමි

1.81-2.60 - විශ්වාස නොකරමි

2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි

3.41- 4.20 - විශ්වාස කරමි

$\geq$ 4.21 තරයේ විශ්වාස කරමි

ගුරුවරුන් ලබා දුන් ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 2 වර්ගයේ ($\bar{x}$=2.65, SD=.86) පාසල් ගුරුවරුන් තරමක් දුරට අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන විට 3 වර්ගය ($\bar{x}$=2.37, SD=.72), 1AB වර්ගය ($\bar{x}$=2.49, SD=.85) සහ 1C වර්ගය ($\bar{x}$=2.54, SD=.83) යන පාසල් ගුරුවරුන් ශිෂ්‍ය ඉගෙනීම පිළිබඳ අධ්‍යාපනික න්‍යාය පන්ති කාමරයේ

දී ප්‍රායෝගික ව භාවිත නො කරන බව අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තමන් ඉගෙන ගත් න්‍යාය අවශ්‍ය අවස්ථාවල ප්‍රායෝගික ව භාවිත නොකිරීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනයට බලපාන අතර ශිෂ්‍ය සාධනය අවම වීමට හේතු විය හැකි ය.

වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා ගන්නා න්‍යාය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන් භාවිත කරන්නේ දැයි විදුහල්පතිවරුන්ගෙන් විමසූ විට නියැදියෙන් 40%ක් න්‍යාය ප්‍රායෝගික ව භාවිත කරන බවත් නියැදියෙන් 55%ක් තරමක් මට්ටමකින් භාවිත කරන බවටත් ප්‍රතිචාර දක්වන ලදි. එසේ ම නියැදියෙන් 5%ක් පමණක් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා ගන්නා න්‍යාය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත නො කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. ප්‍රතිශත අගය අනුව ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධ්‍යාපනික න්‍යාය ප්‍රායෝගික ව භාවිත කිරීම මධ්‍යස්ථ මට්ටමක් පවතින බව අනාවරණය වූ නමුත් සමස්ත ප්‍රතිචාර විශ්ලේෂණයෙන් ලැබුණු මධ්‍යන්‍ය අගයයෙන් ($\bar{x}$=3.45, SD=.75) අනාවරණය වූයේ ද වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා ගන්නා න්‍යාය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රායෝගික ව භාවිත කරන බවයි.

වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් නව ඉගැන්වීම් උපාය මාර්ග පිළිබඳ අවබෝධය ලැබෙන අතර ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කිරීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කළ හැකි වේ. නව ඉගැන්වීම් උපාය මාර්ග අධ්‍යයනය සඳහා යොමු වන්නේ දැයි විමසූ විට නියැදියෙන් 79%ක් ප්‍රකාශය සමග එකඟ වූ නියැදියෙන් 20%ක් තරමක් දුරට භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. නියැදියෙන් 1%ක් පමණක් ඉහත ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදි. ගුරු ප්‍රතිචාර අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නව ඉගැන්වීම් උපාය මාර්ග සඳහා කැප වෙන බව අනාවරණය විය. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=4.00, SD=.68) ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට නව ඉගැන්වීම් උපාය මාර්ග සෙවීමට යොමු වන බව තහවුරු විය. නව ඉගෙනුම් උපාය මාර්ග පිළිබඳ ව ස්වයං අධ්‍යයනයට යොමු වීම තුළින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කළ හැකි වේ.

ගුරු නියැදියේ ප්‍රතිචාර පාසල් වර්ග අනුව විශ්ලේෂණය කිරීමේ දී පාසල් වර්ග හතර ම 2 වර්ගය ($\bar{x}$=3.94, SD=.57), 3 වර්ගය ($\bar{x}$=3.99, SD=.43), 1AB වර්ගය ($\bar{x}$=4.00, SD=.75) සහ 1C වර්ගය ($\bar{x}$=4.03, SD=.75) පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නව ඉගෙනුම් උපාය මාර්ග භාවිත කරන බව හෙළි විය (4 වන වගුව).

4 වන වගුව

පාසල් වර්ගය අනුව, පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන විවිධ ක්‍රමෝපාය පිළිබඳ ගුරු

පාසල් වර්ගය		7	8	9	10	11
1 AB වර්ගය	මධ්‍යන්‍ය	2.49	4.00	2.81	2.75	2.69
	සංඛ්‍යාව	252	252	252	252	252
	ස. අපගමනය	.85	.75	.88	.85	.85
	මධ්‍යන්‍ය	2.54	4.03	2.88	2.77	2.72

ප්‍රතිචාර

1C වර්ගය	සංඛ්‍යාව	225	225	225	225	225
	ස. අපගමනය	.83	.75	.90	.89	.85
2 වර්ගය	මධ්‍යන්‍ය	2.65	3.94	2.83	2.84	2.88
	සංඛ්‍යාව	129	129	129	129	129
	ස. අපගමනය	.86	.57	.92	.90	.90
3 වර්ගය	මධ්‍යන්‍ය	2.37	3.99	2.65	2.51	2.59
	සංඛ්‍යාව	94	94	94	94	94
	ස. අපගමනය	.72	.43	.83	.80	.81
එකතුව	මධ්‍යන්‍ය	2.52	4.00	2.82	2.74	2.72
	සංඛ්‍යාව	700	700	700	700	700
	ස. අපගමනය	.83	.68	.89	.87	.85

$\leq$ 1.80 - තරයේ විශ්වාස නොකරමි 1.81-2.60 - විශ්වාස නොකරමි
2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි 41-4.20 - විශ්වාස කරමි
$\geq$ 4.21 තරයේ විශ්වාස කරමි

වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන දැනුම, අවබෝධය නිරන්තරයෙන් භාවිත කළ යුතු වේ. වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණු වීම් කරන්නේ දැයි ගුරුවරුන්ගෙන් විමසන ලදි. නියැදියෙන් 49%ක් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණු වීම් භාවිත නො කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. නියැදියෙන් 31%ක් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණු වීම් කරන බවට පිළිගන්නා ලදි. නියැදියෙන් 20%ක් තරමක් දුරට භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. ප්‍රතිශත අගය අනුව වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණු වීම් භාවිත නො කරන බවට ප්‍රතිචාර ලබා දුන්න ද සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.82, SD=.89) තරමක් දුරට වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණුවීම් භාවිත කරන බවට තහවුරු කරන ලදි. කෙසේ වුවත් පාසල් පාදක වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලැබෙන නව උපදේශන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රායෝගික ව භාවිත කිරීම සම්බන්ධ ව මධ්‍යස්ථ අගයක් මධ්‍යන්‍ය සඳහා ලැබීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම ගැටලු සහිත බව අනාවරණය විය.

ගුරු නියැදිය ලබා දුන් ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගය ($\bar{x}$=2.65, SD=.83), 1AB වර්ගය ($\bar{x}$=2.81, SD=.88), 2 වර්ගය ($\bar{x}$=2.83, SD=.92) සහ 1C වර්ගය ($\bar{x}$=2.88, SD=.90) යන පාසල් වර්ග හතරෙහි ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ලබා දෙන නව උපදේශන, උපාය මාර්ග සමග පුහුණුවීම් තරමක් දුරට භාවිත කරන බවට අනාවරණය විය. පාසල් වර්ග අතර ප්‍රතිචාරවල වෙනසක් නොමැති බව ද ඉන් අනාවරණය විය.

යම් වෘත්තීය පුහුණුවක් ලැබීමෙන් පසු නියමිත ක්ෂේත්‍රයට අදාළ සුවිශේෂී වෙනස්කම් රැසක් දැක ගත හැකි ය. තමන් අතින් සිදු වූ අතපසු වීම් මග හරවා ගනිමින් ධනාත්මක ක්‍රියාකාරකම් එකතු කර ගනිමින් වෘත්තීය කුසලතාව ආලෝකමත් කර ගනු ලබයි. වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන අත්දැකීම් ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් ප්‍රකට කරන්නේ දැයි විමසූ විට නියැදියෙන්

52%ක් එසේ නො වන බවට ප්‍රතිචාර දක්වන ලදි. නියැදියෙන් 21%ක් තරමක් දුරට වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ලබන අත්දැකීම් ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් ප්‍රකට කරන බවට පවසන ලදි. වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන අත්දැකීම් ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් ප්‍රකට කරන බවට නියැදියෙන් 27%ක් ප්‍රතිචාර දක්වන ලදි. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.74, SD=.87) තරමක් දුරට වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ලබන අත්දැකීම් ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් ඇති කරන බවට වඩාත් තහවුරු කරන ලදි. ප්‍රතිශතාත්මක ඉහළ අගය අනුව වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන අත්දැකීම් ඉගැන්වීමේ ධනාත්මක වෙනස්කම් සිදු නො වන බවට අනාවරණය වීමෙන් සහ මධ්‍යන්‍ය අගය අනුව මධ්‍යස්ථ අගයක් ලැබීමෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ලබන අත්දැකීම් ගුරුවරුන් තුළ ධනාත්මක වෙනස්කම් සිදු නො කරන බවත් එමගින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීමට හේතු නො වන බවත් අනාවරණය විය.

ගුරු නියැදියේ ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 3 වර්ගය ($\bar{x}$=2.51, SD=.80) පාසල් ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් තුළ ධනාත්මක වෙනස්කම් සිදු නො කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. නමුත් 1AB වර්ගය ($\bar{x}$=2.75, SD=.85), 1C වර්ගය ($\bar{x}$=2.77, SD=.89), 2 වර්ගය ($\bar{x}$=2.84, SD=.90) පාසල් ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ධනාත්මක වෙනස්කම් තරමක් දුරට සිදු වන බව පිළිගන්නා ලදි. සමස්ත ප්‍රතිචාර සඳහා වන මධ්‍යන්‍ය අගයට අනුව ලැබුණු ප්‍රතිචාර තහවුරු කරන ලදි. නමුත් 3 වර්ගයේ පාසල් සහ සෙසු පාසල් වර්ග තුන අතර ගුරුවරුන්ගේ ප්‍රතිචාර අතර වෙනස්කම් තිබෙන බව අනාවරණය විය. ඒ සඳහා එකී පාසල්වල ක්‍රියාත්මක වූ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල අන්තර්ගතය, ඵලදායිතාව මැනවින් නිරූපණය කෙරේ.

වෘත්තීය සංවර්ධනය තුළින් ලබා දෙන පුහුණුව ගුරුවරයාගේ ඉගැන්වීම් රටාව සඳහා මෙන් ම සිසුවාගේ ඉගෙනීමේ රටාව කෙරෙහි ද ධනාත්මක බලපෑම් සිදු කෙරේ. ඒ අනුව වෘත්තීය සංවර්ධනය තුළින් ගුරුවරයා ලබන පුහුණුව නිසා සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් ඇති කරන්නේ දැයි විමසන ලදි. නියැදියෙන් 53%ක් සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් සිදු නො කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. එමෙන් ම නියැදියෙන් 25.4%ක් වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන අත්දැකීම් නිසා සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් සිදු කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. නමුත් 21.7%ක් මධ්‍යස්ථ බවට ප්‍රතිචාර දක්වන ලදි. සමස්ත ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමෙන් ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=2.72, SD=.85) තහවුරු වූයේ ද වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ගුරුවරයා ලබන අත්දැකීම් නිසා සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් සිදු වීම සම්බන්ධයෙන් විශ්වාසයක් නොමැති බවයි. ගුරුවරුන් වෘත්තීය සංවර්ධනය හරහා නිසි පුහුණු වීම් ලැබුවත් එය භාවිතයේ ගැටලු පවතින නිසා සිසුන්ගේ ඉගෙනීමේ ධනාත්මක වෙනස්කමක් දක්නට නොලැබීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීමක් දක්නට නො ලැබේ.

වෘත්තීය සංවර්ධන වැඩසටහන් තුළින් ගුරුවරයා ලබන අත්දැකීම් නිසා සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් පාසල් වර්ග අනුව සිදු වන්නේ දැයි අනාවරණය කර ගැනීමට ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කරන ලදි. 3 වර්ගය පාසල් ගුරුවරුන් ($\bar{x}$=2.59, SD=.81) ගුරුවරයා ලබන අත්දැකීම් නිසා සිසුන්ගේ ඉගෙනීමට ධනාත්මක බලපෑමක් සිදු නො වන බවට අනාවරණය කරන ලදි. 1AB වර්ගය ($\bar{x}$=2.69, SD=.85), 1C වර්ගය ($\bar{x}$=2.72, SD=.85) සහ 2 වර්ගය ($\bar{x}$=2.88,

SD=.90) පාසල් ගුරුවරුන්, ගුරුවරයා ලබන අත්දැකීම් නිසා සිසුන්ගේ ඉගෙනීමට තරමක ධනාත්මක බලපෑමක් සිදු කරන බවට ප්‍රතිචාර දක්වන ලදි. පාසල් වර්ග අනුව වෙනසක් සිදු වන බව අනාවරණය විය. එක් එක් පාසල් වර්ගයේ ක්‍රියාත්මක කරන වැඩසටහන්වල වැදගත්කම අනුව ගුරුවරුන්ගේ සංජානන අනාවරණය වන්නට ඇත.

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලින් ලබන පුහුණුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ විෂය කරුණු ලබා දීමට භාවිත කරන අයුරින් මෙන් ම සිසුන් තක්සේරු කිරීම සහ ඇගයීම සඳහා ද භාවිත කරන ආකාරය අනුව ඉගැන්වීමේ ගුණාත්මකභාවයට බලපෑමක් කරන්නේ දැයි අනාවරණය කර ගැනීම තෙවන පර්යේෂණ ප්‍රශ්නයේ අරමුණ විය.

පාසල් පාදක ව ක්‍රියාත්මක කරන වැඩසටහන්වල අවසාන ඉලක්කය එහි ඵලය සිසුන් වෙත ගෙන යාමයි. ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් කරන වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් සිසුන් ඉගෙනීමට යොමු කරන ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ දැයි විමසූ විට 73%ක් එකඟ වීමෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් සිසුන් ඉගෙනීමට යොමු කර ගත හැකි ආකාරයට ක්‍රියාත්මක වන බව අනාවරණය විය. ඉහත ප්‍රකාශයට 1%ක් පමණක් එකඟ නොවීමෙන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් සිසු ඉගෙනීමට යොමු කර ගත හැකි ආකාරයට ක්‍රියාත්මක වන බව තහවුරු විය. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=3.95, SD=.74) ද සිසුන් ඉගෙනීමට යොමු කරන ආකාරයේ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන බව අනාවරණය විය. ඒ අනුව ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට බලපෑමක් සිදු කරන බව තහවුරු විය (5 වන වගුව).

5 වන වගුව

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සුදුසු ඇගයීම් ක්‍රමවේද පිළිබඳ ගුරු ප්‍රතිචාර

ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කරන අංශ	විශ්වාස නොකරමි		තරමක් දුරට විශ්වාස කරමි		විශ්වාස කරමි		මධ්‍යන්‍ය	සම්මත අපගමනය
	සං.	ප්‍රති.	සං.	ප්‍රති.	සං.	ප්‍රති.		
සිසුන් ඉගෙනීම සමග වඩාත් සම්බන්ධ කෙරේ.	8	01%	183	26%	509	73%	3.95	.74
ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් ඇත.	50	07%	233	33%	417	60%	3.69	.91
ගුරුවරයා හෝ පන්ති කාමර ඇගයීම මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් ඇත.	35	05%	180	26%	485	69%	3.84	.80
ශිෂ්‍ය විශ්වාසය ඉගෙනුම්කරුවකු ලෙස වර්ධනය වී ඇත.	8	01%	190	27%	502	72%	3.88	.69

≤ 1.80 - තරයේ විශ්වාස නොකරමි. 1.81-2.60 - විශ්වාස නොකරමි.
2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි. 3.41- 4.20 - විශ්වාස කරමි
≥ 4.21 තරයේ විශ්වාස කරමි.

ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 1AB වර්ගය ($\bar{x}$=3.95, SD=.74), 2 වර්ගය ($\bar{x}$=3.95, SD=.74) 1C වර්ගය ($\bar{x}$=3.95, SD=.74) සහ 3 වර්ගය ($\bar{x}$=3.95, SD=.74) යන පාසල් වර්ග හතරෙහි ගුරුවරුන් වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා සිසුන් ඉගෙනීමට යොමු කරන ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කරන ලදි. එවැනි වැඩසටහන් නිසා ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවයට බලපෑම් සිදු කරන බව හෙළි විය (6 වන වගුව).

6 වන වගුව

පාසල් වර්ගය අනුව පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ගුරුවරුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සුදුසු ඇගයීම් ක්‍රමවේද පිළිබඳ ගුරු ප්‍රතිචාර

පාසල් වර්ගය		12	13	14	15
1 AB වර්ගය	මධ්‍යන්‍ය	3.87	3.65	3.77	3.83
	සංඛ්‍යාව	252	252	252	252
	ස. අපගමනය	.79	.90	.84	.73
1C වර්ගය	මධ්‍යන්‍ය	3.96	3.67	3.84	3.89
	සංඛ්‍යාව	225	225	225	225
	ස. අපගමනය	.75	.83	.79	.66
2 වර්ගය	මධ්‍යන්‍ය	3.94	3.61	3.87	3.80
	සංඛ්‍යාව	129	129	129	129
	ස. අපගමනය	.68	1.08	.81	.65
3 වර්ගය	මධ්‍යන්‍ය	4.18	3.91	4.01	4.10
	සංඛ්‍යාව	94	94	94	94
	ස. අපගමනය	.59	.80	.60	.67
එකතුව	මධ්‍යන්‍ය	3.95	3.69	3.84	3.88
	සංඛ්‍යාව	700	700	700	700
	ස. අපගමනය	.74	.91	.80	.69

≤ 1.80 - තරයේ විශ්වාස නොකරමි. 1.81-2.60 - විශ්වාස නොකරමි.
2.61-3.40 - තරමක් දුරට විශ්වාස කරමි. 41-4.20 - විශ්වාස කරමි.
≥ 4.21 තරයේ විශ්වාස කරමි.

වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල අවසාන ඉලක්කය වනුයේ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමයි. අභ්‍යන්තර ව මෙන් ම බාහිර ව ද සිසුන් ඇගයීමට ලක් කළ හැකි වේ. සමස්ත වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ යෑමක් දකින්නට තිබේ දැයි විමසන ලදි. නියැදියෙන් 60%ක් ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් ඇති බවට පිළිගන්නා ලදි. නියැදියෙන් 33%ක් මධ්‍යස්ථ බවට පිළිගන්නා ලදි. අවම ප්‍රතිශතයක් (7%) ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් නොමැති බවට පිළිගන්නා ලදි. කෙසේ වෙතත් ඉහළ

ප්‍රතිශතයක් ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් ඇති බවට ප්‍රතිචාර දක්වීමෙන් ඉගැන්වීමේ ගුණාත්මකභාවයට වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපෑම් කරන බව අනාවරණය විය. එය සමස්ත ප්‍රතිචාර සඳහා වන මධ්‍යන්‍ය අගයෙන් ($\bar{x}$=3.69, SD=.91) ද තහවුරු විය.

පාසල් වර්ග අනුව ගුරු ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේ දී 2 වර්ගය ($\bar{x}$=3.61, SD=1.08), 1AB වර්ගය ($\bar{x}$=3.65, SD=.90), 1C වර්ගය ($\bar{x}$=3.67, SD=.83) සහ 3 වර්ගය ($\bar{x}$=3.91, SD=.80) යන පාසල් වර්ග හතරෙහි ගුරුවරුන් ජාතික මට්ටමේ ඇගයීම් මත ශිෂ්‍ය ජයග්‍රහණ ඉහළ ගොස් නොමැති බවට පිළිගන්නා ලදි. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් සිසුන්ගේ ජයග්‍රහණ කෙරෙහි බලපාන බව ඉන් පැහැදිලි විය.

ශිෂ්‍ය සාධන මට්ටම මැනිය හැකි අනෙක් අවස්ථාව වනුයේ පන්ති කාමර ඇගයීම හෙවත් ගුරුවරයා විසින් සිදු කරනු ලබන අභ්‍යන්තර ඇගයීම් අවස්ථාවයි. වෘත්තීය සංවර්ධන වැඩසටහන්හි බලපෑම මත අභ්‍යන්තර ඇගයීම් සහ තක්සේරුව අනුව පන්ති කාමරය තුළ ශිෂ්‍ය සාධන මට්ටම වර්ධනය විය හැකි ය. මේ සම්බන්ධ ව කළ විමසීමේ දී 69%ක් වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල බලපෑම මත අභ්‍යන්තර ඇගයීම් සහ තක්සේරුව අනුව පන්ති කාමරය තුළ ශිෂ්‍ය සාධන මට්ටම වර්ධනය වන බව පිළිගන්නා ලදි. ඉහළ ප්‍රතිශතයක් වෘත්තීය සංවර්ධන වැඩසටහන්හි බලපෑම අභ්‍යන්තර ඇගයීම මත ශිෂ්‍ය සාධන මට්ටම වර්ධනය වන බවට අනාවරණය කරන ලදි. එයින් පැහැදිලි වනුයේ ඉගැන්වීමේ ගුණාත්මකභාවයට වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපාන බවයි. සමස්ත ප්‍රතිචාර අනුව සිදු කරන ලද විශ්ලේෂණයෙන් ($\bar{x}$=3.84, SD=.80) ද ඉගැන්වීමේ ගුණාත්මකභාවයට වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපාන බව තහවුරු විය.

වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල බලපෑම මත අභ්‍යන්තර ඇගයීම් සහ තක්සේරුව අනුව පන්ති කාමරය තුළ ශිෂ්‍ය සාධන මට්ටම වර්ධනය පිළිබඳ ගුරු නියැදියේ ප්‍රතිචාර පාසල් වර්ග අනුව (1AB වර්ගය $\bar{x}$=3.77, SD=.84, 1C වර්ගය $\bar{x}$=3.84, SD=.79, 2 වර්ගය $\bar{x}$=3.87, SD=.81, 3 වර්ගය $\bar{x}$=4.01, SD=.60) වෙනසක් පවතින බව අනාවරණය විය.

පන්ති කාමර ඇගයීමේ සිට ජාතික මට්ටමේ ඇගයීම දක්වා ප්‍රතිඵල ඉහළ නැංවීමට විවිධ තක්සේරු ක්‍රම භාවිත කිරීම අවශ්‍ය ය. එසේ ම යොදා ගන්නා තක්සේරු ක්‍රමෝපාය සිසු ඉගෙනුම පිළිබඳ වලංගු විනිශ්චයක් මෙන් ම සිසු ඉගෙනුම පිළිබඳ ව සංසන්දනාත්මක විනිශ්චයකට මග පෑදීම සුදුසු ය. අවසාන වශයෙන් සිසු ඉගෙනුම ඉහළ නැංවීමට හැකි ලෙස තක්සේරු ක්‍රම භාවිත කිරීම වැදගත් ය. එය ක්‍රියාත්මක වීමෙන් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය පවත්වා ගෙන යා හැකි ය.

ගුරුවරයා, විෂය දැනුම, ඉගැන්වීම් ක්‍රම, ඇගයීම් සහ තක්සේරු ක්‍රම, පන්ති කාමර කළමනාකරණය යන සෑම අංශයක් පිළිබඳ ව ම සර්ව සම්පූර්ණ වූ විට සිසුවාට ගුරුවරයා කෙරෙහි විශ්වාසයක් ගොඩ නැගේ. ඒ අනුව සිසුවා ගුරුවරයා කෙරෙහි විශ්වාසය තබමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත වේ. එසේ ම ශිෂ්‍යයා තුළ තමන්ට තමන් පිළිබඳ ව විශ්වාසය ගොඩ නැගී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක ව නිරත වේ. මේ පිළිබඳ ව ගුරු නියැදියෙන් විමසූ විට 72%ක් සිසුන් තුළ ඉගෙනුම්කරුවකු ලෙස විශ්වාසය ගොඩ නැගෙන බවට පිළිගන්නා බව අනාවරණය විය. එසේ ම ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය වීමට වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපාන බව තහවුරු විය. නියැදියෙන් 27.1%ක් මධ්‍යස්ථ බවට ප්‍රතිචාර දක්වන විට 1%ක් සිසුන් තුළ ඉගෙනුම්කරුවකු ලෙස විශ්වාසය

ගොඩ නො නැගෙන බවට ප්‍රතිචාර දක්වන ලදි. සමස්ත ප්‍රතිචාර සඳහා ලැබුණු මධ්‍යන්‍ය අගයයෙන් ($\bar{x}$=3.88, SD=.69) ද වෘත්තීය සංවර්ධන වැඩසටහන් නිසා ශිෂ්‍ය විශ්වාසය ඉගෙනුම්කරුවකු ලෙස වර්ධනය වී ඇති බවට තහවුරු විය.

ශිෂ්‍ය විශ්වාසය ඉගෙනුම්කරුවකු ලෙස වර්ධනය වීම පිළිබඳ ගුරු ප්‍රතිචාර පාසල් වර්ගය අනුව විශ්ලේෂණය කිරීමේ දී 2 වර්ගය ($\bar{x}$=3.80, SD=.65), 1AB වර්ගය ($\bar{x}$=3.83, SD=.73), 1C වර්ගය ($\bar{x}$=3.89, SD=.660) සහ 3 වර්ගය ($\bar{x}$=4.10, SD=.673) යන පාසල් අතර වෙනසක් නොමැති බව අනාවරණය විය. ගුරු නියැදියේ දත්ත අනුව ගුරුවරයකු ලෙස සිසුන් තුළ විශ්වාසය ගොඩ නැගී ඇති බව අනාවරණය විය. පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ආකල්ප ගොඩ නගමින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි බව ඉන් පැහැදිලි ය.

නිගමන හා යෝජනා

අධ්‍යයනයේ අනාවරණ අනුව පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ප්‍රායෝගික වීම, ගුරු කුසලතා සංවර්ධනය වන ලෙසට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශිෂ්‍ය සාධනයට පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් බලපාන බවට නිගමනය කළ හැකි ය.
පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් මගින් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරමින් පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් උසස් වීම් සඳහා නිර්දේශ කිරීම, වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සක්‍රීය ව සම්බන්ධ වීම සහ ප්‍රායෝගික ව භාවිත කිරීම වෘත්තීය සමාලෝචනයේ දී සලකා බැලීම, පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වී ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරන්නන් ජාතික මට්ටමින් ඇගයීම සහ වෘත්තීය සංවර්ධන පරිසරයක් ගොඩ නැගීම කළ යුතු බවට යෝජනා කෙරේ.

ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය, (2012). *පාසල් පාදක ගුරු සංවර්ධනය මාර්ගෝපදේ අත්පොත*. අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපන අමාත්‍යාංශය, (2019). *පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධනය උපදෙස් සංග්‍රහය.* අධ්‍යාපන අමාත්‍යාංශය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2016). *අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නගා සිටුවීම, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා.* ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

Baron, D. (2008). Imagine: Professional development that changes practice. *Principal Leadership, 8*, pp. 56-58.

Bossi, M. (2009). Developing lion leaders. *Leadership, 39*, pp. 24-27.

Darling-Hammond, L. (2000). *Teacher quality and student achievement:A review of state policy evidence*. Center for the Study of Teaching and Policy, University of Washington.

Opfer, V.D., & Pedder, D. (2011). The lost promise of teacher professional development in England. *European Journal of Teacher Education*, *34*(1). pp. 3-24.

Rahman, F., Jumani, N. B., Akhter, Y., Chisthi, S. U. H., & Ajmal, M. (2011). Relationship between training of teachers and effectiveness teaching. *International Journal of Business and Social Science*, *2*(4). pp. 150- 160.

Witte, T. C. H., & Jansen, E. P. W. A. (2016). Students' voice on literature teacher excellence; Towards a teacher-organized model of continuing professional development. *Teaching and Teacher Education*, *56*, 162

SRI LANKAN JOURNAL OF EDUCATIONAL RESEARCH

Sri Lankan Journal of Educational Research 2024
Volume 17, Pages 18– 33
Department of Research and Development

කන්නන්ගර යුගයේ ලොග් සටහන්වලින් හෙළි වන විදුහල්පති කළමනාකරණ භූමිකාව

මහතන්තිල, එම්. එස්.

ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය, හොරණ.

sudarshi01@gmail.com

සංක්ෂිප්තය: *කන්නන්ගර යුගයේ ලොග් සටහන්වලින් හෙළි වන යහපත් ව්‍යවහාර වර්තමාන විදුහල්පති කළමනාකරණ භූමිකාවට උපයෝගි කර ගත හැකි ආකාරය විමසීම පර්යේෂණ පරමාර්ථය විය. වර්තමාන සංකීර්ණ ලෝකයේ කාර්ය බහුල භූමිකාවක් බවට පත් ව ඇති විදුහල්පති කළමනාකරණ භූමිකාව සංවර්ධනය සඳහා, පැරණි විදුහල්පති භූමිකාවල යහපත් ව්‍යවහාර ද යොදා ගත හැකි වුවත් ඒ පිළිබඳ ව කර ඇති පර්යේෂණ විරල ය. පාසල්වල ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පති සංජානන හඳුනා ගැනීම, කන්නන්ගර යුගයේ ලොග් සටහන්වල තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි අනාවරණය කර ගැනීම, කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව විශ්ලේෂණය කිරීම හා ලොග් සටහන් ඇසුරින් හෙළි වන යහපත් ව්‍යවහාර පාසල් කළමනාකරණයට උපයෝගි කර ගත හැකි ආකාරය විමසා බැලීම අරමුණු කර ගෙන පර්යේෂණය දියත් කෙරිණි. පර්යේෂණ ක්‍රමය ලෙස ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ සන්ධාර විශ්ලේෂණ පිරිසැලසුම භාවිත කරන ලදි. පළමු අරමුණ ඉටු කර ගැනීමට පොකුරු නියැදිකරණය යටතේ තෝරා ගත් විදුහල්පතිවරුන් 15ක් සමග අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර ලේඛනගත දත්ත ද විශ්ලේෂණය කරන ලදි. 2 හා 3 වන අරමුණු සඳහා සහේතුක නියැදිකරණයෙන් තෝරා ගත් ග්‍රාමීය පාසලක කන්නන්ගර යුගයට අයත් ලොග් සටහන්වල අන්තර්ගතය විශ්ලේෂණය කෙරිණි. ඊට අමතර ව එම යුගයේ සිසුන් 7 දෙනෙකු සමග අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා කළ අතර වර්තමාන පාසල නිරීක්ෂණය ද කෙරිණි. පර්යේෂණ අනාවරණ අනුව ලොග් සටහන් තැබීම පිළිබඳ විදුහල්පතිවරුන් අතර පවතින දැනීමේ වෙනස්කම් පවතී. ඇතුළත් වීමේ අංකයෙන් සිසුන් නම් කිරීම, ක්‍රියාකාරකමකට ගත වූ වේලාව ආසන්න මිනිත්තුවට දැක්වීම වැනි යහපත් ව්‍යවහාර ලොග් සටහන්වලින් අනාවරණය විය. විදුහල්පති කළමනාකාරිත්වය යටතේ පාසල් පිරියත අලංකාර ව පවත්වා ගැනීම, පාසලේ භූමිය අස්වැද්දීම, සිසුන් පාසලට ගෙන්වා ගැනීමට උපක්‍රම යෙදීම යන කළමනාකරණ ලක්ෂණ ද අනාවරණය විය. ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන් දැනුම්වත් කිරීම සඳහා උපදෙස් සංග්‍රයක් සැකසීම, ගුරුවරුන් සඳහා ද ලොග් සටහන් තැබීම ගැන දැනුම්වත් වීමට විශිෂ්ට ව්‍යවහාර ප්‍රචලිත කිරීම, ග්‍රාමීය පාසල්වල ගුරු සිසු ක්‍රියා සම්බන්ධ තොරතුරු ලොග් සටහන්වල ඇතුළත් කිරිමේ දී නිවැරදි ව ම වේලාව දැක්වීම සහ ග්‍රාමීය පාසල්වල විදුහල්පතිවරුන්ගේ අවකාශ කළමනාකරණය ගැන අවධානය යොමු කිරිම පර්යේෂණ යෝජනා ය.*

මුඛ්‍ය පද: ***ලොග් සටහන්, කන්නන්ගර යුගය, විදුහල්පති කළමනාකරණ භූමිකාව***

හැඳින්වීම

වර්තමාන සංකීර්ණ ලෝකයේ පාසල්වල විදුහල්පති භූමිකාව ද සංකීර්ණ වූත් කාර්ය බහුල වූත් භූමිකාවක් බවට පත් ව ඇත. 21 වන සියවසට ගැළපෙන දැනුම, කුසලතා, ආකල්පවලින් පරිපූර්ණ වූ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම සඳහා පාසල් පද්ධතියට පැවරී ඇති කාර්යභාරය ඉතා විශාල ය. එහි දී පාසලේ රේඛීය කළමනාකරු ලෙස විදුහල්පතිගේ කළමනාකරණ භූමිකාව වැදගත් කාර්යභාරයක් උසුලයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව විමසා බැලීමේ දී පාසල් කටයුතු සම්බන්ධයෙන් වැඩි වගකීමක්

පාසලේ විදුහල්පතිට දැරීමට සිදු ව ඇති බව අධ්‍යාපන අමාත්‍යංශය (2020) හා විදුහල්පති කාර්යභාරයට අදාළ ලේඛන විමර්ශනය කිරීමේ දී පැහැදිලි වේ. 1997 සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමග හඳුන්වා දුන් පාසල් පාදක කළමනාකරණ ක්‍රමය සමග විදුහල්පති කළමනාකරණ භූමිකාව සංකීර්ණත්වයට පත් ව ඇති බව, 21 වන සියවසේ විදුහල්පතිවරයාගේ කාර්යභාරය සඳහා, කළමනාකරුවකු ලෙස සහභාගි වන ආකාරය, අතීත යුගවල කළමනාකාරිත්වයට වඩා වෙනස් ස්වරූපයක් දරනු ඇත. එහෙත් අතීත විදුහල්පතිවරයාගේ කළමනාකරණ ක්‍රම ශිල්ප වර්තමානයට ගළපා ගත හැකි අවස්ථා ද තිබිය හැකි ය. පර්යේෂිකාව 2 වර්ගයේ ගම්බද පාසලක ගුරු වෘත්තියේ යෙදී සිටින විට ලද අත්දැකීම් මෙම පර්යේෂණය සඳහා පාදක විය. එම පාසල කන්නන්ගර යුගයේ ග්‍රාමීය ප්‍රදේශවල විධිමත් අධ්‍යාපනය ආරම්භ කිරීම අරමුණු කර ගනිමින් බිහි වූ පාසලකි. 1939 වර්ෂයේ ආරම්භ කර ඇති එම පාසලේ පළමු ලොග් පොත පරිශීලනය කිරීමට අවස්ථාවක් ලද අතර එම ලොග් පොතෙන් එකල පැවති පාසල් වාතාවරණය මෙන් ම විදුහල්පතිගේ ක්‍රියා කලාපය පිළිබඳ ව ද මනා අවබෝධයක් ලබා ගත හැකි විය. පාසලේ පැවති අභියෝග අතර සිසුන් පාසලට ගෙන්වා ගැනීම, සිසුන් තුළ සාක්ෂර කුසලතා ඇති කිරීම, වරින් වර ගංවතුර උවදුර නිසා පාසල වසා දැමීමට සිදු වීම වැනි අභියෝග දක්නට ලැබුණි. සිසුන්ගෙන්, ගුරුවරුන්ගෙන්, පාසල් ප්‍රජාවගෙන් ද අභියෝග රැසක් එල්ල වී ඇති බව එහි දී අනාවරණය විය. එම අභියෝග හමුවේ විදුහල්පති ක්‍රියා කර ඇති ආකාරය ද ලොග් සටහන්වලින් නිරූපිත ය. තව ද එම ලොග් සටහන් තබා ඇති ආකාරය පිළිබඳ ව ද අවධානය යොමු විය. මෙම පසුබිම මත කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව, ලොග් සටහන් ඇසුරින් සොයා බැලීම අරමුණු කර ගනිමින් පර්යේෂණය කෙරිණි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස 1931 වර්ෂයෙන් ඇරඹි යුගය හැඳින්විය හැකි ය. එම වසරේ ක්‍රියාත්මක කරන ලද ඩොනමෝර් පාලන ක්‍රමය ප්‍රථම වරට ස්වදේශිකයන්ට අභ්‍යන්තර පාලනය කෙරෙහි සැලකිය යුතු පාලන ක්‍රමයක් ලබා දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස 1931 - 1947 දක්වා අධ්‍යාපන ඇමති ධුරය හෙබවූයේ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය. මෙම යුගය "කන්නන්ගර යුගය" ලෙස හැඳින්වෙයි (සිරිසේන, 1999). යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විශාල පිබිදීමක් ඇති වූ කන්නන්ගර යුගයේ පාසල්වල විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් පාසල් කළමනාකරණ ක්ෂේත්‍රයට වැදගත් කරුණු රැසක් අනාවරණය කර ගත හැකි වනු ඇත.

කන්නන්ගර යුගයේ ඇති වූ අධ්‍යාපන වෙනස්කම් අතර, 1939 අංක 31 දරණ අධ්‍යාපන ප්‍රතිපත්තිය, නිදහස් අධ්‍යාපනයේ වැදගත් සන්ධිස්ථානයකි (පතිරණ, 2019). එම ප්‍රතිපත්තිය නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ සිදු වූ වෙනස්කම් රැසකි. එකල ගම්බද අඩු පහසුකම් සහිත ප්‍රදේශවල විධිමත් අධ්‍යාපනය සඳහා පාසල් ආරම්භ කිරීම එම ප්‍රතිපත්තියේ එක් ප්‍රතිඵලයකි. පතිරණ (2019) අනුව 1945 අංක 21 දරණ නිදහස් අධ්‍යාපන පනත ද අතිශයින් වැදගත් වේ. දේශීය බුද්ධිමතකු යටතේ අධ්‍යාපනයේ මල්පල දැරූ ස්වර්ණමය යුගය ලෙස අද දක්වා ම විද්වතුන් සලකන්නේ කන්නන්ගර යුගය යි (පතිරණ, 2019). කන්නන්ගර දර්ශනය තුළ මූලික අරමුණු දෙකක් දක්නට ලැබිණි.

- සහජ කුසලතා ඇති සෑම පුද්ගලයෙකුට ම සමාජයේ ඉහළ ම තත්ත්වයට එළඹීමට සම අවස්ථා තිබිය යුතු බව
- සෑම තලයක ම අධ්‍යාපනය නොමිලයේ ලබා දිය යුතු බව

එකල පැවති කන්නන්ගර අරමුණු අනුව පිහිටු වූ ග්‍රාමීය පාසල්වල පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය. ඒ අනුව විදුහල්පතිගේ කාර්යභාරය ද සංකීර්ණ වන්නට ඇත. එම යුගයේ විදුහල්පතිගේ කාර්යභාරය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රධාන ලිඛිත මූලාශ්‍රය වන්නේ ද ලොග් සටහන් පොතයි. පාසලක පරිපාලන කටයුතු කිරීමේ දී විදුහල්පති විසින් පාසලේ කටයුතු පිළිබඳ ව සටහන් තබා ගන්නා ප්‍රධානතම ලිඛිත ලේඛනය වන්නේ ද ලොග් සටහන් පොතයි. එබැවින් කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණය පිළිබඳ ව සොයා බැලීමට අදාළ දත්ත රැස් කිරීමට ලොග් සටහන් පොත් පරිශීලනය කෙරිණි.

වර්තමානයේ විදුහල්පති ධුරයට පත් වන විදුහල්පතිවරුන්ට ලොග් සටහන් තැබීම ගැන ගැටලු පවතී. ලොග් සටහන් තබන ආකාරය ගැන දැනුම්වත් වී ඇත්තේ කට වචනයෙන් හෝ දිශාභිමුඛ වැඩ සටහන්වල දී බව බොහෝ විදුහල්පතිවරු පවසති. ලොග් සටහන් තැබීම ගැන නිශ්චිත ක්‍රමවේදයක් තිබේ ද? ඒ පිළිබඳ ව දැනුම්වත් වී ඇත්තේ කෙසේ ද? යන්න සොයා බැලීම ද පර්යේෂණයේ අරමුණකි. මේ අනුව කන්නන්ගර යුගයේ විදුහල්පති භූමිකාව පිළිබඳ ව මෙන් ම ලොග් සටහන් තැබීම පිළිබඳ ව ද පර්යේෂණය මගින් අවධාරණය කෙරේ.

විධිමත් අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ සමයේ පාසල්වල පැවති කළමනාකාරිත්වය පිළිබඳ දැන ගැනීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින කළමනාකරුවන්ට ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය. වර්තමානය වන විට පාසල්වල මුල් යුගයේ පැවති ලිඛිත මූලාශ්‍ර විනාශ වෙමින් පවතින බැවින් එම මූලාශ්‍රවල ඇතුළත් කරුණු විශ්ලේෂණය කොට අනාවරණ ඉදිරිපත් කිරීම පාසල් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රගමනයට හේතු විය හැකි ය. එබැවින් ශ්‍රී ලංකාවේ පාසල්වල විදුහල්පති කළමනාකරණ භූමිකාව ගැන ලොග් සටහන් ඇසුරින් කළ පර්යේෂණ පිළිබඳ ව සොයා බැලිනි. ඒ පිළිබඳ ව වන දේශීය පර්යේෂණයක් "ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාවේ 20 වන සියවසේ සිදු වූ වෙනස්කම් (රංජිත්, 2005)" යන මැයෙන් විය. මෙම පර්යේෂණයේ ලොග් සටහන් සහ විදුහල්පතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කර ඇත. අන්තර්ජාලය ඔස්සේ කරුණු පරීක්ෂා කිරිමේ දී ද අනාවරණය වූයේ ලොග් පොත ඇසුරින් විදුහල්පති කළමනාකරණ භූමිකාව ගැන කළ පර්යේෂණ නොමැති බව යි. එබැවින් මේ පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව පවතී.

කන්නන්ගර යුගයෙන් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විවිධ කාල වකවානුවල සිදු වූ කරුණු පර්යේෂණවලින් ඉදිරිපත් කර ඇතත් ගම්බද අඩු පහසුකම් සහිත ප්‍රදේශවල විධිමත් අධ්‍යාපනය ව්‍යාප්ත වූ කාලයේ විදුහල්පති කළමනාකාරිත්වය ගැන කළ පර්යේෂණ හෝ ලිපි සහ ලොග් සටහන් තැබීමේ ක්‍රමවේදයක් ගැන කළ පර්යේෂණ සොයා ගැනීම අපහසු ය. ලොග් පොතක සටහන් තබන ආකාරය ගැන රජයේ පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ 81-91 දක්වා වූ ව්‍යවස්ථා මගින් සඳහන් වන බව ලංකා ස්වාධීන ගුරු සේවා සංගමය (2018) පවසා ඇත. 1958 අංක 41 දරණ චක්‍රලේඛය මගින් ලොග් පොත ගැන කරුණු දක්වා ඇති බව එහි වැඩිදුරටත් සඳහන් වේ. නමුත් ලොග් පොතේ සටහන් තැබීම ගැන මෑතකාලීන විදුහල්පතිවරුන් තුළ පැහැදිලි අවබෝධයක් නොවන බව ඒ පිළිබඳ විමසීමේ දී පෙනීයයි. එබැවින් ලොග් පොතෙහි සටහන් තබන ආකාරය ගැන, ලොග් පොත පවත්වා ගෙන යා යුතු ආකාරය ගැන හා අදාළ වෙනත් කරුණු පිළිබඳ ව නිශ්චිත ව දැන ගැනීම සඳහා මෙම පර්යේෂණය වැදගත් වේ. තව ද ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සම්බන්ධයෙන් කන්නන්ගර යුගය ඉතා වැදගත් වන නිසාත් එම යුගයේ විදුහල්පති භූමිකාවේ ආදර්ශ, මෑත කාලීන විදුහල්පති භූමිකාවට අදාළ කර ගත හැකි වේ යැයි උපකල්පනය කළ හැකි නිසා මෙවැනි පර්යේෂණවල නියැළීම වැදගත් වේ.

සාහිත්‍ය විමර්ශනය

කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව අධ්‍යයනයේ දී පර්යේෂණයේ ගමන් මග හෙවත් දිශානතිය සකසා ගැනීම සඳහා කළමනාකරණය සම්බන්ධ ව පවතින න්‍යාය පිළිබඳ ව අධ්‍යයනය කරන ලදි. හෙන්රි ෆේයෝල් (1916) ඉදිරිපත් කරන ලද පරිපාලන න්‍යාය තුළින් හඳුනා ගත් ශ්‍රිතමය ප්‍රවේශය එහි දී හඳුනා ගත් එක් ප්‍රවේශයකි. මෙම ප්‍රවේශය යටතේ මූලික කළමනාකරණ කාර්ය 05ක් හඳුන්වා දී ඇත. සැලසුම්කරණය, සංවිධානය, අණ කිරීම, සම්බන්ධීකරණය හා පාලනය ලෙස එම කාර්ය කළුආරච්චි (2021) දක්වා ඇත.

මෙසේ ශ්‍රිතමය ප්‍රවේශය හඳුන්වා දුන්න ද 1970 දශකයේ සුප්‍රසිද්ධ පර්යේෂකයෙකු වූ හෙන්රි මින්ට්ස්බර්ග් සාම්ප්‍රදායික ශ්‍රිතමය ප්‍රවේශය යථාර්ථවාදී නො වන බවට තර්ක කර ඇති බව කළුආරච්චි (2021) දක්වා ඇත. සංවිධාන කළමනාකරුවන් සම්බන්ධ ව ඔහු විසින් කරන ලද අධ්‍යයනවලට අනුව ශ්‍රිතමය ප්‍රවේශය මගින් කළමනාකරුවන්ගේ කාර්ය පිළිබඳ ව තාර්කික සහ ක්‍රමානුකූල සම්බන්ධතාවක් පැවති බව උපකල්පනය කරනු ලබන අතර, එය එතරම් ප්‍රායෝගික නො වන බව මින්ට්ස්බර් ගේ අදහසයි. වර්තමානයේ පාසල් වෙත හඳුන්වා දී ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ (2020), විදුහල්පති අත්පොත මගින් ද මෙම හෙන්රි මින්ට්ස්බර්ග් ගේ කළමනාකරණය පිළිබඳ භූමිකා ඇතුළත් ප්‍රවේශය අවධාරණය කොට ඇත. එම න්‍යායයෙහි වර්තමානයට ඇති වැදගත්කම සලකා බලා පර්යේෂණය සඳහා එම න්‍යායය තෝරා ගන්නා ලදි.

කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව දත්ත ලබා ගැනීමට ඇති වැදගත් මූලාශ්‍රයක් වන්නේ ලොග් පොතයි. ලොග් පොත ඇසුරින් එකල පැවති විදුහල්පති කළමනාකරණ භූමිකාව ගැන අධ්‍යයනය කිරීම සඳහා ද දත්ත ගොනු කර ගැනීම සඳහා ද යම් නිශ්චිත ක්‍රමවේදයක් අවශ්‍ය වේ. අධ්‍යාපන අමාත්‍යාංශය (2020) මගින් ද වර්තමාන විදුහල්පතිවරුන්ගේ දැනුම්වත් වීම සඳහා මින්ට්ස්බර්ග් න්‍යායය හඳුන්වා දී ඇති බැවින් ඒ අනුව දත්ත ගොනු කිරීම වැදගත් බව තීරණය කෙරිණි. තව ද 70 දශකයේ ඉදිරිපත් කළ මින්ට්ස්බර්ග් න්‍යායය කන්නන්ගර යුගයට ද ගැළපේ දැයි සොයා බැලීමට ලක් කෙරුණු හෙයින් විදුහල්පති කළමනාකරණ භූමිකාව අධ්‍යයනය සඳහා මින්ට්ස්බර්ග් න්‍යායය යොදා ගන්නා ලදි.

ගුණාත්මක පර්යේෂණයක් ලෙස ක්‍රියාත්මක වන මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් තෝරා ගනු ලබන්නේ 1939 වර්ෂයේ ආරම්භ වූ කන්නන්ගර යුගයේ පාසලක ලොග් සටහන් ය. එම කාලයට අයත් ලිඛිත මූලාශ්‍ර දැනටමත් විනාශ වෙමින් පවතින නිසාත් ඒ සම්බන්ධ ව ඇති එක ම ලිඛිත ලේඛනය ලොග් සටහන් පොත නිසාත් පර්යේෂණය සඳහා ලොග් සටහන් පොත යොදා ගැණිනි. එකල පැවති පාසල් වාතාවරණය මෙන් ම, පාසල් කළමනාකරණයේ ප්‍රබලතා - දුබලතා හඳුනා ගැනීමට ද එම විමසා බැලීමෙන් හැකි විය.

පර්යේෂණ අරමුණු

1. පාසල්වල ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ සංජානන අනාවරණය කර ගැනීම
2. කන්නන්ගර යුගයේ ලොග් සටහනක තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි අනාවරණය කර ගැනීම
3. කන්නන්ගර යුගයේ විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ භූමිකාව විශ්ලේෂණය කිරීම

4. ලොග් සටහන් ඇසුරින් හෙළි වන යහපත් කළමනාකරණ ව්‍යවහාර පාසල් කළමනාකරණයට උපයෝගි කර ගත හැකි ආකාරය විමසා බැලීම

පර්යේෂණ ප්‍රවේශය සහ පිරිසැලසුම

පර්යේෂණයේ අරමුණු අනුව, පර්යේෂණයෙන් කෙරෙනුයේ ඓතිහාසික තොරතුරු පිළිබඳ සොයා බැලීමකි. එසේ ම එහි දී දත්ත රැස් කිරීම සඳහා යොදා ගනු ලබන්නේ ලේඛන විශ්ලේෂණය සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රම ශිල්ප වේ. මේ අනුව ගුණාත්මක දත්ත ඇසුරු කොට ගන්නා බැවින් ද ඉතිහාස අධ්‍යයනයක් සිදු වන බැවින් ද දත්ත ඇසුරු කොට ගන්නා රටා මගින් ඉතිහාසය පිළිබඳ කල්පිත ගොඩ නගා ගන්නා බැවින් ද මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය තෝරා ගන්නා ලදි. එසේ ම විදුහල්පති භූමිකාව පිළිබඳ ව භූජල් (2021), නස්රීන් (2018), රංජිත් (2005), සිදු කර ඇති පර්යේෂණ සඳහා තොරා ගෙන ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයයි. තව ද ගුණසේකර හා විතානගම (2014) අනුව වික්ටෝරියා ජේ. බේකර් විසින් අවාසිදායක ප්‍රදේශවල විධිමත් අධ්‍යාපනය පිළිබඳ ව කරන ලද පර්යේෂණය කර ඇත්තේ ද ගුණාත්මක ප්‍රවේශයකිනි. මෙම කරුණු අනුව බලන කල ගම්බද ප්‍රදේශයක පිහිටා ඇති පාසලක කන්නන්ගර යුගයේ අධ්‍යාපනය සහ විදුහල්පති භූමිකාව අධ්‍යයනය කිරීම සඳහා ද ගුණාත්මක ප්‍රවේශය යෝග්‍ය වේ.

ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයන ක්‍රමය භාවිත කෙරිණි. ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයන වර්ග අතුරින් පර්යේෂණයේ ස්වභාවය අනුව ඓතිහාසික පර්යේෂණ ක්‍රමය හා ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයන ක්‍රමය සංයෝග වී සැදුම් ලත් ඓතිහාසික ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයන ක්‍රමය භාවිත කෙරිණි.

පර්යේෂණයේ දත්ත රැස් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ පැරණි ලිඛිත ලේඛනයක් වන කන්නන්ගර යුගයේ පාසලේ පැවති ලොග් පොතයි. එම ලොග් පොත ඍජු නිරීක්ෂණය මගින් ප්‍රධාන වශයෙන් දත්ත රැස් කෙරිණි. තව ද ලොග් සටහන්වලට අමතර ව කන්නන්ගර යුගයේ පාසලේ සිටි ශිෂ්‍යයින් සමග කරනු ලැබූ සම්මුඛ සාකච්ඡාවලින් ද දත්ත රැස් කෙරිණි. එනම් අතීතයේ පාසලක පැවති සංවර්ධන රටා අනුව වර්තමාන විදුහල්පති කළමනාකරණ භූමිකාවට එකල පැවති යහපත් ව්‍යවහාර යොදා ගැනීමට පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

නියැදිය හා දත්ත රැස් කිරීමේ ක්‍රම

අධ්‍යයනයේ දී කන්නන්ගර යුගයේ ආරම්භ වූ ගම්බද පාසලක ලොග් සටහන් ඇසුරින් විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව සොයා බැලූ බැවින් කන්නන්ගර යුගයේ ආරම්භ කළ ගම්බද පාසල්වල එම යුගයේ සිටි විදුහල්පතිවරුන්, සංගහනය ලෙස යොදා ගැනිණි. පළමු වන අරමුණ වූ පාසල්වල ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පති සංජානන අනාවරණය කර ගැනීම සඳහා හොරණ අධ්‍යාපන කලාපයට අයත් බුලත්සිංහල කොට්ඨාසයේ විදුහල්පතිවරුන් පර්යේෂණයට අවශ්‍ය වන පරිදි කාණ්ඩ කළ අතර, එම කාණ්ඩ පොකුරු සේ සලකා පොකුරු නියැදිකරණය යටතේ නියැදිය තොරා ගන්නා ලදි. මෙහි දී පොකුරු තුනකින් විදුහල්පතිවරුන් තොරා ගැනිණි.

1 වන වගුව

ලොග් සටහන් පිළිබඳ විදුහල්පති සංජානන හඳුනා ගැනීමේ නියැදිය

විදුහල්පතිවරුන් වර්ග කිරීම	සංඛ්‍යාව
1986න් පසු විශ්‍රාම ගිය විදුහල්පතිවරුන්	05
2013 වර්ෂයට පෙර විදුහල්පති සේවයට පත් වූ අය	05
2013න් පසු විදුහල්පති සේවයට පත් වූ නවක විදුහල්පතිවරුන්	05

අධ්‍යයනයේ දෙවන අරමුණ වන කන්නන්ගර යුගයේ ලොග් සටහනක තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි අනාවරණය කර ගැනීම සඳහාත් තෙවන අරමුණ වන ලොග් සටහන්වලින් හෙළි වන විදුහල්පති කළමනාකරණ භූමිකාව අනාවරණය කර ගැනීම සඳහාත් සහේතුක නියැදිය යටතේ කන්නන්ගර යුගයේ ආරම්භ කරන ලද ගම්බද පාසලක් සහ එහි ලොග් පොත තෝරා ගැනිණි. තව ද සහේතුක නියැදිය යටතේ එම යුගයේ පාසලේ ඉගෙන ගත් ශිෂ්‍යයන් 07දෙනෙක් ද සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා තෝරා ගැනිණි.

ලොග් සටහන් පිළිබඳ සංජානන අනාවරණය කර ගැනීම සඳහා විදුහල්පතිවරුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වී ය. ඒ සඳහා යොදා ගත් උපකරණය වූයේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා නියමාවලියකි. ලේඛනගත දත්ත එකතු කිරීමේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ලොග් සටහන් පොත ද ද්විතීයික මූලාශ්‍ර ලෙස කන්නන්ගර යුගයේ අධ්‍යාපනය පිළිබඳ ව ලියවුණු පොත පත ද යොදා ගැනිණි. ලබා ගත් ලේඛන ගත දත්ත නිරීක්ෂණය කොට පර්යේෂණ අරමුණු අනුව විශ්ලේෂණය කරන ලදි. මුඛ්‍ය යුගයේ ලොග් සටහන් සන්නිවේදනය කර ඇති ශෛලි පිළිබඳ ව සොයා බැලීමට ලොග් සටහන් විවෘත ව නිරීක්ෂණය කෙරිණි. ඒ ඇසුරින් ලොග් සටහන් තබා ඇති ආකාරය, අඩංගු වන කරුණු ආදී තොරතුරු සොයා බැලිණි. එම ලොග් සටහන්වලින් හෙළි වන විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව ලොග් සටහන් නිරීක්ෂණය සඳහා මින්ස්බර්ග් ඉදිරිපත් කර ඇති කළමනාකරණ භූමිකා ප්‍රවේශය අනුව සකස් කර ගත් නිරීක්ෂණ ෂෙඩ්‍යුලයක් දත්ත රැස් කිරීමේ උපකරණය ලෙස යොදා ගන්නා ලදි. එම එක් එක් උප භූමිකාවට අදාළ ලොග් සටහන් වෙන වෙන ම ගොනු කෙරිණි. ඊට අමතර ව කන්නන්ගර යුගයේ ශිෂ්‍යයන් ප්‍රකාශ කළ කරුණුවල දී එකල සිටි විදුහල්පතිවරුන් පාසල් භූමිය සකස් කළ ආකාරය, වගා කළ ආකාරය පැහැදිලි කෙරිණි. ඔවුන් පැවසූ ස්ථානවල වර්තමාන තත්ත්වය සොයා බැලීම සඳහා පාසල් පිරියත නිරීක්ෂණය ද කෙරිණි.

දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය සහ සාකච්ඡාව

දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය සහ සාකච්ඡාව, පර්යේෂණ අරමුණු අනුව සිදු කෙරුණු අතර පළමු පර්යේෂණ අරමුණ වන පාසල්වල ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ සංජානන අනාවරණය කර ගැනීම සඳහා විදුහල්පතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගත් දත්ත ඉදිරිපත් කර විශ්ලේෂණය කෙරිණි. විදුහල්පතිවරුන් දක්වන අදහස් තහවුරු කර ගැනීමට දැනට ලොග් සටහන් ගැන පවතින ලිඛිත ලේඛන ද අධ්‍යයනය කරන ලදි. දෙවනුව කන්නන්ගර යුගයේ ලොග් සටහන්වල තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි අනාවරණය කර ගැනීම සඳහා එකල පැවති ලොග් පොත විවෘත ව නිරීක්ෂණය කර සාරාංශගත විශ්ලේෂණය අනුව සන්ධාර විශ්ලේෂණය කෙරිණි. තුන් වන අරමුණ වන කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව විශ්ලේෂණය සඳහා මින්ට්ස්බර්ග් ඉදිරිපත් කළ න්‍යායයට අදාළ භූමිකා ප්‍රවේශ එකල පැවතියේ දැ යි ලොග් පොත සන්ධාර විශ්ලේෂණයෙන් පරීක්ෂා කරන ලදි. ඊට අමතර ව එකල සිටි ශිෂ්‍යයින් සමග කළ සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය කර ගත් කරුණු ද විශ්ලේෂණය කරන ලදි. මෙම අරමුණු තුනෙන් ම ලබා ගත්

දත්ත අනුව සිව් වන අරමුණ වන ලොග් සටහන් ඇසුරින් හෙළි වූ යහපත් ව්‍යවහාර පාසල් කළමනාකරණයට උපයෝගි කර ගත හැකි ආකාර පිළිබඳ ව විමසා බැලිණි.

පාසල්වල ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ සංජානන

විදුහල්පතිවරුන් 15 දෙනෙකුගෙන් සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් දත්ත අනුව දත්ත ඉදිරිපත් කෙරිණි. විදුහල්පතිවරුන් 10 දෙනෙකු ම ලොග් සටහන් ගැන දැනුම්වත් වී ඇත්තේ හිටපු විදුහල්පතිවරුන් මගිනි. තවත් විශේෂ කරුණක් වන්නේ 2013 වර්ෂයට පෙර පත්වීම් ගත් විදුහල්පතිවරුන් සියලු දෙනා ම හිටපු විදුහල්පතිවරුන්ගෙන් දැනුම්වත් ව තිබීමයි. ගුරුවරයකු ව සිටි අවධියේ දුෂ්කර සේවයේ යෙදී සිටිය දී හිටපු විදුහල්පතිවරුන් ලොග් සටහන් පිළිබඳ ව උපක්‍රමශීලී ව පැහැදිලි කර දුන් ආකාරය හා ඉන් ලද අත්දැකීම් ද ඉදිරිපත් කෙරිණි.

> *"පළමු පත්වීමේ දී ත්‍රිකුණාමල පැත්තෙ ඉස්කෝලෙක වැඩ කරන කොට හිටපු විදුහල්පතිතුමා අපි ලවා ලොග් සටහන් ලියවනවා. නිවැරදි ද බලලා අත්සන් කරනවා. ඒ කාලේ ඒ වැඩේ අපිට හරි කරදරයක් වගේ දැනුණෙ. දැන් තමයි ඒකෙ වටිනාකම තේරෙන්නේ" (සම්මුඛ සාකච්ඡා අංක 06, 2023.05.20).*

නවක විදුහල්පතිවරුන්ගෙන් 04 දෙනකු ම ලොග් සටහන් ගැන දැනුම්වත් වී ඇත්තේ විදුහල්පති සේවයට පැමිණි පසු ව බව ඔවුන්ගේ ප්‍රකාශවලින් පැහැදිලි වේ. තව ද නවක විදුහල්පතිතුමියකගේ ප්‍රකාශය තුළ තමාට ලොග් සටහන් තැබීම ගැන නිසියාකාර දැනුමක් නො ලැබුණු බව ප්‍රකාශ විය.

> *"ලොග් සටහන් තැබීම ගැන දිශාභිමුඛ වැඩ සටහනේ දී එහෙන් මෙහෙන් දැන ගත්ත. හරියට සැඟවුණු විෂයමාලාව වගේ. ඊට පස්සේ නියෝජ්‍ය විදුහල්පති විදිහට හිටපු කාලෙ ලොග් සටහන් ගහන්න අවස්ථා ලැබුණේ නෑ. විදුහල්පති වුණාට පස්සෙ තමයි අනෙක් ලොග් සටහනුත් බලල ලියන්න පුරුදු වුණේ" (සම්මුඛ සාකච්ඡා අංක 13, 2023.05.13).*

මෙම ප්‍රකාශ අනුව දීර්ඝ කාලයක් විදුහල්පති සේවයේ සිටි අයට ගුරුවරයකු ව සිටි කාලයේ දී ම ලොග් සටහන් ගැන අවබෝධයක් ලබා ගැනීමට අත්දැකීම් ලැබී ඇති අතර නවක විදුහල්පතිවරුන්ට ලැබී ඇති අත්දැකීම් සීමිත ය.

සම්මුඛ සාකච්ඡාවේ දී අසන ලද දෙවෙනි ප්‍රශ්නයට විදුහල්පතිවරුන් සියලු දෙනාගේ ම පිළිතුර වූයේ ලිඛිත ලේඛන කිසිවක් දැක නොමැති බවයි. තුන් වන ප්‍රශ්නය වූයේ ඔබ පාසලේ දී ලොග් සටහන් තබන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න යන්නයි. මෙහි දී එක් එක් විදුහල්පති ලබා දුන් පිළිතුරු විවිධ මතවාද සහිත විය.

පාසලේ ලොග් සටහන් තබන ආකාරය පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ සංජානන අනුව ඇතැම් කරුණුවල සංගත බවක් නොමැත. දිනපතා ලොග් සටහන් තැබිය යුතු ද නැද්ද යන්න ගැන විවිධ මත පළ කිරීම නිදසුනක් ලෙස දැක්විය හැකි ය. එක ම කරුණ සම්බන්ධ ව විවිධ මත පළ කිරීම නිසා ලොග් සටහන් ගැන විදුහල්පතිවරුන් දැනුම්වත් වූ ආකාරවල ගැටලු පවතියි. දිනපතා ලිවීම, ලොග් පොතේ ලියූ දේ කැපීම හෝ මැකීම, වැඩ භාර ගැනීමක දී ලියන ආකාරය, මහජන සෞඛ්‍ය පරීක්ෂකට අත්සන් තැබීමට දීම යන කරුණු උදාහරණ ලෙස දැක්විය හැකි ය.

සම්මුඛ සාකච්ඡාවල දී සියලු දෙනා එක ම මතයක් පළ කළ අවස්ථා ද දක්නට ලැබිණි. එනම්,

- මාණ්ඩලික නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී යන අයට ලොග් පොතේ සටහන් කළ හැකි බව
- ලොග් පොත විදුහල්පති භාරයේ සුරක්ෂිත ව තැබිය යුතු ලේඛනයක් වන අතර විදුහල්පති නොමැති අවස්ථාවක පැමිණෙන බලය ලත් නිලධරයකුට එය පරීක්ෂා කිරීමට හැකි විය යුතු බව
- ලොග් පොතට අංකයක් තිබිය යුතු අතර පිටු ද අංකනය කළ යුතු බව යන කරුණු වේ

ලොග් පොත කෙතරම් වටිනා ලේඛනයක් ද යන්න විදුහල්පතිවරුන් කළ ප්‍රකාශවලින් පැහැදිලි වේ.

> *"ලොග් පොත කියන්නෙ හරියට පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාව වගේ. පාසලේ සිදු වන හැම සිදුවීම ම ලියවෙන නීත්‍යානුකූල ලේඛනයක්. ශ්‍රේෂ්ඨාධිකරණය පවා නීත්‍යානුකූල ව පිළිගනු ලබනවා" (සම්මුඛ සාකච්ඡා අංක 09, 2023.05.09).*

> *"ලොග් පොත කියන්නෙ පාසලේ හදවත වගේ. හදවතට වැඩි බර නොදිය යුතු යි. ඒ වගේ ලොග් පොතේ ලියන දේ පැහැදිලි ව නිරවුල් ව ලිවිය යුතු යි" (සම්මුඛ සාකච්ඡා අංක 06, 2023.05.20).*

මෙම කරුණු අනුව බලන විට ලොග් පොත යනු ඉතා වටිනා ලේඛනයකි. එසේ වුව ද එහි සටහන් තබන ආකාරය පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ දැනුම්වත්භාවයේ වෙනස්කම් පවතී.

විදුහල්පති අත්පොතෙහි (අධ්‍යාපන අමාත්‍යාංශය, 2020) ලොග් සටහන් තැබීමට අදාළ උපදෙස් සටහන් කර ඇත. මේ උපදෙස් අන්තර්ජාලයේ ද පළ කර ඇත. සම්මුඛ සාකච්ඡාවේ සිව්වන ප්‍රශ්නය වූයේ එම විදුහල්පති අත්පොත සම්බන්ධ ව ය. දැනට සේවයේ යෙදී සිටින විදුහල්පතිවරුන්ගෙන් පමණක් අන්තර්ජාලයේ ඇති විදුහල්පති අත්පොත දැක තිබේ ද? එහි ලොග් සටහන් පිළිබඳ උපදෙස් කියවා තිබේ ද? යන්න විමසී ය. විදුහල්පතිවරුන් දස දෙනාගෙන් හත් දෙනෙක් ම විදුහල්පති අත්පොතෙහි මෘදු පිටපත දැක හෝ බාගත කර ගෙන ඇත. එසේ වුව ද කිසිවකු ලොග් පොතට අදාළ කොටස් කියවා නැත. ඒ අනුව මෑත කාලයේ ලොග් සටහන් තැබීම ගැන උපදෙස් ලිඛිත ව ලබා දීමේ උත්සාහයක් දරා තිබුණ ද එය තව ම සාර්ථක වී නොමැත.

සම්මුඛ සාකච්ඡාවේ අවසාන ප්‍රශ්නය වූයේ ලොග් සටහන් තැබීම ගැන අවබෝධය ලබා දීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද? යන්නයි. ඒ සඳහා ලද ප්‍රතිචාර සාරාංශ කළ විට ක්‍රම කිහිපයක් ඉදිරිපත් කර තිබිණි.

- වැඩමුළු පවත්වන විට අදාළ කරුණට ප්‍රවීණත්වයක් දක්වන දේශකයන් ගෙන්වීම
- නවක විදුහල්පති පත්වීම් ලබා දීමේ දී දිශාභිමුඛ වැඩ මුළුවේ දී ම පාසලකට ගොස් ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම
- ලොග් සටහන් තැබීම සම්බන්ධ උපදෙස් සංග්‍රහයක් සමග ප්‍රවීණයන්ගේ මග පෙන්වීම

- නවක විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ දී ජ්‍යෙෂ්ඨ විදුහල්පතිවරුන්ට තම අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථා ලබා දීම

ලොග් සටහන් පවත්වා ගෙන යාම ගැන නවක විදුහල්පතිවරුන්ට අවබෝධය අඩු වීමට හේතු දක්වමින් විශ්‍රාමික විදුහල්පතිවරයකු කළ ප්‍රකාශයකට අනුව ද නිසි ක්‍රමවේදයක අවශ්‍යතාව හා අත්දැකීම් ලැබීමේ වැදගත්කම පෙන්වා දී ඇත.

> *"අපි ඒ කාලේ දුෂ්කර පාසල්වල සේවය කරල ඒවයේ හිටපු විදුහල්පතිවරුන්ගෙන් ගොඩක් දේ ඉගෙන ගත්තා. එහෙදි පාසලේ රැඳී ඉන්න කාලයත් වැඩි නිසා හැමදේම ඉගෙන ගන්න වෙලාව තියෙනවා. ඒත් දැන් අය දුෂ්කර යන්නෙ නෑ. ඒ නිසා කැපවීම අඩුයි. අත්දැකීම් අඩුයි. ලොග් සටහන් ලියන එක ගැන අවබෝධයත් ඒ වගේ ම තමයි. ඒ නිසා ඒ අයට නිසි ක්‍රමවේදයක් මගින් මේ ගැන හොඳ අවබෝධයක් ලබා දිය යුතු යි." (සම්මුඛ සාකච්ඡා අංක 05, 2023.05.21)*

මෙම කරුණු අනුව පැහැදිලි වන්නේ ලොග් සටහන් තැබීම ගැන නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බව යි. ඒ බව නවක විදුහල්පතිවරුන්ගේ ප්‍රකාශවලින් ද තහවුරු වේ. මේ ආකාරයට විදුහල්පතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡාවලට ඉදිරිපත් කළ ප්‍රශ්නවල පිළිතුරු අනුව ලොග් සටහන් ගැන විදුහල්පතිවරුන් කටයුතු කරන ආකාරය ගැන විවිධතා ඇති බව පැහැදිලි වේ.

- පැරණි විදුහල්පතිවරුන් වැඩි දෙනෙකු ලොග් සටහන් තැබිම ගැන දැනුම ලබා ගෙන ඇත්තේ ගුරුවරයකු ව සිටි කාලයේ ම ලද අත්දැකීම් මගිනි
- ලොග් සටහන් තබන ආකාරය පිළිබඳ ව දැනුම්වත් වී ඇති ආකාර විවිධ වේ
- ලොග් සටහන් ලිවීම, ලොග් පොතේ සටහන් තැබිය හැක්කේ කාට ද යන වග ආදී කරුණු සම්බන්ධ ව විවිධ මත පවතියි
- ලොග් සටහන් තැබීම ගැන ලිඛිත උපදෙස් කිසිවකුට ලැබී නැත
- ලොග් සටහන් තැබීම ගැන නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බව සියලු ම විදුහල්පතිවරු අනුමත කරති

මේ අනුව ලොග් සටහන් තැබීම ගැන විදුහල්පතිවරුන්ගේ දැනුම්වත්භාවයේ විවිධතා පවතින බවත් ලොග් සටහන නීත්‍යානුකූල ව පිළිගන්නා වටිනා ලේඛනයක් බැවින් එය නිවැරදි ව ලියන ආකාරය ගැන දැනුම්වත් කිරීමට විශේෂ ක්‍රමවේදයක් තිබිය යුතු බවත් පැහැදිලි වේ. ඒ පිළිබඳ ව වැඩි අවබෝධයක් ලබා ගැනිම සඳහා දැනට ලොග් සටහන් ගැන ලියැවී ඇති ලිඛිත ලේඛන පරීක්ෂා කෙරිණි.

ලොග් සටහන් ගැන ලියැවී ඇති ලිඛිත ලේඛන

ගුණසේකර (2000) ලොග් සටහන් තැබීම ගැන දක්වා ඇති තොරතුරු මෙහි දී වැදගත් වේ. පාසලේ නඩත්තු කළ යුතු ලිපි ලේඛන අතර ලොග් පොත ද ඉතා වැදගත් ලේඛනයකි. මෙය පරිහරණය කළ යුත්තේ විදුහල්පති හෝ විදුහල්පති නොමැති අවස්ථාවක ඔහු වෙනුවට වැඩ බලන තැනැත්තා විසිනි. ඉඩක් තැබීමකින් යුතු ව ඊළඟ සටහන තැබිය යුතු වේ. විදුහල්පති නිවාඩු යන අවස්ථාවක දී ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා නම් කර ඇති තැනැත්තාට ලොග් සටහන් පොත භාර දී යා යුතු ය. තමා නිවාඩු යන විට, ගුරුවරයකු මාරු වී එන හා යන විට, අන් අයෙකුට රාජකාරි හා බඩු බාහිරාදිය භාර දෙන විට, ගුරුවරයකු මාරු වී එන හා යන විට, පාසලේ භාණ්ඩ සොරා ගැනීමක් සිදු වූ විට වැනි වැදගත් සිදුවීම් පිළිබඳ ව වාර්තා විදුහල්පති විසින් ලොග් පොතේ සටහන්

තබා අත්සන් කළ යුතු වේ. විදුහල්පති හෝ ඔහු නොමැති විට වැඩ බලන තැනැත්තා හැර මෙහි සටහන් තැබිය යුත්තේ දෙපාර්තමේන්තු හෝ අමාත්‍යාංශ නිලධාරීන් හෝ පමණි. ඒ හැර සිසුන්ගේ වෛද්‍ය පරීක්ෂණ සඳහා පාසලට පැමිණෙන වෛද්‍ය නිලධාරීන්ට ද මෙම පොතේ සටහන් තැබීමට ඉඩ දෙනු ලැබේ. තව ද මෑතක සිට සහකාර දිසාපති/ප්‍රාදේශීය ලේකම්ට ද දිවා ආහාරය අධීක්ෂණය සඳහා බලතල පැවරී ඇති හෙයින් අවශ්‍ය නම් ඔවුන්ට ද සිය සටහන් තැබීමට අවසර දිය යුතු වේ (ගුණසේකර, 2000).

අධ්‍යාපන අමාත්‍යාංශය (2020) ලොග් පොත පිළිබඳවත් එහි සටහන් තැබීමට බලය ඇති නිලධාරීන් පිළිබඳවත් ලොග් පොතෙහි සටහන් තබන අවස්ථා පිළිබඳවත් කරුණු දක්වා ඇත. මෙම ලිඛිත ලේඛනවල අන්තර්ගත කරුණුවල ද වෙනස්කම් පවතී. උදාහරණයක් ලෙස ගුණසේකර (2000) පවසා ඇත්තේ ලොග් සටහන් දෙකක් අතර ඉඩක් තැබිය යුතු බවයි. එහෙත් අධ්‍යාපන අමාත්‍යාංශය (2020) තව කෙනෙකුට සටහන් තැබිය නො හැකි පරිදි ඉඩ නො තබන ලෙස පවසයි. එසේ ම ලොග් පොතේ සටහන් තැබිය හැකි නිලධාරීන් දැක්වීමේ දී ද වෙනස්කම් පවතී. මේ අනුව ලිඛිත ලේඛනවල ඇති කරුණුවල ද වෙනස්කම් පවතී. විදුහල්පතිවරුන් පැවසූ කරුණු මෙන් ම ලිඛිත ලේඛනවල ද සමහර කරුණුවල එකඟතාවක් නො වන බැවින් ලොග් සටහන් තැබීම ගැන තවදුරටත් විස්තරාත්මක ව සොයා බැලිය යුතු ය.

කන්නන්ගර යුගයේ ලොග් සටහන්වල තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි

මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා 2 වර්ගයේ පාසලකට අයත් කන්නන්ගර යුගයේ ලොග් සටහන් නිරීක්ෂණය කෙරිණි. මෙම පාසල 1939 ඔක්තෝබර් මස 01 වන දින ආරම්භ කළ ගම්බද පාසලකි. පාසල ආරම්භ කරන විට ලොග් පොතක් තිබී නොමැත. තාවකාලික පොතක් සාදා ගෙන ඇත. ලොග් පොත ලැබී ඇත්තේ 1940 ජනවාරි මස 05 වන දින බැවින් එදින සිට සටහන් කර ඇත.

> *"1.5.40 මෙදින ලොග් පොත ලැබුණෙන් 1939 ඔක්තෝබර් මස 01 වන දින පාඨශාලාව පළමුවෙන් පටන් ගත් දින පටන් ඇතුළත් විය යුතු කරුණු අප විසින් තාවකාලික ව සාදා ගත් ලොග් පොතෙන් මේ පොතට ඇතුළත් කරනු ලැබේ" (ලොග් පොත 01, පිටු අංක 01).*

මෙලෙස දක්වා ඇති ලොග් සටහන් ආකාර දෙකකට නිරීක්ෂණය කෙරිණි. එනම් බාහිර නිරීක්ෂණය (මතුපිටින්) හා අභ්‍යන්තර නිරීක්ෂණය (අන්තර්ගතය) යනුවෙනි. ලොග් සටහන් මතුපිටින් නිරීක්ෂණය කළ විට දක්නට ලැබුණ ශෛලි මෙසේ ය.

- ලොග් සටහන් ලියා තිබුණේ කටු පෑනෙනි
- දිනය යොදා තිබුණේ ඉංග්‍රීසි ක්‍රමයට ය. උදා: 1940.05.02 දිනය යොදා තිබුණේ 2.5.40 ලෙස ය
- ලොග් සටහනක් අවසානයේ අත්සනට යටින් Head Teacher ලෙස සඳහන් කර අත්සන තබා ඇත
- පැහැදිලි අත් අකුරින් ලියා ඇත

අභ්‍යන්තර නිරීක්ෂණය (අන්තර්ගතය) යටතේ ලොග් සටහන් හොඳින් කියවා බලා අන්තර්ගත කරුණු නිරීක්ෂණය කෙරිණි. එහි දී තොරතුරු දක්වා ඇති ශෛලි එකල පැවති භාෂාව, සංස්කෘතිය, සමාජ රටාව, අධ්‍යාපන ක්‍රමය අනුව වෙනස් සවරූපයන්ගෙන් දක්නට ලැබිණි.

- ලොග් සටහන් ලිවීමේ දී බැඳි අකුරු, සඤ්ඤක අකුරු, මහාප්‍රාණ අකුරු වැඩිපුර යොදා ගෙන තිබුණි. උදා: වෂ්ඨව, මාර්ගය
- ඇතැම් අවස්ථාවල තොරතුරු නිශ්චිත නොවීම උදා; උපගුරුවරිය ද අද පාඨශාලාවට පැමිණ වැඩ භාරගෙන කටයුතුවල යෙදුණේ ය (ගුරුවරියක වැඩ භාර ගත් අවස්ථාවක් වුව ද ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර නොමැත)
- පාසලේ දීර්ඝ නිවාඩු කාල සඳහා විශේෂ නම් යොදා තිබුණි. උදා: අප්‍රේල් මාසයේ දෙන නිවාඩුව - අවුරුදු නිවාඩුව
- යම් සිදුවීමක දී කාලය වැය වන ප්‍රමාණය නිශ්චිත ව දක්වා තිබීම උදා: 12.1.44 ..... උපගුරුවරයාට විරුද්ධ ව ..... ශිෂ්‍යාවගේ මෑණියන් කරන ලද පැමිණිල්ලක් නිසා 9. 15 - 9. 30 දක්වා විභාග කරන ලදි (1 වන රූපය)

1 වන රූපය

1944.01.12 වන දින ලියා ඇති ලොග් සටහන



- ශිෂ්‍යයින් ගැන තොරතුරු ලිවීමේ දී නම වෙනුවට ඇතුළත් වීමේ අංකය භාවිත කර තිබුණි උදා; 14, 10, 43, 110, 105 ශිෂ්‍යයින් නම් කියවා පැය ¼කට පසු පාඨශාලාවට ආවේ ය
- ලොග් සටහන් තැබීමේ දී උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව සැලකිල්ලක් දක්වා නැත. උදා : මෑණියන්ගේ අන්තිම අවස්ථාවේ විදුලි පුවත ලැබී මා හා භාර්‍යාව පාඨශාලාවේ වැඩ .... උපගුරුවරයාට භාර දී යාමට පිටත් වීමි
- සිසුන් පාසලට පැමිණ සිට අතරතුර පිටව යාම්, ප්‍රමාද වී පැමිණීම්, වේලාසන යාම් ආදිය ආසන්න මිනිත්තුවට සටහන් කිරීම උදා: 30.6.44 මෙදින කුඩා ගඟේ පාලම් පාරුව ප්‍රමාද වීම නිසා .... සිට මෙම පාඨශාලාවට පැමිණෙන අංක 52, 78, 161 සහ 165 ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සතර දෙන 9.33ට පැමිණියේ
- පාසලේ සිදු කළ වගා කටයුතු පිළිබඳ සියලු ඇස්තමේන්තු හා ආදායම් පිළිබඳ වාර්තා සටහන් කර තිබෙන්නේ ලොග් පොතේ වීම
- දීර්ඝ කාලීන ව නොපැමිණි ළමයි පාසල් පැමිණි විට ලොග් සටහනක් ලිවීම උදා: 21.6.45 - නොම්මර 179 ශිෂ්‍යයා පැමිණ සිටී

ලොග් සටහන් බාහිර ව නිරීක්ෂණයෙන් එකල පාසලේ පැවති වාතාවරණය ගැන අවබෝධයක් ලැබේ. යටත් විජිත සමයට අයත් කාල වකවානුවක් බැවින් ඉංග්‍රීසි ක්‍රමයට දිනය ලියන්නට ඇත. එකල විදුහල්පතිවරුන් නො ව ජ්‍යෙෂ්ඨ ගුරු යන නමින් සිටි ගුරුවරුන් අතරින් මුල් ගුරුවරයා පත් කරන ලදින් Head Teacher යනුවෙන් සඳහන් කරන්නට ඇත. බාහිර නිරීක්ෂණය අනුව දිනය හා තනතුර ඉතා පැහැදිලි ව දක්වමින් ඉතා පැහැදිලි ව හා පිරිසිදු ව ලොග් සටහන් පවත්වා ගෙන ගොස් ඇත.

අභ්‍යන්තර නිරීක්ෂණයෙන් ලොග් සටහන්වල අන්තර්ගත කරුණු අනුව ද විවිධ ශෛලි අනාවරණය කර ගත හැකි විය. එකල පැවති භාෂා ව්‍යවහාරය අනුව මහප්‍රාණ අකුරු, බැඳි අකුරු භාවිත කරන්නට ඇත. වැඩ භාර ගැනීමක දී නිසි තොරතුරු සහිත ව ලොග් සටහන් ලියා නොමැති වීමට හේතු කිහිපයක් තිබෙන්නට ඇත. ලොග් සටහන් ලිවීම ගැන ඇති අඩු අවබෝධය, පාසලේ ගුරුවරුන් සංඛ්‍යාව සීමිත වීම, උපදෙස් ලබා ගැනීමට තරම් සන්නිවේදන ක්‍රම දියුණු නොමැති වීම වැනි හේතු බලපාන්නට ඇත. පාසලේ සිටින එක ම ගුරුවරිය තම භාර්යාව බැවින් උපගුරුවරිය ද වැඩ භාර ගත් බව ලියන්නට ඇත. පාසල් නිවාඩු ලබා දීමේ ප්‍රධාන අරමුණ අනුව නිවාඩු කාල නම් කර තිබෙන්නට ඇත. ශිෂ්‍යයාගේ ප්‍රමාද පැමිණීම්, වේලාසන ගෙදර යාම් වැනි කරුණු සඳහා වෙනත් ලේඛන පාසලේ නඩත්තු නොවන්නට ඇත. සටහන් කිරීමේ දී ඇතුළත් වීමේ අංකය මගින් ශිෂ්‍යයා නම් කිරීම හා ලිවීම පහසු කරයි. පොතේ ඉඩකඩ වැඩිපුර අවශ්‍ය නො වේ. එසේ ම ලොග් පොත පරිශීලනය කරන අයකුට සිසුන්ගේ නම් යොදා නොතිබීම නිසා සිද්ධියට අදාළ සිසුවා හඳුනා ගත නො හැකි බැවින් සිසුවාගේ අනන්‍යතාව ආරක්ෂා වේ. අනෙක් අතින් එක ම නම ඇති ළමයින් කිහිප දෙනෙක් ඇති විට ඇති විය හැකි දෝෂ මග හැරේ.

මුල් ගුරුවරයා සැම විට ම පාසලේ ක්‍රියාකාරකම් සම්බන්ධ ව ගත වන කාලය ගැන මනා විමසිල්ලෙන් සිටි බවක් පෙනේ. සැම ක්‍රියාකාරකමක ම වේලාව ආසන්න මිනිත්තුවට දක්වා ඇත.

පර්යේෂණ අනාවරණ

පාසල්වල ලොග් සටහන් තැබීම ගැන විදුහල්පති සංජානන

ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන් දැනුම්වත් වූ ආකාර කිහිපයකි. අධ්‍යාපන ආයතන මගින් පැවැත්වූ වැඩමුළුවලින්, ගුරුවරයකු ව සේවයේ සිටි කාලයේ හිටපු විදුහල්පතිවරුන්ගෙන්, ලොග් සටහන් ස්වයං අධ්‍යයනයෙන් හා විදුහල්පති පත්වීමෙන් පසු පැවැත්වූ දිශාභිමුඛ වැඩ සටහනෙනි. මෙහි දී වැඩි කාලයක් විදුහල්පති සේවයේ සිටි අය වැඩි දෙනෙකුට, දුෂ්කර සේවයේ යෙදී සිටිය දී, ගුරුවරයකු ව සිටිය දී ම හා හිටපු විදුහල්පතිවරුන්ගෙන් ප්‍රායෝගික ව අත්දැකීම් ලැබී තිබුණි. නවක විදුහල්පතිවරුන් ප්‍රකාශ කළේ තමන්ට ඒ පිළිබඳ ව නිසියාකාර දැනුමක් නො ලැබුණ බවයි. තව ද ලොග් සටහන් තබන ආකාරය ගැන ලියැවුණු ලිඛිත ලියවිල්ලක් හෝ උපදෙස් මාලාවක් කිසිවකු කියවා තිබුණේ නැත. ලොග් සටහන් තබන ආකාරය පිළිබඳ ව එක් එක් විදුහල්පතිවරයා දරණ මතවල වෙනස්කම් පැවතිණි. ලොග් සටහන් තැබීම පිළිබඳ ව දැනුම්වත් කිරිමට නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බවට සියලු දෙනා මත පළ කළහ. මෙම කරුණු අනුව ලොග් සටහන් තැබීම ගැන විදුහල්පති සංජානන අනුව පහත නිගමනවලට එළඹිණි.

- ලොග් සටහන් තැබීම පිළිබඳ ව නවක හා පැරණි විදුහල්පතිවරුන් දැනුම්වත් වී ඇති ආකාරවල වෙනස්කම් පවතී
- පැරණි විදුහල්පතිවරුන්ට, ගුරුවරයෙකු ව සිටි කාලයේ සිට ම ප්‍රායෝගික ව අත්දැකීම් ලැබී ඇත
- ලොග් සටහන් තබන ආකාරය, ලොග් පොත පවත්වා ගෙන යන ආකාරය හා එහි සටහන් තබන්නේ කවුරුන් ද යන වග පිළිබඳ ව විදුහල්පතිවරුන්ගේ අදහස් අතර එකඟතාවක් නොමැත
- ලොග් සටහන් තැබීම පිළිබඳ ව විදුහල්පතිවරුන් දැනුම්වත් කිරිම සඳහා නිසි ක්‍රමවේදයක් අවශ්‍ය වේ

කන්නන්ගර යුගයේ ලොග් සටහන්වල තොරතුරු සන්නිවේදනය කර ඇති ශෛලි

මෙම අරමුණ යටතේ කන්නන්ගර යුගයේ ලියවුණු ලොග් පොත බාහිර ව සහ අභ්‍යන්තර ව නිරීක්ෂණයෙන් අනාවරණය කර ගත් තොරතුරු දැක්විය හැකි ය.

බාහිර නිරීක්ෂණ

- ලොග් සටහන් ලියා ඇත්තේ කටු පෑනෙනි
- දිනය සටහන් කර ඇත්තේ ඉංග්‍රීසි ක්‍රමයට ය
- ලොග් පොතේ විස්තරය ලියා අත්සන් කොට අත්සනට යටින් (Head Teacher) යනුවෙන් සටහන් කොට තිබුණි
- පැහැදිලි අත් අකුරින් ලියා ඇත

අභ්‍යන්තර නිරීක්ෂණ

- සටහන කියවන අයෙකුට ලියා ඇති තොරතුර පැහැදිලි නො වන අවස්ථා දක්නට තිබුණි
- සිදුවීම් සඳහා ගත වන කාලය නිශ්චිත ව දක්වා තිබුණි
- ශිෂ්‍යයින් සම්බන්ධ තොරතුරුවල දී නම වෙනුවට ඇතුළත් වීමේ අංකය භාවිත කර ඇත
- මසකට වරක් පාසලට නොපැමිණෙන ළමයින් පරීක්ෂා කිරීමට නිලධාරියකු පැමිණ ඇති අතර ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් ලොග් සටහන් තබා තිබේ
- පාසලේ බොහෝ ක්‍රියාකාරකම් සම්බන්ධ ව තොරතුරු ලොග් පොතේ සටහන් කර ඇත. ඇස්තමේන්තු සෑදීම පවා ලියා ඇත
- දීර්ඝකාලීන ව නොපැමිණි සිසුන් නැවත පාසල් පැමිණි විට ලොග් සටහන් මගින් පැමිණි බව දක්වා ඇත

බාහිර ව සහ අභ්‍යන්තර ව නිරීක්ෂණ තොරතුරු අනුව පහත නිගමනවලට එළඹිය හැකි ය.

- ලොග් සටහන් තැබීමේ ආකෘතියකට අනුව එක ම රටාවකට ලොග් සටහන් තබා ඇත
- සෑම සිදුවීමක් සඳහා ම ගත වන කාලය නිශ්චිත ව දැක්වීම පිළිබඳ ව සැලකිලිමත් වී ඇත
- පාසලේ ලේඛන සීමාසහිත වූ බැවින් සෑම තොරතුරක් ම ලොග් පොතේ සටහන් කරන්නට ඇත
- සිසුන් ගැන තොරතුරු ලිවීමේ දී අනන්‍යතාව සුරැකෙන පරිදි සටහන් තැබීමට උපක්‍රම භාවිත කොට ඇත

කන්නන්ගර යුගයේ විදුහල්පති කළමනාකරණ භූමිකාව විශ්ලේෂණය කිරීම

මෙම අරමුණ පිළිබඳ ව සොයා බැලීමේ දී පළමු ව කන්නන්ගර යුගයේ පැවති පාසල් වාතාවරණය ගැන සොයා බැලූ කරුණු ඇසුරින් ලබා ගත් අනාවරණ අනුව පාසල ආරම්භයේ දී (1939) එක් ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් පාසල ආරම්භ කර ඇත. සිසුන් 14 දෙනෙකුගෙන් ආරම්භ වූ පාසලේ පළමු ව සේවය කර ඇත්තේ මුල් ගුරුවරයා හා එම ගුරුතුමිය පමණි. සිසුන් 150 ඉක්මවන විට ද ගුරු මණ්ඩලය 04කි. පාසල් නොපැමිණෙන සිසුන් පාසල් ගෙන්වා ගැනීම අභියෝගයක් වී ඇත. ගංවතුර වැනි උවදුරු හා මැලේරියා, සරම්ප වැනි වසංගත රෝග තත්ත්ව හමුවේ

වරින් වර පාසල වසා දැමීමට සිදු ව ඇත. පාසලේ ඇති ගුරු හිගය හා ගුරුවරුන් අතර අසමගිකම් නිසා අධ්‍යාපන කටයුතුවලට බාධා එල්ල වී ඇත. වගා කටයුතු හොඳින් සිදු වී තිබේ. එසේ වුව ද සාක්ෂරතාව දුර්වල මට්ටමක පැවතී ඇත. මෙම තොරතුරු අනුව එකල පැවති පාසල් වාතාවරණය පිළිබඳ ව පහත නිගමනවලට එළඹිය හැකි ය.

- පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයට ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් පාසලේ සේවය කර නොමැත
- බාහිර පාරිසරික තත්ත්ව ද අධ්‍යාපනයට බාධාවක් වී ඇත
- එකල පැවති සමාජ-ආර්ථික වාතාවරණය, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම අනුව ළමයින්ගේ පාසල් පැමිණීම දුර්වල තත්ත්වයක පවතින්නට ඇත
- ගුරු මණ්ඩලයේ ක්‍රියා කලාපය නිසා ද අධ්‍යාපනයට බාධා එල්ල වී ඇත

මෙම කරුණු අනුව එම යුගයේ පාසලේ පැවති වාතාවරණය මත විදුහල්පති කළමනාකරණ භූමිකාවට අයත් කාර්ය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකි ය.

විදුහල්පති කළමනාකරණ භූමිකාව විශ්ලේෂණය කිරීමේ දී මින්ට්ස්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද කළමනාකරණ භූමිකා ප්‍රවේශයට අදාළ භූමිකාවලට අයත් කාර්යයන් කන්නන්ගර යුගයේ විදුහල්පති විසින් ඉටු කර තිබේ දැ යි සොයා බලන ලදි. මින්ට්ස්බර්ග් ඉදිරිපත් කළ සියලු ම උප භූමිකාවලට අදාළ කාර්ය එම යුගයේ විදුහල්පති විසින් ද ඉටු කර ඇති බව ලොග් සටහන්වල දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය විය. මේ අනුව 1970 දශකයේ ඉදිරිපත් කළ මින්ට්ස්බර්ග්ගේ න්‍යායය 1940 දශකයේ පාසල්වල විදුහල්පති කළමනාකරණයට ද අදාළ කර ගත හැකි බව නිගමනය කළ හැකි ය.

පර්යේෂණ යෝජනා

- ලොග් සටහන් තබන ආකාරය ගැන දැනුම්වත් කිරීම සඳහා සැම පාසලකට ම සවිස්තරාත්මක උපදෙස් සංග්‍රහයක් හඳුන්වා දීම වැදගත් වේ
- පාසල් අධීක්ෂණ ක්‍රියාවලියේ දී ලොග් සටහන් තබා ඇති ආකාරය ගැන ද අවධානය යොමු කොට දුබලතා ඇත්නම් පෙන්වා දිය යුතු ය
- විදුහල්පතිවරුන්ට පමණක් නො ව ගුරුවරුන් සඳහා ද ලොග් සටහන් තබන ආකාරය ගැන දැනුමක් තිබිය යුතු ය. එබැවින් දවසේ නායකයා ලෙස ගුරුවරයකු පත් කර තාවකාලික ලොග් පොතක සටහන් තැබීම වැනි විශිෂ්ට ව්‍යවහාර පාසල තුළ ක්‍රියාත්මක කිරීම වැදගත් වේ
- නවක විදුහල්පතිවරුන් සඳහා දිශාභිමුඛ වැඩ සටහනේ දී ම ජ්‍යෙෂ්ඨ විදුහල්පතිවරුන්ගේ ප්‍රායෝගික අත්දැකීම් මගින් ලොග් සටහන් තැබීම ගැන අවබෝධය ද ලබා දිය යුතු ය

ලොග් සටහන් පවත්වා ගෙන යාම සඳහා

- සැම පාසලක ම ලොග් සටහන තැබීමට එක ම ආකෘතියක් භාවිත කිරීම වැදගත් වේ. සටහන් තබන කරුණු හා පුද්ගලයින් පිළිබද ව ද නිශ්චිත ව දැන ගත් පසු ලොග් පොතේ පළමු පිටුව ඇතුළු පැත්තේ සියලු උපදෙස් අලවා තැබීම උචිත වේ
- ග්‍රාමීය පාසල්වල ලොග් සටහන් තැබීමේ දී ශිෂ්‍යයින් පිළිබඳ ව තොරතුරු සටහන් කිරිමේ දී ශිෂ්‍ය අනන්‍යතාවට හානියක් නො වන පරිදි සටහන් තැබීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම උචිත වේ

- ග්‍රාමීය පාසල්වල ලොග් සටහන් තැබීමේ දී ගුරු සිසු දෙපිරිස ම ප්‍රමාද වී පාසලට පැමිණෙන අවස්ථාවල නිශ්චිත ව ම පැමිණි වේලාව දක්වා ලොග් සටහන් තැබිය යුතු ය. පාසලට එන අතරතුර ඇති වූ තත්ත්ව නිසා පසු ව පාසලට බලපෑම් එල්ල විය හැකි බැවිනි

විදුහල්පති කළමනාකරණ භූමිකාව සඳහා

- වර්තමානයේ පිළිගත් කළමනාකරණ භූමිකා ප්‍රවේශයක් වන මින්ස්බර්ග් ගේ භූමිකා තම පාසල් කළමනාකරණය තුළ ඉටු කරන්නේ දැ යි නිරන්තරයෙන් විමසිලිමත් විය හැකි ය
- ලොග් සටහන් තැබීමේ දී ගුරුවරුන්, ශිෂ්‍යයින් සමග පවතින අසමගිකම් හෙළිදරව් වන පරිදි සටහන් තැබීම නො කළ යුතු ය
- පාසලක් සංවර්ධනය කිරීමේ දී පැරණි ලොග් සටහන් ඇසුරින් පාසලේ පැවති වාතාවරණය පිළිබඳ ව වඩා පුළුල් අවබෝධයක් ලබා ගත හැකි වේ. එබැවින් බාහිර ව ගන්නා තොරතුරු පමණක් නො ව ලොග් සටහන් ඇසුරින් ගන්නා තොරතුරු ද අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරිම යෝග්‍ය වේ
- ග්‍රාමීය පාසල්වල පාසල් භූමිය සම්පතක් බැවින් පාසල් භූමිය ප්‍රශස්ත අයුරින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය

අනාගත පර්යේෂණ සඳහා යෝජනා

- එක් එක් යුගයක් බැගින් ගෙන, ඒ ඒ යුගයට අදාළ ව විදුහල්පති කළමනාකරණ භූමිකාව පිළිබඳ ව ලොග් සටහන් ඇසුරින් සොයා බැලිය හැකි ය
- සුවිශේෂී තත්ත්වයක් සහිත පාසලක කළමනාකරණ ව්‍යවහාර, අතීතයේ සිට ලොග් සටහන් ඇසුරින් සොයා බැලිය හැකි ය
- විවිධ පාසල් වර්ග අනුව ලොග් සටහන් තැබීමේ රටාවල සමානකම් හෝ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් කළ හැකි ය
- එක් එක් විදුහල්පතිවරුන් ලොග් සටහන් තබා ඇති ශෛලි අධ්‍යයනය කිරීමෙන් ලොග් සටහන් තැබීමේ දි අනුගමනය කළ යුතු භාෂා ව්‍යවහාර හඳුනා ගත හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ

අධ්‍යාපන අමාත්‍යාංශය (2020). *පාසල් කළමනාකරණ මාර්ගෝපදේශය,* විදුහල්පති අත්පොත.

කළුආරච්චි, කේ. ඒ. එස්. පී. 2021). *කළමනාකරණය (අනුකලිත ප්‍රවේශය),* කර්තෘ ප්‍රකාශනයකි.

ගුණසේකර, එස්., සහ විතානගම, ආර්. (2014). *සුදු වතුර ආර ගම.* නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

ගුණසේකර, පී. ඩබ්. (2000). *පාසලේ ගුණාත්මක සංවර්ධනය,* විදුහල්පති හා ගුරු භූමිකාව. නුගේගොඩ: දීපානි ප්‍රකාශන.

ගුණසේකර, පී. ඩබ්. (2000). *සාර්ථක ගුරුවරයෙකු හා ඵලදායී විදුහල්පතිවරයකු වීමට.* නුගේගොඩ: දීපානි ප්‍රකාශන.

ජයසූරිය, සී. (1994). *අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.* කොළඹ: අධ්‍යාපන පීඨය. කොළඹ විශ්වවිද්‍යාලය.

පතිරණ, එස්. (2019). *සී. ඩබ්. ඩබ්. කන්නන්ගර යුගය දක්වා ලංකාවේ බටහිර අධ්‍යාපනය.* යුගතර ශාස්ත්‍රීය සඟරාව, දෙවන වෙළුම, කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

රංජිත්, ජී. ඩී. ආර්. (2005). *ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාවේ 20 වන සියවසේ සිදු වූ වෙනස්කම්* (අප්‍රකාශිත දර්ශනපති උපාධිය සඳහා කරන ලද නිබන්ධයකි) ලංකා ස්වාධීන ගුරු සේවා සංගමය (2018). ලොග් පොත.

විජේරත්න, සී. (2021). *ලොග් සටහන් පොත.* https//www.youtube.com/ watch?v=_aES33jhi7w. Accessed from, 2023.07.18

සිරිසේන, එච්. (1999). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති පරමාර්ථ හා අරමුණු.* කැලණිය: නූතන භාෂා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

Bhujel, C. B. (2021). The role of principal in improvement of school performance: A qualitative study in community school of Nepal. https://arpgweb.com/journal/ journal/15. Accessed from; 2022.11.12.

Nasreen, A. (2019). The world of a school principal: A qualitative study of secondary school principals' selection, capability, and current practices in the province of Punjab. https://files.eric.ed.gov/fulltext/ EJ1229448.pdf. Accessed from; 2022.11.12

SRI LANKAN JOURNAL OF EDUCATIONAL RESEARCH

Sri Lankan Journal of Educational Research 2024
Volume 17, Pages 34– 49
Department of Research and Development

පිරිවෙන් විද්‍යායතනවල සංගීත විෂයය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

යටිවැල්ල, වයි. කේ. යූ. බී.
සිරි සුමංගල විද්‍යාතන පිරිවෙන, එල්ලක්කල.
udayabandarayati@gmail.com

සංක්ෂිප්තය: *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය ජාතික අධ්‍යාපන ආයතනය වන පිරිවෙනෙහි මූලික පිරිවෙන, මහ පිරිවෙන හා පිරිවෙන් විද්‍යායතන නමින් ප්‍රධාන අංශ ත්‍රිත්වයකි. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වර්තමානය වන විට පිරිවෙන් විද්‍යායතන 65ක් ස්ථාපිත කොට ඇති අතර, ඉන් පිරිවෙන් විද්‍යායතන 51ක් තුළ සෞන්දර්ය විෂය කාණ්ඩය සඳහා පෙරදිග සංගීත විෂයය ඉගැන්වීම කෙරෙයි. පිරිවෙන් විද්‍යායතන තුළ ක්‍රියාත්මක සෞන්දර්ය අධ්‍යාපනයෙහි ස්වාභාවය විමසීම, සෞන්දර්ය අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සහ පිරිවෙන් විද්‍යායතනවල පවතින සංගීත විෂයය සංවර්ධනය කළ හැකි විධික්‍රම සොයා බැලීම අධ්‍යයන අරමුණු විය. මෙම පර්යේෂණය සමීක්ෂණ පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන ලදි. දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය සහ සාහිත්‍යයික මූලාශ්‍රය යන පර්යේෂණ විධික්‍රම යොදා ගැණුනු අතර දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස විධිමත්/අවිධිමත් සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි හා සහභාගිත්ව නිරීක්ෂණය යොදා ගැනිණි. පර්යේෂණ නියැදිය සඳහා පෙරදිග සංගීත විෂයය ඉගැන්වෙන පිරිවෙන් විද්‍යායතන 51හි සංගීත විෂයයෙහි පත්වීම් ලද පරිවේණාචාර්යවරුන් 57 දෙනා තෝරා තෝරා ගනු ලැබිණි. පිරිවෙන් විද්‍යායතන විෂයමාලාවෙහි ක්‍රියාත්මක වන සංගීත අධ්‍යාපනය සම්බන්ධ ක්‍රමානුකූල පර්යේෂණ කිසිවක් කර නොමැති බව ඒ පිළිබඳ විමර්ශනයේ දී පෙනී ගියෙන් එකී පර්යේෂණ හිඩැස සම්පූර්ණ කිරීම සඳහා මෙම අධ්‍යයනය කෙරිණි. පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ මූලික ඉගෙනුම් පහසුකම් ප්‍රමාණවත් නො වන බවත්, ගුරු පුහුණු සැසි යාවත්කාලීන නො වී ඇති බවත්, සෘණාත්මක ආකල්ප ගුරුවරුන් තුළ පවතින බවත් පර්යේෂණයෙන් අනාවරණය විය.*

මුඛ්‍ය පදඃ ***පිරිවෙන, පිරිවෙන් විද්‍යායතන, සංගීත අධ්‍යාපනය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය***

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන ආයතනය වූයේ පිරිවෙණයි. ආරාම කේන්ද්‍ර කොට ගත් බෞද්ධ අධ්‍යාපනයේ පරමාර්ථය වූයේ, ගිහි පැවිදි දෙපිරිස ම ධර්ම ඥානයෙහි පිහිටුවා දැහැමි සමාජයක් බිහි කිරීම හා පුද්ගල ආධ්‍යාත්ම සංතෘෂ්ටිය කරා යොමු කරවීමත් ය (අදිකාරි, 1964). ඒ අනුව දැනුම, ආකල්ප පමණක් නො ව කුසලතා වර්ධනයට ද මුල් තැනක් ලැබී තිබුණු බව පැහැදිලි ය. එහි දී පැරණි ආරාමීය අධ්‍යාපන ක්‍රමය අනුගමනය කරමින් සැකසුණු විෂයමාලාවක් යටතේ මෙම පිරිවෙන් අධ්‍යාපන ක්‍රියාවලිය ගොඩ නැගී තිබිණි.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වර්තමානය වන විට පිරිවෙන් විද්‍යායතන 65ක් ක්‍රියාත්මක වේ. ඒ අතුරින් පිරිවෙන් විද්‍යායතන 51ක් තුළ විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයක් ඔස්සේ සංගීත අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. 1/1999, 2/පිරි/2/90 සහ 1/2016 චක්‍රලේඛවලට අදාළ ව පිරිවෙන් විද්‍යායතනවල, රජයේ පාසල්වල 6 - 13 ශ්‍රේණිවල ක්‍රියාත්මක විෂයමාලාව ම ක්‍රියාත්මක විය යුතු ය. එහි 6 - 11 ශ්‍රේණිවල II කාණ්ඩයේ විෂයයක් ලෙස ද අ.පො.ස. උසස් පෙළ කලා විෂයධාරාවට අදාළ විෂයයක් ලෙස ද සංගීතය විෂයය අන්තර්ගත ය. එහි දී රජයේ

පාසල් හා සමගාමී ව ම දිනපතා කාලසටහන අදාළ කාල සීමාවන්ට අනුගත ව සැකසිය යුතු ය.

පිරිවෙන් විද්‍යායතන සංගීත විෂයය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ විමසිලිමත් වීමේ දී එහි ගුණාත්මකභාවය පිළිබඳ විවිධ ගැටලු පවතින බව නිරීක්ෂණය විය. තව ද පිරිවෙන් අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනයේ සංගීත විෂයමාලාවේ ක්‍රියාත්මක ස්වභාවය සම්බන්ධ පර්යේෂණ සාහිත්‍ය කියවා බැලීමේ දී ද ඒ පිළිබඳ ව සිදු කෙරී ඇති පර්යේෂණ හිග බවත් නිරීක්ෂණය විය. එම පර්යේෂණ හිඩැස පියවීම සඳහාත් යථෝක්ත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වභාවය හඳුනා ගැනීම සඳහාත් ඒ ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීමත් ඒවා වැඩිදියුණු කළ හැකි සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමත් අරමුණු කර ගනිමින් මෙම පර්යේෂණය දියත් කෙරිණි.

සාහිත්‍ය විමර්ශනය

පිරිවෙන් අධ්‍යාපනයේ සංවර්ධනයත් සමග වර්තමානයේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපන ආයතන ත්‍රිත්වයක් දක්නට ලැබේ. එනම්, මූලික පිරිවෙන, මහ පිරිවෙන සහ පිරිවෙන් විද්‍යායතන යනුවෙනි (පිරිවෙන් පනත, 1979). 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත හා 1980 අංක 01 දරන පිරිවෙන් නියෝග සංග්‍රහය අනුව 10 (1) හා (2) වගන්තියේ 8 වැනි නියෝග ප්‍රකාර ව පිරිවෙන් විද්‍යායතන තුළින් ද අධ්‍යාපනය හා සම්බන්ධ අපේක්ෂිත අරමුණු ඉටු කරලීමෙහි ලා සුවිසල් මෙහෙයක් සිදු වනු ඇත.

පර්යේෂණ අරමුණු පාදක ව ඒ සම්බන්ධ ව පවත්නා පර්යේෂණ සාහිත්‍යය මොනවා ද යන්න හඳුනා ගැනීමත් පර්යේෂණ ක්ෂේත්‍රය තුළ පවතින හිඩැස කෙබඳු ද යන්න හඳුනා ගැනීමත් කෙරෙහි අවධානය යොමු විය. පර්යේෂණය සම්බන්ධ සාහිත්‍ය මූලාශ්‍රයක් හෝ ඊට සමගාමී ව කරන ලද පර්යේෂණයක් සොයා ගැනීම අසීරු කරුණක් වුව ද පර්යේෂණයේ අඩංගු අනෙකුත් ප්‍රවේශ සඳහා සාහිත්‍යයික මූලාශ්‍ර හඳුනා ගත හැකි විය.

පිරිවෙන් අධ්‍යාපනය, ශ්‍රී ලංකාව තුළ පමණක් නො ව, ථේරවාදී බුදු දහම අදහන ආසියාතික රටවල පවා ව්‍යාප්ත වී ඇත. ඒ පිළිබඳ විවිධ පර්යේෂණ, පර්යේෂණ ලිපි සහ විවිධ සඟරා ලිපි හමු වේ. Dargye (2019) භූතානයේ පැවිදි අධ්‍යාපන ක්‍රමය පිළිබඳවත් An Overview of Bhutan's Monastic Education System නැමැති පර්යේෂණ පත්‍රිකාවේ බෞද්ධ අධ්‍යාපනය සහ තායිලන්තයේ පන්සල් පිළිබඳවත් කරුණු දක්වා ඇත.

පැවිදි අධ්‍යාපනය සහ ඓතිහාසික පසුබිම පිළිබඳ අදිකාරි (1964) පාරිවේණික අධ්‍යාපන ඉතිහාසය පිළිබඳ කරුණු දක්වා ඇති අතර, මූලාරම්භයේ සිට නූතන යුගය තෙක් ම ඓතිහාසික පිරිවෙන් අධ්‍යාපනය හා බැඳුණු සිද්ධීන් අනාවරණය කොට ඇත. එහි දී පැරණි පිරිවෙන් අධ්‍යාපනය හා විද්‍යායතන පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ පෙන්වා දෙනු ලබයි.

ලංකාවේ පැරණි පිරිවෙන් අධ්‍යාපන සහ වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ කරුණු වල්පොල (1962) දක්වන අතර මුල් කාලීන අධ්‍යාපන ආයතන හා මූලායතන මෙන් ම ආරාමික අධ්‍යාපන ක්‍රමවේදයෙහි මූලාරම්භය හා සංවර්ධිත අවස්ථා පිළිබඳ විමර්ශනය කරමින් ආරාමික අධ්‍යාපනයේ ඇති වටිනාකම් පිළිබඳ අබේසිංහ (1999) පෙන්වා දෙයි. තව ද පිරිවෙන් අධ්‍යාපනය, පිරිවෙන් වර්ග මෙන් ම පිරිවෙන් විෂයමාලා තුළින් පිරිවෙන් පනත, චක්‍රලේඛ සහ පිරිවෙන් නියෝග

මාලා පිළිබඳ තොරතුරු සහ ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය ග්‍රන්ථයේ (සීලානන්ද, 2003) අන්තර්ගත කොට ඇත.

'පිරිවෙන් අධ්‍යාපනය සඳහා අමරපුර නිකායේ දායකත්වය' (සෝමානන්ද, 2005), 'නූතන පිරිවෙන් අධ්‍යාපන කළමනාකරණ ප්‍රවණතාව පිළිබඳ ව සටහනක්' යන ශාස්ත්‍රීය පර්යේෂණ ලිපිවලින් පිරිවෙන් අධ්‍යාපනයේ මූලාශ්‍රය පිළිබඳ විමසුමට ලක් කොට ඇත. ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂයමාලාව සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව Keerthirahne (2020) විසින් සිදු කළ පර්යේෂණය ද The education of Buddhist monks in Sri Lanka: A historical review and some suggestions for reform (De Silva, 2019) යන පර්යේෂණ ද පිරිවෙන් අධ්‍යාපනය හා සම්බන්ධ සෘජු මූලාශ්‍රය සපයයි.

Yatiwella (2023) විසින් පිරිවෙන් විද්‍යායතන ඇසුරින් සංගීත අධ්‍යාපනයේ ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ ව විමසා බලනු ලබන An exploratory study of the music education learning process (from Vidyathan Piriven) යන පර්යේෂණය ද මෙම අධ්‍යයනයේ සෘජු මූලාශ්‍රයක් ලෙස යොදා ගන්නා ලදි.

සංගීතය පිළිබඳ ව පර්යේෂණ විවිධ වූ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ දේශීය මෙන් ම විදේශීය ව දක්නට ලැබෙන්නකි. මෙහි දී සංගීත අධ්‍යාපනය පිළිබඳ විවිධ වූ පැතිකඩ ඔස්සේ අධ්‍යයන සිදු වන අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි හා සම්බන්ධ අධ්‍යයන ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. එහි දී සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ඉගෙනුම් ක්‍රම ශිල්ප, ශිෂ්‍ය සාධනය, ඉගෙනුම් පරිසරය පිළිබඳ සිදු කෙරෙන අධ්‍යයන දැකිය හැකි ය. මෙම සෑම අධ්‍යයනයක් ම දේශීය මෙන් ම විදේශීය පර්යේෂණ සන්දර්භය තුළ සිදු වී ඇත්තේ පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය පසුබිම් කොට ගනිමිනි. ශ්‍රී ලාංකේය සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ විවිධ ක්ෂේත්‍රය ඔස්සේ පර්යේෂණ කෙරුණ ද පිරිවෙන් විද්‍යායතන තුළ සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ පර්යේෂණ සාහිත්‍ය සමීක්ෂාවෙහි දී හඳුනා ගැනීමට නො හැකි වූ බැවින්, පිරිවෙන් විද්‍යායතන ඇසුරින් 'සංගීත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය' යන පර්යේෂණ මාතෘකාව යටතේ සිදු කරනු ලැබූ මෙම පර්යේෂණය ශ්‍රී ලාංකේය විද්‍යායතන පිරිවෙන් සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රයට නව මානයක් ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ අරමුණු

පිරිවෙන් විද්‍යායතන තුළ ක්‍රියාත්මක සංගීත අධ්‍යාපනයෙහි ස්වභාවය විමසීම, පිරිවෙන් විද්‍යායතන තුළ ක්‍රියාත්මක සංගීත විෂයය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සහ පිරිවෙන් විද්‍යායතනවල ක්‍රියාත්මක සංගීත විෂයය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකි සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ අරමුණු විය.

පර්යේෂණ පිරිසැලසුම

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණයකි. මෙහි ලා දත්ත එක්රැස් කිරීම සඳහා සාහිත්‍යයික අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද යොදා ගැනිණි. එහි දී සමීක්ෂණ පර්යේෂණ ක්‍රමවේදය උපයෝගි කර ගන්නා ලදි. විෂයානුබද්ධ දත්ත හා න්‍යායාත්මක ප්‍රවේශ අධ්‍යයනය සඳහා ග්‍රන්ථ සහ ලිපි, සඟරා මූලාශ්‍රය කර

ගැනීමත්, ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී විධිමත් සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය ද දත්ත රැස් කිරීමේ විධික්‍රම ලෙස යොදා ගැනිණි.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වර්තමානය වන විට පිරිවෙන් විද්‍යායතන 65ක් ස්ථාපිත කොට ඇති අතර, ඉන් පිරිවෙන් විද්‍යායතන 51ක් තුළ සෞන්දර්ය විෂය කාණ්ඩය සඳහා පෙරදිග සංගීත විෂයය ඉගැන්වීම සිදු කෙරෙයි. එම පිරිවෙන් විද්‍යායතන 51 මෙම පර්යේෂණයේ නියැදිය ලෙස යොදා ගැනිණි. තේරීම් හෝ දිස්ත්‍රික් පදනමකින් තොර ව පිරිවෙන් විද්‍යායතන 65 අතරින් සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ වන සමස්ත පිරිවෙන් විද්‍යායතන 51හි පෙරදිග සංගීතය විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත වන ගුරුවරුන් 57 දෙනා ම යොදා ගැනිණි.

නියැදියේ පිරිවෙන් විද්‍යායතනවල සංගීත අධ්‍යාපන ස්වභාවය විමසීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය සහ පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන පසුබිම පිළිබඳ ගුරු ආකල්ප හඳුනා ගැනීම සිදු කරන ලදි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නගා සිටුවීමේ දී ඒ සඳහා අවශ්‍ය ඉගෙනුම් ක්‍රියාවලි සංවිධානය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවීම යන අංශ ක්ෂේත්‍ර අධ්‍යයන නිරීක්ෂණ තුළින් හඳුනා ගත් අතර, ඊට බලපෑ හැකි සාධක ද සාහිත්‍යය ඇසුරින් ම හඳුනා ගැනිණි. අදාළ තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පසු පළමු පර්යේෂණ උපකරණය ලෙස පිරිවෙන් විද්‍යායතන සංගීත විෂයය භාර පරිවේණාචාර්යවරුන් සඳහා ප්‍රශ්නාවලියක් ලබා දෙන ලදි. දෙවන උපකරණය ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කළ අතර, තෙවනු ව ගුරු ශිෂ්‍ය සම්මුඛ සාකච්ඡාවලින් දත්ත රැස් කෙරිණි.

දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය

පිරිවෙන් විද්‍යායතනවල සංගීත අධ්‍යාපන ව්‍යාප්තිය

සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධාන අධ්‍යාපන ආයතන ත්‍රිත්වය අතරින් පිරිවෙන් විද්‍යායතන තුළ සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක පිරිවෙන් විද්‍යායතන 51ක් හඳුනා ගැනිණි. ඒවාට අදාළ දත්ත පූර්ව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ සංඛ්‍යාලේඛන මත පදනම් ව තෝරා ගත් නියැදිය 1 වන වගුවෙන් නිරූපණය වේ. අධ්‍යයන නියැදිය අනුව හඳුනා ගත හැකි වූයේ සංගීත අධ්‍යාපනය සහිත ව ඉගෙනීම් ක්‍රියාවලිය හා සම්බන්ධ පිරිවෙන් විද්‍යායතන වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාතෙහි ක්‍රියාත්මක වන බවයි. උතුරු සහ නැගෙනහිර පළාත් කේන්ද්‍ර කර ගනිමින් එක් පිරිවෙන් විද්‍යායතනය බැගින් ද ක්‍රියාත්මක වන බව මෙහි දී නිරීක්ෂණය විය. සමස්ත පිරිවෙන් විද්‍යායතනවල සංගීත විෂයය හදාරනු ලබන ශිෂ්‍ය නියැදිය විමසීමේ දී නිරීක්ෂණය වූයේ පිරිවෙන් විද්‍යායතනවල ඉගෙනුම ලබන සියලු ම ශිෂ්‍ය ප්‍රජාව තුළ ස්ත්‍රී නියෝජනයක් නැති බවයි.

පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සමස්ත පිරිවෙන් විද්‍යායතන 51ක් තුළ 6 වන ශ්‍රේණියේ සිට අ.පො.ස (උ.පෙ.) දක්වා 2023 වර්ෂය වන විට ශිෂ්‍යයන් 2077ක් පමණ ශිෂ්‍ය පිරිසක් සංගීත අධ්‍යාපනය හදාරන බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ (2023) දී හඳුනා ගත හැකි විය. ඊට අදාළ ශිෂ්‍ය සංඛ්‍යා දත්ත පළාත් මට්ටමින් 1 වන ප්‍රස්තාරයේ දක්වා ඇත.

1 වන වගුව

පර්යේෂණ නියැදිය

සංගීත විෂයය සහිත පිරිවෙන් විද්‍යායතන			
පළාත	දිස්ත්‍රික්කය	පිරිවෙන් විද්‍යායතන	මුළු ගුරු සංඛ්‍යාව
බස්නාහිර	ගම්පහ	04	12
	කොළඹ	03	
	කළුතර	05	
මධ්‍යම	මහ නුවර	06	08
	මාතලේ	01	
	නුවරඑළිය	01	
දකුණු	ගාල්ල	03	09
	මාතර	05	
	හම්බන්තොට	01	
උතුරු	වව්නියාව	01	01
උතුරු මැද	අනුරාධපුරය	03	03
නැගෙනහිර	ත්‍රිකුණාමළය	01	01
වයඹ	කුරුණෑගල	05	05
ඌව	බදුල්ල	03	05
	මොනරාගල	02	
සබරගමු	කෑගල්ල	03	07
	රත්නපුර	04	
පිරිවෙන් විද්‍යායතන මුළු සංඛ්‍යාව			51

මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

1 වන ප්‍රස්තාරය

පළාත් මට්ටමින් පිරිවෙන් විද්‍යායතනයන්හි සංගීත විෂය හදාරන ශිෂ්‍ය ප්‍රජාව



පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපනයේ ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ තොරතුරු හඳුනා ගැනීමේ දී පිරිවෙන් විද්‍යායතනවල පෙරදිග සංගීත විෂයය උගන්වනු ලබන ගුරුවරුන්ගේ පෞද්ගලික තොරතුරු, පිරිවෙන්

විද්‍යායතන පසුබිම, ගැටලු හා ආකල්ප හඳුනා ගැනීම සඳහා යෝග්‍ය වන පරිදි ප්‍රශ්නාවලියක් ලබා දී ඒ ඇසුරින් දත්ත රැස් කෙරිණි.

ප්‍රශ්නාවලියෙහි පළමු ප්‍රශ්න අට පරිවේණාචාර්යවරයාගේ මූලික තොරතුරු ලබා ගැනීම සඳහා ද සෙසු ප්‍රශ්න, ඉගෙනුම් ක්‍රියාවලි හා ආකල්පමය ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා ද සැකසිණි. එහි දී ගුරුවරුන්ගේ පත්වීමේ ස්වභාවය ගුරුවරුන්ගේ වෘත්තිය පළපුරුද්ද සහ ඔවුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ව අවධානය යොමු කරන ලදි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය, ඉගෙනුම් ආධාරක භාවිතය, පාඩම් සැලසුම්කරණය, පන්ති කාමර පහසුකම්, සංගීත භාණ්ඩ සහ තාක්ෂණික මෙවලම්වල ප්‍රමාණවත් බව, ඉගැන්වීමට ඇති කාලසීමාව, ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලියට බෞද්ධාගමික පරිසරයේ බලපෑම, ගුරුවරුන්ගේ ඉගෙනුම් තෘප්තිමත්භාවය මෙන් ම ඔවුන් ලද ගුරු පුහුණුව, පරිවේනාධිපතිවරුන්ගේ සහාය දැක්වීම යන අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිණි. ඒ අනුව රැස් කළ දත්ත විශ්ලේෂණය (2 වන ප්‍රස්තාරය) සහ අර්ථකථනය පහත දැක්වේ.

පරිවේණාචාර්යවරුන් පිළිබඳ මූලික තොරතුරු

2 වන ප්‍රස්තාරය

පිරිවෙන් විද්‍යායතනවල පළාත් මට්ටමින් සංගීත විෂය භාර ගුරු සංඛ්‍යාව



මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

මෙම පරිවේණාචාර්යවරු සියල්ලන් ම (57) පිරිමි වෙති. අධ්‍යයනයට භාජනය වූ සංගීත ගුරුවරුන්ගෙන් 37%ක් ම සංගීත විෂයයට අදාළ උපාධිධාරීන් වූ අතර, උසස් පෙළ සුදුසුකම් ලැබූවන් ප්‍රමාණය 7%ක් වේ. එම තත්ත්වය තවදුරටත් වෘත්තීය සුදුසුකම් මට්ටමින් පරික්ෂා කර බැලීමේ දී පශ්චාද් උපාධි ඩිප්ලෝමාධාරීන් 33%ක් ද උපාධි 28%ක් ද පුහුණු ගුරු 23%ක් ද ආදී වශයෙන් වූ අතර, පශ්චාද් උපාධිධාරීන් 8.7%කි. මේ අනුව බලන කල බොහෝ සෙයින් ම මොවුන් හට තම සුදුසුකම්වලට සරිලන පරිදි රැකියාවක් ලැබී තිබෙන බව පෙන්නුම් කෙරේ.

සමීක්ෂණයට සහභාගි වූවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ සේවා කාලය මත රැකියාවෙහි ශ්‍රේණි ගත කිරීම් නිරීක්ෂණය කිරීමේ දී 3 - I (ඇ) ශ්‍රේණියේ පත්වීම් ලද පරිවේණාචාර්යවරු 18 දෙනෙකි. 3 - I (අ) ශ්‍රේණි උපාධිධාරී පත්වීම් 10ක්, 2 -

II ශ්‍රේණියේ 22ක් සහ 2 - I ශ්‍රේණියේ පත්වීම් 05ක් ලෙස හඳුනා ගන්නා ලදි. පළමුවන ශ්‍රේණියේ කිසිවෙක් නොවීය (3 වන වගුව).

3 වන ප්‍රස්තාරය

ශ්‍රේණි අනුව පත්වීම් ස්වභාවයෙහි නියෝජනය



මූලාශ්‍රය: (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

නියැදි සමීක්ෂණයට අනුව ගුරු සේවා වෘත්තීය පුහුණුව ලැබූ පරිවේණාචාර්යවරුන් 19 දෙනෙක් වූ අතර, එහි දී වැඩි ප්‍රමාණයක් එනම්, 38 දෙනෙකු ගුරු වෘත්තීය පුහුණුව නොලද ගුරුවරු වෙති. ගුරුවරයකු ලෙස වෘත්තීය පුහුණුව ලැබුවේ ද යනුවෙන් පරිවේණාචාර්යවරුන් වෙත යොමු කළ ප්‍රශ්නයේ දී, ඊට ලබා දුන් ප්‍රතිචාර 4 වන ප්‍රස්තාරයේ පරිදි වෙයි.

4 වන ප්‍රස්තාරය

පුද්ගල නියැදි මත සේවා වෘත්තීය පළපුරුද්ද



ගුරුවරයා 21 වන සියවසට ගැලපෙන සුහුරු පුරවැසියා තම පන්තිකාමරයෙන් බිහි කිරීමේ අරමුණ ජය ගැනීම සඳහා ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා මහඟු

පිටුවහලක් සපයයි. නූතන ලෝකයේ පන්ති කාමරයේ දී මුණ ගැසෙන සිසුවා හුදෙක් සාම්ප්‍රදායික චින්තනයෙන් හෝ මතවාද මත යැපෙන්නෙක් නො වේ. ඔවුහු ගුරුවරයා, විෂය නිර්දේශය ඉක්මවන කුතුහලයකින් හා ප්‍රායෝගික දැනුමකින් යුත්තෝ වෙති. මෙම තත්ත්වය තුළ ගුරුවරයාට සිය පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කිරීමට සිදු වන්නේ අභියෝග රැසක් මැද ය. එබැවින් විෂය කරුණුවලින් සන්නද්ධ ව පමණක් පන්තිකාමරයට නොයා පුළුල් දැනුමක් සහ ශිෂ්‍යයා වෙත එය සම්ප්‍රේෂණය කිරීමේ දී භාවිත කළ යුතු නූතන ක්‍රම හා මෙවලම් භාවිතය සමග පන්ති කාමරයට යා යුතු ය. මෙම අභියෝගය ගුරුවරයාට තම වෘත්තීය සංවර්ධනය තවදුරටත් ගොඩ නගා ගත යුතු බවට අවශ්‍යතාවක් වනු ඇත. එබැවින් මෙම පර්යේෂණයේ දී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය

ඉගෙනුම් ක්‍රම භාවිතය පිළිබඳ ව සොයා බැලීම සඳහා නියැදිගත ගුරුවරුන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා තුළින් හඳුනා ගත් දත්ත 5 වන ප්‍රස්තාරයේ නිරූපිත ය.

5 වන ප්‍රස්තාරය

ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ ප්‍රතිචාර



ඉහත දත්ත අනුව පෙනී යන්නේ ගුරුවරුන් 54%ක ප්‍රතිශතයක් දේශන සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇති බවයි. විෂය සමගාමී ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා සිසුන් සහභාගි කරවීම සිදු වන්නේ 8%ක ප්‍රතිශතයකිනි. සාකච්ඡා ක්‍රමය පවත්වා ගනිමින් ඉගැන්වීම් කටයුතුවල නිරත වන අයුරු නිරීක්ෂණය වූයේ ඉතා සුලු පිරිසකි. ප්‍රතිශතයක් වශයෙන් 13%ක් වැනි පිරිසක් සාකච්ඡා ක්‍රමය මත තම ඉගෙනුම් කටයුතු සාර්ථක අන්දමින් පවත්වා ගෙන කටයුතු කරන ආකාරය නිරීක්ෂණය විය. කණ්ඩායම් ඉගෙනුම් ක්‍රියාකාරකම් ආශ්‍රිත ඉගෙනුම පිළිබඳ ව විමසීමේ දී ශිෂ්‍යයන් ඒ සඳහා වැඩි කැමැත්තක් දැක් වූව ද ඒ සඳහා මධ්‍යස්ත අවධානයක් යොමු කරන බව ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ දී අනාවරණය විය. එය 22% ප්‍රතිශතයකි. එමෙන් ම ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මානව සම්පතක් ලෙස විෂය සම්බන්ධ ප්‍රාමාණිකයන් සම්බන්ධ කර ගැනීම් සිදු වන්නේ ද යන ප්‍රශ්නය සඳහා පරිවේණාචාර්යවරුන් ලබා දුන් පිළිතුර

අනුව බාහිර සම්පත් දායකයන්ගේ සහය ලබා ගැනීම් 3%ක් ලෙස ද හඳුනා ගැනීමට හැකි විය. එහි දී අනාවරණය වූයේ විශේෂ අවස්ථාවල පමණක් විද්‍යායතන තූර්ය වාදන කණ්ඩායම් සකසා ගැනීම සඳහා පමණක් බාහිර සම්පත්ධාරීන් සම්බන්ධ වන බවත්, විෂය කරුණු ලබා දීම හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා බාහිර සම්පත්ධාරීන් සම්බන්ධ නො වන බවත් ය.

ඉගෙනුම් ආධාරක භාවිතය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තම ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය උදෙසා මෙන් ම ශිෂ්‍ය නිපුණතා හඳුනා ගැනීම සඳහා විවිධ ඉගෙනුම් ක්‍රම ශිල්ප භාවිත කළ යුතු ය. එහි දී විවිධ ඉගෙනුම් ක්‍රම ශිල්ප හෙවත් ඉගෙනුම් විලාසය අවබෝධ කර ගනිමින් පන්ති කාමරයට යෝග්‍ය ශ්‍රව්‍ය දෘශ්‍යාධාරක පරිහරණය කිරීම ඉගෙනුම් ක්‍රියාවලියේ දී ඉතා ප්‍රයෝජනවත් වේ. ඒ මත පිහිටා රැස් කරන ලද දත්ත මත පදනම් වූ ප්‍රතිඵල පහත අයුරින් විශ්ලේෂණය කළ හැකි ය.

ගුරුවරයා ඉගෙනුම් ආධාරක සමග පාඩමට සිදු කරන්නේ ද යන ප්‍රශ්නයට ප්‍රතිචාර වශයෙන් 42% භාවිත කරන බවත්, 58% ප්‍රකාශ කළේ ඉගෙනුම් ආධාරක භාවිත නො කරන බවත් ය. ආධාරක භාවිත කරන පිරිසෙන් අත් පත්‍රිකා ලබා දීම හා අමතර කියවීම් සඳහා පොත් ලබා දීම පිළිබඳ ව විමසීමේ දී කිසිවකු අත් පත්‍රිකා සහ අමතර පොත් ලබ නො දෙන බව නිරීක්ෂණය විය. එහි දී පාඩමට අදාළ ව ගීත ගායන හෝ වාදන ඉදිරිපත් කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත වීම 45%ක ප්‍රතිශතයකි. බාහිර ක්‍රියාකාරකම්වල නිරත කරවීමේ ප්‍රතිශතය 14%ක් වන අතර ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක භාවිත කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදීම 34%කි. 7%ක් වැනි සුලු පිරිසක් පැවරුම් ලබා දෙන බව නිරීක්ෂණය විය. ඊට අදාළ තොරතුරු 6 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

6 වන ප්‍රස්තාරය

ඉගෙනුම් ආධාරක භාවිතය පිළිබඳ ගුරු ප්‍රතිචාර



පාඩම් සැලසුම්කරණය

පරිවේණාචාර්යවරයා ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා පාඩම් සැලසුමක් සහිත ව පන්ති කාමරයට පිවිසේ ද යන්න ගැන සෘජු සහ වක්‍ර

නිරීක්ෂණ ඇසුරින් දත්ත රැස් කරන ලදි. එහි දී නිරීක්ෂණය වූ ප්‍රධාන කරුණක් ලෙස අදාළ කාලපරිච්ඡේදය තුළ නිසි කාල කළමනාකරණයකින් තොර ව පාඩම අවසන් කිරීමයි. ඊට හේතු වූ ප්‍රධාන කාරණාව ලෙස හඳුනා ගන්නා ගන්නා ලද්දේ පාඩම් සැලසුමක් රහිත ව පන්තිකාමරයට පිවිසීමයි. නිරීක්ෂණයට අදාළ දත්ත රැස් කිරීමේ දී පාඩම් සැලසුම්කරණයට අනුව ඉගෙනුම් ක්‍රියාවලියක නිරත වූ පරිවේණාචාර්යවරුන් නිරීක්ෂණය වූයේ ඉතා සුළු පිරිසකි (7 වන ප්‍රස්තාරය).

7 වන ප්‍රස්තාරය

පාඩම් සැලසුම්කරණය භාවිතය



පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සඳහා ඊට අවශ්‍ය පන්ති කාමර පහසුකම් 78%ක ප්‍රමාණයක් පවතින බවත්, 16%ක ප්‍රමාණයක් සුදුසු පන්ති කාමර පහසුකම් නොමැති බවත් දක්නට ලැබිණි. ඉගැන්වීම සඳහා කිසිසේත් පන්තිකාමර නොමැති පිරිවෙන් විද්‍යායතන 6%ක ප්‍රතිශතයක් විය (8 වන ප්‍රස්තාරය).

8 වන ප්‍රස්තාරය

පන්තිකාමර ප්‍රමාණවත් දැයි ගැන ප්‍රතිචාර



සංගීත භාණ්ඩ සහ තාක්ෂණික මෙවලම්වල ප්‍රමාණවත් බව

සංගීත අධ්‍යාපන ප්‍රායෝගික අන්තර්ගත කරුණු අධ්‍යයනයේ දී ගායනය සහ වාදනය ප්‍රධාන වෙයි. එහි දී ඊට අවශ්‍ය සංගීත භාණ්ඩ ප්‍රමාණවත් තරම් නොමැති වීම දැක ගත හැකි විය. ප්‍රමාණවත් පරිදි සංගීත භාණ්ඩ පවතී ද යනුවෙන් පරිවේණාචාර්යවරුන් වෙත යොමු කළ ප්‍රශ්නයේ දී, එයට ප්‍රමාණවත් යැයි පිළිතුරු ලබා දුන්නේ 14%ක් පමණි. සෙසු 86%කගේ අදහස වූයේ ප්‍රමාණවත් පරිදි සංගීත භාණ්ඩ නොමැති බව යි. ලබා දුන් ප්‍රශ්නවලට ප්‍රතිචාර 9 වන ප්‍රස්තාරයේ දක්වා ඇත.

9 වන ප්‍රස්තාරය

සංගීත භාණ්ඩ ප්‍රමාණවත් දැයි යන්න පිළිබඳ ප්‍රතිචාර



සංගීත අධ්‍යාපන ප්‍රායෝගික ක්‍රියාකාරකම් අතර 9, 10 ශ්‍රේණි සඳහා 'සංගීතයේ තාක්ෂණික මෙවලම් හා භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි' යන විෂය නිපුණතාවට අයත් ක්‍රියාකාරකම් ලෙස playing & recording music with computer, E-Learning, E-Music (MIDI) E-Encyclopedia & Music, Music learning through internet පෙන්වා දී තිබේ (9, 10 ශ්‍රේණි ගුරු අත්පොත, ජාතික අධ්‍යාපන ආයතනය). ඒ සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලෙස computer, Pen drive, DVD player, Audio Cassette, CD මෙන් ම අන්තර්ජාල පහසුකම් අත්‍යවශ්‍ය වේ. එහෙත් මෙම අධ්‍යයනයට අදාළ නිරීක්ෂණ තුළ මෙම ක්‍රියාකාරකම් සඳහා ඉහත භෞතික සම්පත් භාවිතයට ගත් අවස්ථා දක්නට නො ලැබිණි.

ඉගෙනුම් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි තාක්ෂණික උපාංග ප්‍රමාණවත් ද යනුවෙන් පරිවේණාචාර්යවරුන් වෙත යොමු කළ ප්‍රශ්නයේ දී, එයට ප්‍රමාණවත් යන්නට 14%ක් එකග වූ අතර සෙසු 86%කගේ ම අදහස වූයේ ප්‍රමාණවත් නො මැති බව යි.

ඉගැන්වීමට ඇති කාලසීමාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ශිෂ්‍යයකුට ඉගෙනීමට ඇති කාල සීමාව ප්‍රමාණවත් නොවීම හඳුනා ගත් තවත් එක් ගැටලුවකි. වර්තමාන අධ්‍යාපන ක්‍රමය

තුළ සෞන්දර්ය විෂයය යටතේ සංගීත විෂයයට සතියකට වෙන් කර ඇත්තේ කාල පරිච්ඡේද තුනක් පමණි. එහි දී මතු වන ප්‍රධාන ගැටලුව වනුයේ ප්‍රායෝගික විෂය කරුණු ආවරණය සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් නොමැති බව ය. ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී පරිවේණාචාර්යවරුන් සමග පැවති සම්මුඛ සාකච්ඡාවලින් මෙම ගැටලුව පිළිබඳ තවදුරටත් තහවුරු විය. එනම් දැනට ලැබී ඇති කාලය ප්‍රමාණවත් යැ යි සෑහිමකට පත් වූ ගුරුවරුන් සංඛ්‍යාව 46%කි. සෙසු 54% ක් හෙවත් වැඩි පිරිසක ගේ ම අදහස වූයේ ලැබී තිබෙන කාලය ප්‍රමාණවත් නො වන බව යි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බෞද්ධ ආගමික පරිසරයේ බලපෑම

පිරිවෙන් විද්‍යායතන ක්‍රියාත්මක වනුයේ විහාරස්ථානයක් ආශ්‍රිත ව හෝ විහාරස්ථාන භූමිය තුළ ය. එහි දී මෙම සංගීත අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බෞද්ධ ආගමික පරිසරයේ බලපෑම පිළිබඳ ව සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගත් දත්තවලට අනුව ආගමික පරිසරය පිටිවහල පිළිබඳ ඉතා සතුටුදායක මට්ටමක් තුළ ප්‍රතිචාර දැක්වූවෝ 11%කි. සමස්ත ඉගෙනුම් පරිසරය පිළිබඳ ව 41%ක් සතුටුදායක බව පවසන ලදි. 37% ප්‍රමාණයක් සාමාන්‍ය බව පැවසූ අතර, ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා බෞද්ධ පරිසරයේ බලපෑම පිළිබඳ සතුටුදායක නො වන පිරිස 11%කි (10 වන ප්‍රස්තාරය).

10 වන ප්‍රස්තාරය

බෞද්ධ ආගමික පරිසරයේ බලපෑම පිළිබඳ ප්‍රතිචාර



ගුරුවරුන්ගේ ඉගෙනුම් තෘප්තිමත්භාවය සහ ගුරු පුහුණුව

සංගීත විෂයය ඉගැන්වීම පිළිබඳ ව තෘප්තිමත් ද යන්න පිළිබඳ ව ඉදිරිපත් කරන ලද පැනයට ප්‍රතිචාර අනුව ඉතාමත් තෘප්තිමත්භාවයකින් නැත හොත් 100%ක් සෑහිමකට පත් වන බව ප්‍රකාශ කළේ මුළු නියැදියෙන් 53%ක් පමණකි. සෙසු 47% දෙනා ප්‍රකාශ කළේ ඉතාමත් කැමැත්තෙන් සිදු නො කරන බව යි.

ගුරුවරුන්ට ලබා දී ඇති ගුරු පුහුණුව සම්බන්ධයෙන් ද ඔවුන් සෑහිමකට පත් නො වන බව අධ්‍යයනයෙන් පෙනී ගියේ ය. එය ප්‍රමාණවත් බව ප්‍රකාශ කළේ 21%ක් පමණි. සෙසු 79% අදහස වූයේ පුහුණුව ප්‍රමාණවත් නො වන බවයි.

ප්‍රතිසංස්කරණ පිළිබඳ ව දැනුවත් කිරීමට ක්‍රියාත්මක වන පුහුණුව මෙන් ම පුහුණු ක්‍රමවේද අභියෝගයක් ලෙසට පාර්ශවකරුවන් පෙන්වා දී ඇත. පුහුණු වැඩසටහන්වල අවිධිමත් බව, පුහුණු අවශ්‍යතා සපුරා ගැනීමේ අවස්ථා සහ අවකාශ සම්පාදනය මෙන් ම ඒ සඳහා යොදා ගැනෙන පුහුණු ක්‍රමවේදවල උචිත බව හා ප්‍රමාණාත්මක බව අභියෝග වශයෙන් ප්‍රතිචාරවලින් ඉදිරිපත් විය. මේ අනුව පාර්ශවකරුවන්ගේ සංජානන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවීම, යාවත්කාලීන නොවීම, නව විෂය මාලාව පිළිබඳ නුපුහුණු බව හා පුහුණුව ප්‍රමාණවත් නො වීම මෙන් ම අත්දැකීම් අවම වීම අභියෝග බව අනාවරණය කරයි. එමෙන් ම පුහුණු ක්‍රමවේද සහ වැඩ සටහන්වල අවිධිමත් බව අවකාශ හා අවස්ථා සම්පාදනය මෙන් ම පුහුණු කිරීමේ දී යොදා ගැනෙන ක්‍රමවේද ද ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශවකරුවන් ඉදිරිපත් කරන අභියෝග ලෙස අනාවරණය වේ.

දීර්ඝ ඉතිහාසයක සිට පැවත එන සංගීත අධ්‍යාපන ඉගෙනුම් ක්‍රියාවලිය වරින් වර විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් සංශෝධනවලට ලක් වෙමින් අඛණ්ඩ ව විෂය නිර්දේශ තුළ ක්‍රියාත්මක වූවකි. 1972 වර්ෂයෙහි සෞන්දර්ය විෂය යටතේ සංගීත විෂය සාමාන්‍ය පෙළ සිසුන් සඳහා අනිවාර්ය කර තිබූ අවස්ථා ද හඳුනා ගත හැකි ය. එහෙත් වර්තමානය වන විට පාසල් පද්ධතිය තුළ මෙන් ම පිරිවෙන් විද්‍යායතන පරිපාලනය තුළ ද බොහෝ දෙනකු සලකන්නේ සෞන්දර්ය හා කලා විෂය දෙවන මට්ටමේ විෂයයක් ලෙස ය. එබැවින් වර්තමාන ශිෂ්‍යයන් තුළ මෙම විෂයය කෙරෙහි පවතින ආකල්ප සහ උනන්දුව හීන වන බවත් හඳුනා ගත හැකි වේ.

පරිවේනාධිපතිවරුන්ගේ සහාය දැක්වීම

සංගීත විෂයය හා විෂයය සමගාමී ක්‍රියාකාරකම් වර්ධනය උදෙසා පිරිවෙන් විද්‍යායතන භාර පරිවේණාධිපති භූමිකාව බෙහෙවින් ඉවහල් වන බවත්, එම අනුග්‍රහය විෂයයෙහි ප්‍රගමනයට රුකුලක් බවත් පෙනේ. එවැනි තත්ත්ව පවතින පිරිවෙන් විද්‍යායතන අන් පාසල් අතර කැපී පෙනෙන බවත් මෙහි දී සඳහන් කළ යුතු වේ. ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී නියැදියට අදාළ ගුරුවරුන්ගෙන් පරිවේණාධිපති හිමියන්ගෙන් නිසි පරිදි සහාය පිළිබඳ විමසීමේ දී 25% ඉතා සතුටුදායක බවත්, 37% ප්‍රතිචාර සතුටුදායක ලෙසත්, පරිවේණාධිපති හිමිගේ සහාය සාමාන්‍ය බව කියා සිටියේ 35% පිරිසකි. 3%ක ප්‍රතිශතයක් සතුටුදායක නො වන බවත් හඳුනා ගත හැකි විය (11 වන ප්‍රස්තාරය).

11 වන ප්‍රස්තාරය

පරිවේණාධිපති හිමියන්ගේ සහය දැක්වීමේ ප්‍රතිචාර



නිගමන සහ යෝජනා

නිගමන

- පිරිවෙන් සංගීත විෂය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ තක්සේරුවේ ප්‍රතිඵලය අනුව සමස්ත පිරිවෙන් විද්‍යායතනවල සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මධ්‍යස්ථ මට්ටමක පවති
- ශ්‍රී ලංකාවේ පිරිවෙන් විද්‍යායතනවල පෙරදිග සංගීතය විෂයය උගන්වනු ලබන සියලු ගුරුවරු පිරිමි ගුරුවරු වෙති
- ගුරුවරුන් සියලු දෙනා වෘත්තීයට අවශ්‍ය මූලික සුදුසුකම් අවම වශයෙන් සම්පූර්ණ කර ඇත
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය ඉගෙනුම් ප්‍රවේශ ගුරුවරු බහුතරයක් භාවිත කරති
- ක්‍රියාත්මක විෂයමාලාවේ ශිෂ්‍ය කේන්ද්‍රීයත්වයට අවධානය යොමු කළ යුතු වුව ද ඒ පිළිබඳ ව ගුරුවරු අවධානය යොමු නොකරති
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාහිර සම්පත් දායකත්වය ලබා ගැනීම ඉතා පහළ අගයකින් සිදු වෙයි
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඉගෙනුම් ආධාරක භාවිත නො කරන පිරිස භාවිත කරන පිරිසට වඩා වැඩි ය
- පාඩම් සැලසුමකට අනුව ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන් අඩු අගයක් ගනී
- විෂය ක්‍රියාත්මක වුව ද ඉගැන්වීමට පන්ති කාමරයක් නොමැති පිරිවෙන් විද්‍යායතන ද ඇත
- ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රමාණවත් සංගීත භාණ්ඩ සහ තාක්ෂණික උපකරණ බහුතර පිරිවෙන්වල නොමැත
- ගුරුවරුන්ගෙන් අඩකට ඉගැන්වීමට ඇති කාලය ප්‍රමාණවත් නැත
- ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බෞද්ධාගමික පරිසරයේ සෘණාත්මක බලපෑම ඇත්තේ ඉතා අල්ප වශයෙනි
- වෘත්තියෙහි නියැළෙන විෂයභාර ගුරුවරුන් සමස්තයෙන් අඩක් වෘත්තියෙහි නියැළෙන්නේ අතෘප්තිකර ව ය.
- ගුරුවරුන්ගෙන් බහුතරයක් තමා ළඟ ඇති වෘත්තිය පුහුණුව පිළිබඳ සෑහීමකට පත් නො වේ
- පිරිවෙන් අධ්‍යාපනය වුව ද සංගීතය ඉගැන්වීමට පරිවේණාධිපති හිමිවරුන්ගෙන් ලැබෙන සහය සතුටුදායක මට්ටමක පවති. එම අනුග්‍රහය විෂයයෙහි ප්‍රගමනයට රුකුලකි.
- යථෝක්ත නිගමනවලට අනුව සමස්තයක් ලෙස බලන කල පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන පසුබිම් කාර්යසාධනය මධ්‍යම හෝ ඊට පහළ මට්ටමේ පවතී
- ඒ අනුව පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපන ඉගෙනුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී සමස්ත විද්‍යායතන පිරිවෙන් සඳහා මූලික භෞතික ඉගෙනුම් අවශ්‍යතා ප්‍රමාණවත් නොවීම, ගුරු කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය ගුරු පුහුණු ප්‍රමාණවත් නොවීම, අත්‍යවශ්‍ය සංගීත භාණ්ඩ සහ තාක්ෂණික උපකරණ නොමැති වීම සහ පරිපාලන අංශ තුළින් විෂය ප්‍රවර්ධනය සඳහා ලබා දෙන දිරි ගැන්වීම් සහ මැදිහත් වීම් අවම මට්ටමක පැවතීම පර්යේෂණයෙන් නිගමනය වේ.

යෝජනා

පිරිවෙන් විද්‍යායතන සංගීත අධ්‍යාපනය හා සම්බන්ධ උද්ගත වී ඇති ගැටලු බොහොමයක් ම පිරිවෙන් කළමනාකරණය ශක්තිමත් කිරීම මගින් ගුණාත්මක අධ්‍යාපනයක් සැපයිය හැකි අතර, ඒ සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

- ගුරුවරුන් විසින් සිසුන්ගේ ධනාත්මක චර්යාමය වෙනස පදනම් කර ගනිමින් පාඩම් සැලසුම් කිරීම
- පාඩම් සැලසුමක් සකස් කරන විට එයට අදාළ කර ගැනීමට අපේක්ෂිත ආධාරක ද සැලසුම් කිරීම සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ආධාරක ප්‍රායෝගික ව යොදා ගැනීම
- ගුරු පුහුණුව යාවත්කාලීන කිරීම
- එහි දී සාම්ප්‍රදායික ඉගෙනුම් ප්‍රවේශවලින් මිදී නව ඉගෙනුම් ප්‍රවේශ සහ නව ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳ ව ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- එම වැඩසටහන් මගින් ලබන ප්‍රායෝගික හුරුව පන්ති කාමරයේ දී යොදා ගනී දැයි අධීක්ෂණය කිරීම
- අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් නියමිත ප්‍රමිති අනුව විෂයය සඳහා ලබා දී ඇති කාලපරිච්ඡේද ගණනට අනුව විෂයමාලාව ඉගැන්වීමට ගුරුවරුන්ගේ කාලය කළමනාකරණය කර ගැනීම
- ගුරුවරුන් තුළ ඇති උදාසීන බව සහ ඍණාත්මක ආකල්පවලින් මුදවා ගත හැකි ධනාත්මක උපස්ථම්භන ලබා දීම
- පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය සඳහා රාජ්‍ය අරමුදල් පමණක් නො ව රාජ්‍ය නො වන සංවිධානවල, පෞද්ගලික අංශයේ, ආදි ශිෂ්‍යයන්ගේ සහ සුභපතන්නන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා පරිවේණාධිපතිවරුන් දැනුවත් කිරීම
- සංගීත ගුරුවරයාගේ නිසි ගෞරවය හා වෘත්තීයම තත්ත්වය නගා සිටුවීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- සංගීත අධ්‍යාපනයට අදාළ මූලික පහසුකම් ප්‍රවර්ධනය කිරීම
- නිපුණතා අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ශිෂ්‍ය කාර්යය ප්‍රබල කිරීම
- සංගීත අධ්‍යාපන කළමනාකරණය විධිමත් කිරීම

ආශ්‍රිත ග්‍රන්ථ

අදිකාරී, ඒ (1964). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන.* නුගේගොඩ: තිසර ප්‍රකාශන.

අබේසිංහ, වි. (1999). *පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය.* මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

වල්පොල හිමි, ආර්. (1962). *ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය.* කොළඹ.

සීලානන්ද හිමි, ආර්. (2003). *ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය.*කතෘ ප්‍රකාශන.

සෝමානන්ද හිමි, තෙරීපැහැ. (2005). *සම්භාෂා.* 13 වැනි කලාපය, *පිරිවෙන් අධ්‍යාපනය සඳහා අමරපුර නිකායේ දායකත්වය.* අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි.

Dargye, Y. (2019). *An overview of Bhutan's monastic education system.* This paper is written in order to introduce the monastic education system that exists in Bhutan to eminent participants in the workshop organized to celebrate the Vesak in Bangkok, Thailand.

Keerthirathne, W.K.D. (2020). A study on evolution of Pirivena as an educational institute from past to the present in the history of traditional education in Sri Lanka. International Journal of Humanities and Social Science Invention (IJHSSI) ISSN(Online): 2319 – 7722, ISSN (Print): 2319 – 7714.

Silva, C. R. (2019). The education of Buddhist monks in Sri Lanka: A historical review and some suggestions for reform. The Sri Lanka Journal of the Humanities (2018) 42: 1-2, 01-28 DOI: http://doi.org/10.4038/sljh.v42i1- 2.7253 Published online: University of Peradeniya.

Yatiwella, U. B. (2023). An exploratory study of the music education learning process (from Vidyathan Piriven). 5th International Conference of Faculty of Music 2023 (ICFM-2023) 22nd - 23rd November 2023, Colombo, Sri Lanka.

Yatiwella, U.B. (2023). A study on the use of effective teaching and learningTechniques for practical use in Ragadhari Music Education (By Piriven Vidyathana). Proceeding of First National Research Symposium of Department of Social Sciences, Rajarata University of Sri Lanka

SRI LANKAN JOURNAL OF EDUCATIONAL RESEARCH

Sri Lankan Journal of Educational Research 2024
Volume 17, Pages 50– 57
Department of Research and Development

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළපොත්වල ජනවර්ග සංකල්පය නියෝජනය: පර්යේෂණ සාහිත්‍ය විචාරයක්

දිසානායක, එන්. ඩී., වෙඩිකන්දගේ, එල්. එන්. පී.
ජාතික අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
niroshanilantha@yahoo.com[1]

සාරාංශය: *ජනවාර්ගික අර්බුද, ලෝකයේ බොහෝ රටවල සමාජ සංහිඳියාවට ප්‍රබල බලපෑමක් එල්ල කළ හැකි සමාජ සාධකයකි. බහු වාර්ගික හා බහු සංස්කෘතික පසුබිමක් පවතින ශ්‍රී ලංකාවේ විෂයමාලාව සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකයින් මෙම යථාර්ථය ගැන වඩාත් සැලකිලිමත් විය යුතු පසුබිමක, පර්යේෂණ පරමාර්ථය වන්නේ, ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළපොත්වල ජනවර්ග සංකල්පය අන්තර්ගත වී ඇති ආකාරය පිළිබඳ අද්‍යතන පර්යේෂණවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීම ය. පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළපොතෙහි ජනවර්ග නිරූපණය පිළිබඳ පවතින පර්යේෂණ හඳුනා ගැනීම, ජනවර්ග නියෝජනය සම්බන්ධ ව පවතින පර්යේෂණ ලිපිවල අන්තර්ගතය විශ්ලේෂණය සහ අනාගත පර්යේෂණ මගින් සපුරාලිය යුතු දැනුමෙහි හිදැස විමසා බැලීම ය. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයට අනුව, සන්ධාර විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමය භාවිත කරමින්, පර්යේෂණ ලිපි පහක අන්තර්ගතය, තේමා පාදක ව උද්ගාමී ව විශ්ලේෂණය කෙරිණි. ඉතිහාසය පෙළපොත යොදා ගෙන, ශ්‍රී ලාංකික සන්දර්භය පදනමින්, ජනවර්ග සංකල්පය නියෝජනය වන පර්යේෂණ ලිපි පහේ විශ්ලේෂිත දත්ත මගින් අනාවරණය වූයේ, ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළපොත පදනම් කර ගනිමින් ජනවර්ග සංකල්පය විශ්ලේෂණය පිළිබඳ ව කරන ලද පර්යේෂණ ලිපි ඉතා අල්ප වන අතර ම (ලිපි 5කි) එම පර්යේෂණ 2014-2017 කාල පරාසයේ දී google scholar මගින් ප්‍රකාශයට පත් කර ඇති බව ය. පර්යේෂණ ලිපිවලට අනුව සුළු ජාතීන් ප්‍රමාණවත් පරිදි නිරූපණය වී නොමැති බවත්, ඉතිහාසය පෙළපොතෙහි ඓතිහාසික ආඛ්‍යානය මග හැරීමෙන් සමාජ සහජීවනයට ආමන්ත්‍රණය කර නොමැති බවත් අනාවරණය විය. විෂය විශේෂඥයින් හා පාර්ශ්වකරුවන්ගේ සංජානන විමසීම, තෘණමූල තලයේ ක්‍රියාත්මක ස්වරූපය හඳුනා ගැනීම සහ ජනවාර්ගිකත්වය කෙරෙහි අවධානය යොමු කරමින් විෂයමාලා සම්පාදනය සහ පෙළපොත් රචනය සම්බන්ධ ව ප්‍රතිපත්තිමය ක්‍රමවේද සකස් කිරීමේ අවශ්‍යතාව පර්යේෂණ දැනුමෙන් හෙළි වූ හිදැස වන අතර ම මෙම දැනුම් හිදැස පිරවීමට ඉදිරි පර්යේෂණවල නිරත වීමේ අවශ්‍යතාව අද්‍යතන පර්යේෂණයෙන් යෝජනා කෙරේ.*

මුඛ්‍ය පද: ***ශ්‍රී ලංකාව, ඉතිහාසය පෙළපොත්, ජනවර්ග සංකල්පය නියෝජනය***

හැඳින්වීම

බහු සංස්කෘතික සමාජවල, විශේෂයෙන් ජනවාර්ගික ගැටුම් ඉතිහාසයක් ඇති රටවල, අධ්‍යාපනික විෂයමාලා ද්‍රව්‍යවල වාර්ගිකත්වය නියෝජනය කිරීම තීරණාත්මක ගැටලුවකි. බහු වාර්ගික, බහු සාමාජික සහ බහු ආගමික සංයුතියෙන් සංලක්ෂිත ජාතියක් වන ශ්‍රී ලංකාව ද මේ සම්බන්ධයෙන් සැලකිය යුතු නිදර්ශන සපයන බවට තර්ක කළ හැකි ය. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික, බහු සාමාජික හා බහු වාර්ගික රටක් වනුයේ ශ්‍රී ලංකාවේ ජනගහනය සිංහල, දෙමළ හා මුස්ලිම් ලෙස විවිධ ජනවාර්ගික කණ්ඩායම්වලට බෙදී ඇති නිසා ය. ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකයින් මෙම යථාර්ථය ගැන සැලකිලිමත් විය යුතු ය. එසේ සැලකිලිමත් නොවීමෙන් ජනවාර්ගික අර්බුදයට අධ්‍යාපනයෙන් ද මූල බීජ සම්පාදනය වී ඇත (Jayawardana, 1987; Uyangoda,

2007). මේ පදනම අනුව, විශේෂයෙන්, ඉතිහාසය පෙළපොත සම්පාදනයේ දී ද සියලු ජනවර්ග පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. එවන් ප්‍රතිපත්තියකින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සුහදත්වය පවත්වා ගෙන යාමට පාසලින් ද පාසලේ ඉතිහාසය විෂයයෙන් ද පදනමක් සැපයිය හැකි ය.

ඉතිහාස විෂයමාලාව හා පෙළපොත, සිසුන්ට පොදුවේ සතු විය යුතු සාමූහික මතකයක් ගොඩ නැගීම සඳහා භාවිත කළ හැකි ප්‍රධාන මාධ්‍යයක් වන අතර එමගින් තරුණ පරම්පරාවේ ජාතික, සමාජීය සහ සංස්කෘතික පරිකල්පනය, සාමූහික ව හැඩ ගස්වයි (Yi Hugng සහ Lan Chen, 2019). ශ්‍රී ලංකාවේ වසර තිහක සිවිල් යුද්ධය අවසන් වී දශකයක් පසු වෙද්දීත් තවමත් ජනවාර්ගික අර්බුද හට ගැනීමට පාදක වන සංසිද්ධි මතු වෙමින් පවතී. එබැවින් විවාදාපන්න ගැටලුවක් ව පවතින ජනවාර්ගික අර්බුදය සඳහා බුද්ධිමත් ව හා කඩිනමින් දීර්ඝ කාලීන විසඳුම් සෙවීම වර්තමාන ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය කරුණක් ව පවතී. ඒ සඳහා උපකාර කර ගත හැකි එක් ප්‍රධාන මාධ්‍යයක් ලෙස අධ්‍යාපනයට කළ හැකි කාර්යය ඉතා භාරදූර ය. ඒ අතරින් විෂයමාලාව ප්‍රමුඛ වන අතර 6 - 11 ශ්‍රේණිවල එක් ප්‍රධාන හර විෂයයක් වන ඉතිහාස විෂයය, දැයට ආදරය කරන ජව සම්පන්න ශ්‍රී ලාංකිකයකු තැනීමේ අරමුණින් පාසල් විෂයමාලාවේ ක්‍රියාත්මක වේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2017). සිසුන් වෙත පහසුවෙන් සහ ඉක්මනින් ළඟා විය හැකි ප්‍රධාන වාහකය පෙළපොත වන බැවින් ඉතිහාස පෙළපොතින් ජනවාර්ගික සුහදත්වය වඩාත් හොඳින් අනාගත පරපුරට සම්ප්‍රේෂණය කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය, ජාතික අනන්‍යතාව හැඩ ගැස්වීමේ දී, සමාජ සහජීවනය හා සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීමේ දී සහ අන්තර් වාර්ගික සබඳතා පෝෂණය කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ ද (Little, 2010; පුෂ්පකුමාර, 2020) ක්‍රියාත්මක තලයේ දී එනම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ, ගුරු පුහුණු අවස්ථා, ඉගෙනුම් ක්‍රමවේද සහ ඇගයීම් ක්‍රමවේදවල පවතින ගැටලු තත්ත්ව හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගෙන නොමැත (පුෂ්පකුමාර, 2020).

එසේ ම විවිධ වූ ශිෂ්‍ය ජනගහනය අතර, අවබෝධය, ඉවසීම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට, ශ්‍රී ලාංකේය ඉතිහාස පෙළපොත් බොහෝ විට අසමත් වන බව දැනට පවතින පර්යේෂණ සහ උපකල්පිත සාක්ෂිවලින් පෙනී යයි (Samarasinghe, 2022; Gaul, 2014). තව ද ඉතිහාස විෂයයේ ජනවර්ග නියෝජනය විකල්ප දෘෂ්ටි කෝණවලින් කෙබඳු ව විශ්ලේෂණය වී ඇත් දැයි පර්යේෂණාත්මක ව විශ්ලේෂණය කර නැති නිසා ද දැනුමේ හිදැසක් පවතියි. එබැවින් ඉතිහාස පෙළපොතෙහි ලංකාවේ ජනවාර්ගික නිරූපණය කෙබඳු දැයි සෙවීමට විස්තීර්ණ විශ්ලේෂණයක නිරත වීම අත්‍යවශ්‍ය වේ. එබැවින් පෙළපොතෙහි අගතියකින් තොර ජනවාර්ගික නියෝජනයක් සඳහා උචිත විකල්ප හඳුනා ගැනීමට, ගැඹුරු සාහිත්‍ය සමාලෝචනයක යෙදීම වැදගත් ය. මේ පසුබිම අනුව, ඉතිහාසය පෙළපොත් පිළිබඳ පර්යේෂණ විමර්ශනයේ අරමුණ වන්නේ, පෙළපොත්වල ජනවාර්ගික සංකල්පය නියෝජනය වන ආකාරය හඳුනා ගෙන, ඊට අදාළ අනාවරණ සාරාංශගත කිරීම ය. එමගින් ශ්‍රී ලාංකික සන්දර්භය පාදක ව කරන ලද පර්යේෂණ අනාවරණ සංස්ලේෂණය ද කිරීමෙන් පෙළපොත්වල ජනවර්ග සංකල්ප නිරූපණය වී ඇති ආකාරය පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට හැකි ය. අද්‍යතන සාහිත්‍ය විමසුමේ ප්‍රතිඵල, සමාජ ඒකාග්‍රතාව ඇති කිරීමේ දී සහ ගුණාත්මක පෙළපොතක් සංවර්ධනයේ දී, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රතිපත්ති සම්පාදනයෙන් ද, විෂයමාලා සම්පාදකයින්ට විෂයමාලා සම්පාදනයෙන් ද, ඉතිහාසය පෙළපොත් රචකයින්ට පෙළපොත් රචනයෙන් ද ගුරුවරුන්ට ඉතිහාසය විෂයය ඉගැන්වීමෙන් ද ඉවහල් විය හැකි

යැයි අපේක්ෂිත ය. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ ජනවර්ග නියෝජනයේ විවිධතා හඳුනා ගැනීමෙන් දේශිය සන්දර්භයට උචිත පරිදි ජනවාර්ගික අගතියකින් තොර ව පෙළපොත සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීමට ද මෙම සාහිත්‍ය විමර්ශනය උපකාරී වේ. එබැවින් පෙළපොත්වල ජනවර්ග නිරූපණය පිළිබඳ ව නව දැක්මක් ලබා දීමට අද්‍යතන සාහිත්‍ය විමසුමෙන් හැකි දැයි තීරණය කිරීමට හැකි වෙයි.

ඉතිහාස පෙළපොත්වල වාර්ගිකත්වය නියෝජනය කිරීම, ඓතිහාසික සිදුවීම් සහ සංස්කෘතික අනන්‍යතා පිළිබඳ සිසුන්ගේ අවබෝධය හැඩ ගැස්වීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම සාහිත්‍ය සමාලෝචනයේ අරමුණ වන්නේ ඉතිහාස පෙළපොත්වල ජනවාර්ගිකත්වය නිරූපණය වන ආකාරය ගවේෂණය කිරීම හා මෙම අධ්‍යාපන සම්පත්වල පවතින පොදු තේමා සහ පක්ෂග්‍රාහීත්වයක් වේ නම් ඒ ලක්ෂණ හඳුනා ගැනීමයි. එමගින් ඉතිහාසය පිළිබඳ පුළුල් අවබෝධයක් සිසුන් තුළ පෝෂණය කිරීමේ දී, විවිධ ජනවාර්ගික කණ්ඩායම් ඇතුළත් කර, නිවැරදි ලෙස ඉතිහාසය නිරූපණය කිරීමේ වැදගත්කම ඉස්මතු කිරීමට උත්සාහ කරනු ලැබේ.

සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ ඉතිහාස පෙළපොත් පිළිබඳ ව කෙරුණු පර්යේෂණ පහක් පාදක කර ගත් සාහිත්‍ය විමර්ශනය සහිත මෙම පර්යේෂණයෙන් ඉතිහාසය පෙළපොත්වල ජනවර්ග නියෝජනය පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් කරන ලදි. එහි දී සුළු ජාතීන් නියෝජනය, සමාජ සංහිඳියාව, ඉතිහාසය විෂයමාලාව, ආගමික සංහිඳියාව, වාර්ගික කේන්ද්‍රීය සහ ජාතිකත්වය පිළිබඳ සංකල්පය ගොඩ නැගීම සඳහා බෞද්ධ දෘෂ්ටි වාදයේ අංග වෙත යොමු වන ආකාරය ඇතුළු ප්‍රධාන සොයා ගැනීම් සාරාංශ කරන ලදි. මෙම සාහිත්‍ය සමාලෝචනයේ ප්‍රතිඵල විෂයමාලා සම්පාදකයින්ට ජාතික සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනය ප්‍රබල මෙවලමක් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ වැඩි අවබෝධයක් ලබා දෙන අතර ම පෙළපොත් රචකයින්ට බහු සංස්කෘතික යථාර්ථය පිළිබඳ අවධානයෙන් පෙළපොත් රචනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. එසේ ම ප්‍රතිපත්ති සම්පාදකයින්ට ජාතික සංහිඳියාව ගොඩ නැගීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මග පෙන්වීමක් ද ජාතික අනන්‍යතාව සහ සමාජ සහජීවනය ගොඩ නගා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි උනන්දුවක් දක්වන ගුරු-සිසු, අධ්‍යාපනඥයින් සහ පර්යේෂකයන් සඳහා වටිනා මග පෙන්වීමක් ද සපයයි.

ක්‍රමවේදය

පර්යේෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ජනවාර්ගික සංකල්පය මත පදනම් ව ඉතිහාස පෙළ පොත් පිළිබඳ ව කරන ලද පර්යේෂණවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීමයි. ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ජනවාර්ගිකත්වය පිළිබඳ පර්යේෂණ හඳුනා ගැනීම, ජනවර්ග නියෝජනය පිළිබඳ දැනට පවතින පර්යේෂණ ලිපිවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීම සහ අනාගත පර්යේෂණ මගින් පිරවිය යුතු දැනුම් පරතරය නියම කිරීම විශේෂිත අරමුණු විය. පළමු අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලාංකීය සන්දර්භය පිළිබඳ ලිපි පහක් හඳුනා ගන්නා ලදි (Gaul, 2014; Gaul 2017; Nanayakkara, 2017; Duncan and Cardozo, 2017; Dissanayake, 2020). දෙවන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, වාර්ගික ගැටලුව පිළිබඳ පර්යේෂණ ලිපි පහ විශ්ලේෂණය කිරීමට සන්ධාර විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමය භාවිත කෙරිණි. සන්ධාර විශ්ලේෂණය මත පදනම් ව, අනාගත පර්යේෂණයකින් පිරවිය යුතු නිශ්චිත දැනුම් පරතරය හඳුනා ගන්නා ලදි.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

උද්ගාමී සන්ධාර විශ්ලේෂණයෙන් පර්යේෂණ ලිපි පහට අයත් තේමා දෙකක් හඳුනා ගන්නා ලදි. ජන වාර්ගිකත්ව නිරූපණය (Representation of ethnicity) සහ ජාතික සංහිඳියාව (National reconciliation) වශයෙනි. ජන වාර්ගිකත්ව නිරූපණය යන තේමාව හඳුනා ගනු ලැබුවේ Gaul (2014, 2017) යන ලිපි දෙකෙන් හා Dissanayake (2020) යන ලිපියෙනි. ජාතික සංහිඳියාව යන තේමාව හඳුනා ගනු ලැබුවේ Nanayakkara (2017); Duncan & Cardozo (2017) යන ලිපි දෙකෙනි. මේ පිළිබඳ විස්තරාත්මක දත්ත පහත දැක්වේ.

ජනවාර්ගිකත්ව නිරූපණය (Representation of ethnicity)

බහු වාර්ගික රටක විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීම අතිශය තීරණාත්මක සාධකයක් වනුයේ බහු සංස්කෘතිකත්වය කෙරෙහි අවධියෙන් එය සකස් කළ යුතු බැවිණි. ඉතිහාසය පෙළපොතෙහි ජන වාර්ගික නියෝජනය පිළිබඳ ව "සුළු ජාතීන් කොහේ ද?" යනුවෙන් "ශ්‍රී ලංකාවේ ඉතිහාස පෙළපොත්වල බහු සංස්කෘතිකත්වයේ දුරවබෝධ සහ ධනාත්මක පිළිගැනීම" යන ගැටලුව ඔස්සේ (Gaul, 2014) කරන ලද පර්යේෂණයේ දී අනාවරණය වී ඇත්තේ, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දැක්ම සහ අරමුණ වන ශ්‍රී ලාංකේය ජාතියේ ආරක්ෂාව සමග සංස්කෘතික විවිධත්වය පිළිගැනීම සහ බහු සංස්කෘතිකත්වයට ගරු කරමින් බහු සංස්කෘතික සහ ජාතික වශයෙන් ඒකාබද්ධ සමාජයක් ගොඩ නැගීමෙන් ජනවාර්ගික ගැටුම් සහ අවිශ්වාසය ජය ගැනීම යන අභිලාෂකාමී අරමුණු සඳහා ඉතිහාසය පෙළපොත් සහාය නො දක්වන බව ය. තව ද වෙනස සහ විවිධත්වය ධනාත්මක ව හඳුනා ගැනීම ප්‍රවර්ධනය කරනවා වෙනුවට බොහෝ දුරට සුළු ජාතීන් අභිබවා යමින් ජාතික සංස්කෘතිය ලෙස සිංහල සාරධර්ම හා සම්ප්‍රදායවලට ප්‍රමුඛත්වය දීම දක්නට ලැබේ. විශේෂයෙන් ආගමික විවිධත්වය පදනමින් සීමිත ව ප්‍රජාව අතර වෙනස්කම් පිළිගන්නා අතර ඔවුනොවුන් සමග ක්‍රියාකාරී ව සම්බන්ධ නොවීමෙන් රටේ සිංහල කේන්ද්‍රීය ඉතිහාසයක් සපයන බව තවදුරටත් අනාවරණය වෙයි. එසේ ම එය සුළුතර ප්‍රජාවගේ දායකත්වය බොහෝ දුරට නොසලකා හරින බවත් විශාලතම සුළුතර කණ්ඩායම වන දෙමළ ජනයාගේ නිෂේධාත්මක නිරූපණයක් ඉදිරිපත් කරන බවත් සඳහන් කරයි. තව ද ඉතිහාසය පෙළපොත් ඓතිහාසික සිදුවීම් පිළිබඳ බහුවිධ අර්ථකථන හඳුනා ගන්නා සහ අතීතය සමග විවේචනාත්මක ව සම්බන්ධ වීමට පාඨකයන් දිරිමත් කරන විවේචනාත්මක ඉතිහාස ලේඛනයක් ඉදිරිපත් නො කරයි. පෙළපොත් රටේ මෑත ඉතිහාසය, වාර්ගික ගැටුම් සහ සිවිල් යුද්ධයේ ඉතිහාසය සාකච්ඡා නො කරන බව අනාවරණය කරන අතර කෙසේ වෙතත් ජාතික ඒකාබද්ධතාවේ සහ සාමයේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ඉතිහාසයේ මෙම තීරණාත්මක කොටස අත්හැරිය නො හැකි බව පර්යේෂක සඳහන් කරයි. ඒ අනුව Gaul (2014) අවධාරණය කරනුයේ ශ්‍රී ලංකාවේ පෙළපොත් කතුවරුන්ට ඇති අභියෝගය වන්නේ, රට සහ එහි සියලු ජනතාව පිළිබඳ සත්‍ය වශයෙන් ම ඇතුළත් ඉතිහාසයක් නිර්මාණය කිරීම සහ ගැටුම් සහ යුද්ධය සියලු ප්‍රජාවන්ට පිළිගත හැකි ආකාරයෙන් ආමන්ත්‍රණය කිරීම ය.

"ආරක්ෂාව, ස්වෛරීත්වය, දේශප්‍රේමය - සිංහල ජාතිකවාදය සහ ශ්‍රී ලංකා ඉතිහාසය පෙළපොත්වල රාජ්‍යය" යන මාතෘකාවට අදාළ ව Gaul (2017) කරන ලද පර්යේෂණයේ දී අනාවරණය කර ගෙන ඇත්තේ, වාර්ගික කේන්ද්‍රීය, විටෙක ජාතිවාදී ජාතිකත්වය පිළිබඳ සංකල්පයක් ගොඩ නැගීම සඳහා බෞද්ධ දෘෂ්ටිවාදයේ අංග වෙත යොමු වන බව ය. තව ද පෙළපොත්වලට ඇතුළත් කර ඇති මිථ්‍යාවන්, සංකේත සහ වීරයන්ගේ භාෂාව සහ තේරීම "ශ්‍රී ලාංකිකයින්"

කේන්ද්‍ර කර ගන්නා බව සඳහන් කරන නමුත් බොහෝ දුරට බහුතර ප්‍රජාවට සීමා වූ ජාතිකත්වය පිළිබඳ සීමිත සංකල්පයක් ගොඩ නගන බව එහි සඳහන් වේ. සිංහලයින්ගේ ආධිපත්‍යය, ඔවුන්ගේ විශ්වාස, සම්ප්‍රදාය, සංස්කෘතිය සහ සියල්ලටත් වඩා ඔවුන්ගේ ආගම බහු වාර්ගික ඉතිහාසයක් ඉදිරිපත් නො කරන සීමිත ඓතිහාසික ආඛ්‍යානයක් ඉදිරිපත් කරන අතර ම දිවයින බෙදා හදා ගන්නා සුළුතර ප්‍රජාව බොහෝ දුරට නොසලකා හැර ඇති බව තවදුරටත් පෙන්වා දෙයි. ජනවාර්ගික නියෝජනයෙන් ඔබ්බට ගොස්, පෙළපොත් අඛණ්ඩ ව උසස් ජාතියක් ගොඩ නගන අතර සිංහලයින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික පාලකයන් ලෙසත්, අනෙකුත් ප්‍රජාවලට සහ පිටස්තරයින්ට වඩා සදාචාරාත්මක ව උසස් සහ සමස්තයක් ලෙස දිව්‍ය ජාතියක් ලෙසත් නිරූපණය කරන බව අනාවරණය කරයි. තව ද පෙළපොත්වල ආඛ්‍යාන ශ්‍රී ලංකා රාජ්‍යය සහ බුද්ධාගම අතර සම්බන්ධයක් ස්වාභාවිකකරණය කරන බවත්, සිංහලයින් දිවයිනේ අසහාය පාලකයන් ලෙස ස්ථාපිත කර ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන යථාර්ථය නීත්‍යානුකූල කරන බවත් දක්වයි.

එසේ ම පෙළපොත්වල "පරමාදර්ශී පුරවැසියා" රටේ පාලකයින්ට ගරු කරන, කීකරු සහ ප්‍රශ්න නො කරන අතර ඔහුගේ හෝ ඇයගේ ආගමට සහ ජාතියට සේවය කරන බව දක්වන Gaul (2017) ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් වෙනුවට ඉතිහාසය පෙළපොත් සිංහල ජාතිකවාදයේ අධිකාරීවාදයට පහසුකම් සැලසිය හැකි ස්වාභාවික ධූරාවලියක් පවත්වා ගෙන යන බව සඳහන් කරයි. පසුගිය දශකය තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ වඩාත් දැඩි පාලන යාන්ත්‍රණ හඳුන්වා දුන්න ද, වත්මන් ඉතිහාසය පෙළපොත්වල සිංහල ආධිපත්‍යයක් පෙන්නුම් කරන බව තවදුරටත් අවධාරණය කරයි. ප්‍රජාව අතර සම්බන්ධක භාෂාවක් ලෙස ක්‍රියා කිරීමට ඉංග්‍රීසියට ඇති හැකියාව තිබිය දීත්, පරිවර්තිත පෙළපොත් තුළ ජනවාර්ගික කේන්ද්‍රවාදය පවතින ආකාරය ද අනාවරණය කරයි.

දිවයින බෙදා හදා ගන්නා සියලු ම ප්‍රජාවන්ට යුක්තිය ඉටු වන ආකාරයෙන් ඓතිහාසික සම්පත් සමග විවේචනාත්මක බැඳීමක් ඇති කිරීමේ අවශ්‍යතාව යෝජනා කරන අතර ම වර්තමානයේ ජාතික සහජීවනය අරමුණු කර ගනිමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වුව ද, වාර්ගික කේන්ද්‍රීය ඉතිහාසය පෙළපොත් මගින් ඉදිරිපත් කරන ලද ආඛ්‍යාන ජාතිකත්වයේ බහු-වාර්ගික සහජීවනයට දායක නො වන බව Gaul (2017). තවදුරටත් පෙන්වා දෙයි.

ශ්‍රී ලංකාවේ 10 වන ශ්‍රේණියේ ඉතිහාසය පෙළපොතෙහි ජනවාර්ගික නියෝජනය හඳුනා ගැනීම පිළිබඳ ව Dissanayake (2020) කරන ලද උද්ගාමී ගුණාත්මක සන්ධාර විශ්ලේෂණයේ අරමුණ වී ඇත්තේ ඉතිහාසය පෙළපොතේ අන්තර්ගතයේ ජනවාර්ගික නියෝජනය හඳුනා ගැනීම ය. එම විශ්ලේෂණයේ අනාවරණ ලෙස, 10 වන ශ්‍රේණියේ ඉතිහාසය පෙළපොතේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවර්ග තුන ම පිළිබඳ ව (සිංහල, දෙමළ සහ මුස්ලිම්) තොරතුරු ඉදිරිපත් කර ඇත. සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යා මූලාශ්‍ර මගින් සිසුන් දැනුම්වත් කිරීමේ කාර්යයේ දී, ජනවාර්ගික කණ්ඩායම් තුනට ම අදාළ දත්ත සැලකිල්ලට ගනිමින් තොරතුරු සහ රූප සමගින් ඉදිරිපත් කර ඇත. සිංහල සහ දෙමළ ජනවර්ග පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර හා සසඳන විට මුස්ලිම්වරුන් පිළිබඳ තොරතුරු දක්වා ඇත්තේ අවම වශයෙනි. ජනවර්ග නියෝජනයට අනුව, සිංහල, දෙමළ, සහ මුස්ලිම් යන ප්‍රධාන ජනවර්ග තුන ඔවුන්ගේ ආගම් (බුද්ධාගම, හින්දු සහ ඉස්ලාම්) බොහෝ භක්තියෙන් අනුගමනය කළ අතර භේදයකින් තොර ව අනෙකුත් ආගම් කෙරෙහි ද සංවේදී ව එලෙස ම පිළිපදිති. ජනවාර්ගික කණ්ඩායම් අතර ඉහළ මට්ටමේ ආගමික සහජීවනයක් පැවති අතර වාර්ගික කණ්ඩායම් තුන ම සමගියෙන් ජීවත් වූ බවට සාක්ෂි සනාථ කරන බව පර්යේෂණයෙන් අනාවරණය කරයි. එහි තවදුරටත් පෙන්වා දෙන්නේ පෙළපොත් රචකයන්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ මූලික වශයෙන් ම වාර්ගිකත්වය

කෙරෙහි අවධානය යොමු කිරීමට වඩා එහි ඓතිහාසික ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ කරුණු නිදර්ශනය කරමින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ නිවැරදි කරුණු සම්බන්ධ ව ගැඹුරින් සිසුන් දැනුවත් කිරීම බවයි. මුස්ලිම්වරුන් පිළිබඳ තවත් කරුණු මූලාශ්‍ර මත පදනම් වී ඇත්නම් ඒවා ඇතුළත් කිරීම වැදගත් බව පර්යේෂණයෙන් යෝජනා කරයි (Dissanayake, 2020).

ජාතික සංහිඳියාව (National reconciliation)

"ජාතික සංහිඳියාව සඳහා ඉතිහාස විෂයමාලාව" මැයෙන් Nanayakkara (2017) කළ ශ්‍රී ලංකාවේ ද්විතියික පාසල් ඉතිහාස පෙළපොත් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වී ඇත්තේ, ජාතික සංහිඳියාව සහ ඉතිහාසය අතර පරතරය පිළිබඳ න්‍යායාත්මක සාකච්ඡාවක් ඇති කිරීම ය. ඒ සඳහා ඉතිහාස පෙළපොතේ ඓතිහාසික ආඛ්‍යාන විශ්ලේෂණය කර ඇති අතර එමගින් සමාජ සංහිඳියාවට වන දායකත්වය පිළිබඳ ව කරුණු විභාග කර ඇත. එහි දී 6-11 ශ්‍රේණි ඉතිහාසය පෙළපොත් නියැදිය ලෙස භාවිත කරමින් සන්ධාර විශ්ලේෂණ ක්‍රමය යොදා ගනිමින් න්‍යායාත්මක සංකල්ප ඔස්සේ අනාවරණ කර ගෙන ඇත්තේ, පෙළපොතෙහි ඓතිහාසික ආඛ්‍යානය සම්පූර්ණයෙන් ම මග හැරී ඇති බව ය. සිංහල කේන්ද්‍රික ආඛ්‍යාන පෙළපොතින් ඉදිරිපත් කරන අතර රටෙහි සිටින දෙමළ සහ මුස්ලිම් ජනවර්ගය මග හැරී ඇති බව එමගින් තවදුරටත් පෙන්වා දෙයි. ඒ අනුව යෝජනා කරන්නේ සිංහල සහ දෙමළ ජනවර්ග අතර මධ්‍යස්ථ සංවාදයක් ගොඩ නැගීම සඳහා ඉතිහාසය, සම්බන්ධ කිරීමෙන් හෝ හුවමාරු කිරීමෙන් ඉතිහාසය කතන්දරය ඒක දෘෂ්ටියෙන් විකල්ප දෘෂ්ටියට පරිණාමය විය යුතු බව ය (Nanayakkara, 2017).

ගුරුවරුන්, සිසුන්, ප්‍රජා සංවිධාන නියැදිය ලෙස යොදා ගනිමින් "පශ්චාත් යුධ සමයේ ශ්‍රී ලංකාවේ යාපනයේ මුස්ලිම් සහ දෙමළ ජනතාව සඳහා ප්‍රජා අධ්‍යාපනය තුළින් සමගි සන්ධානය නැවත ලබා ගැනීම" නමැති මාතෘකාවට අදාළ ව Duncan & Cardozo (2017) කරන ලද පර්යේෂණයේ ගුරු ප්‍රතිචාරවලින් අනාවරණය වී ඇත්තේ, සිංහල බෞද්ධ සහ සංස්කෘතික ආධිපත්‍ය නිරූපණය කරන පක්ෂග්‍රාහී ඉතිහාස විෂයමාලාවක් පවතින බව ය. එසේ ම සුළුතර දෙමළ සහ මුස්ලිම් සංස්කෘතිය නිවැරදි ව නිරූපණය නො කරන බවත්, එය අරමුණු සහගත ලෙස වෙන් කොට සැලකීමේ ක්‍රියාවක් යන්න ය. තවදුරටත් ගුරු ප්‍රතිචාර අවධාරණය කර ඇත්තේ ඉතිහාස පෙළපොත් සිංහල ජනවර්ගයට පක්ෂපාතී ව හා බෞද්ධාගමට අනුගත වන පරිදි දැඩි ලෙස ව්‍යූහගත කර ඇති බවයි. සිසු ප්‍රතිචාර ද ඉතිහාසය ඉගැන්වීම පක්ෂග්‍රාහී බව අනාවරණය කරයි. එහි දී මුස්ලිම් සිසුන්ට වඩා දෙමළ සිසුන් වැඩි ප්‍රමාණයක් එම අදහස ප්‍රකාශ කර ඇති බව ඔවුන් සඳහන් කරන අතර, එම පර්යේෂණයෙන් යෝජනා කෙරෙනුයේ තිරසර සාමය ගොඩ නැගීම සඳහා විධිමත් අධ්‍යාපනයේ පුළුල් ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව සහ ජනවාර්ගික සංහිඳියාවේ පරමාදර්ශයට ආගමික සංහිඳියාව ද ඇතුළත් ස්ථානයකට මාරු විය යුතු බව ය (Duncan & Cardozo, 2017).

නිගමන සහ යෝජනා

- ඉතිහාසය විෂයමාලාව හා පෙළපොත, සාමූහික මතකය ගොඩ නැගීම සඳහා භාවිත කළ හැකි ප්‍රධාන මාධ්‍යයක් වන අතර එය තරුණ පරම්පරාවේ ජාතික, සමාජීය සහ සංස්කෘතික පරිකල්පනය හැඩ ගස්වන්නකි. ඒ අනුව ඉතිහාසය විෂයය ඉගෙනීමෙන් සිසුන්ට ඔවුන් කවුරුන් ද යන්න හඳුනා ගැනීමට අවස්ථාව උදා වන අතර ම අතීත පාඩම්වලින් අනාගතය හැඩ ගස්වා ගත හැකි ය. එසේ වුව ද ඉතිහාසය පෙළපොත්වල

ජනවර්ග සංකල්පය නියෝජනය පිළිබඳ සාහිත්‍ය සමාලෝචනයේ දී සුළු ජාතීන් ප්‍රමාණවත් පරිදි නිරූපණය වී නොමැත.

- බහු සංස්කෘතික රටක සමාජ සහජීවනය අතිශය වැදගත් සාධකයක් වුවත් ඉතිහාසය පෙළපොතින් සමාජ සහජීවනයට ආමන්ත්‍රණ කර නොමැත.
- ඉහත පර්යේෂණවලින් සුළු ජාතික නියෝජනය අවම බව නිගමනය වුව ද ප්‍රධාන ජාතීන් තුන පිළිබඳ ව ම කරුණු, තොරතුරු සහ රූප මගින් ද ඉදිරිපත් කර ඇති අතර ම ඔවුන් සමාජ හා ආගමික සහජීවනයෙන් අතීතයේ ජීවත් වී ඇති බවට ද පර්යේෂණ සාක්ෂි අනාවරණය කරයි.
- ඉතිහාසය පෙළපොත සංවර්ධනය කිරීමේ දී සමාජ සහජීවනය ඇති කළ හැකි ඓතිහාසික සිද්ධි විචක්ෂණශීලී ව අන්තර්ගත කිරීමෙන් සියලු ජාතීන්ට අගතියක් නො වන අයුරින් ඉතිහාස කතන්දරය ඇතුළත් කළ හැකි ය.
- විශ්ලේෂිත පර්යේෂණ ලිපි අතරින් සියලු පර්යේෂණ ලිපි පෙළපොත් අන්තර්ගතය පමණක් ම හෝ අදහස් ලබා ගැනීමට පමණක් ලෙස එක් දිශාවකට දිශානුගත වී ගැටලුවට විසඳුම් සෙවීමට යොමු වී ඇති අතර ක්‍රියාත්මක තලයේ ස්වභාවය හඳුනා ගැනීමට හෝ විෂය විශේෂඥ අදහස් ලබා ගනිමින් ගැටලුවට ආමන්ත්‍රණය කර නොමැත. ඒ අනුව විද්‍යාර්ථයින් විවිධ පර්යාලෝක පිළිබඳ අවධානය යොමු කරමින් ශ්‍රී ලාංකික ඉතිහාස පෙළපොතෙහි ජනවර්ග නිරූපණය පිළිබඳ අනාගත පර්යේෂණකරණයේ නියැළීම අවශ්‍ය වේ.

ආශ්‍රිත ග්‍රන්ථ

ජාතික අධ්‍යාපන ආයතනය (2017). *ඉතිහාසය 9 ශ්‍රේණිය ගුරු අත්පොත.* මහරගම: සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව.

පුෂ්පකුමාර, කේ. ඒ. එන්. (2020). *ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාවන් ඇති කිරීම සඳහා ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපන විෂයයේ දායකත්වය.* අප්‍රකාශිත අධ්‍යාපන දර්ශනසූරි නිබන්ධය, කොළඹ විශ්වවිද්‍යාලය

සමරසිංහ, සී. (2014). *පෙළපොත්. In: ශ්‍රී ලංකා අධ්‍යාපනයේ දශක හතරක විකාශනය (1969-2009).* මහරගම: පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

Dissanayake, N. D. (2020). *The analysis of ethnic factor as represented in grade 10 History textbook in Sri Lanka. Sri Lankan Journal of Education Research.* Vol. (15), 16-43. Department of Research & Development, NIE.

Duncan, R., & Cardozo, L. M. (2017). *Reclaiming reconciliation through community education for the Muslims and Tamils of post-war Jaffna,* Sri Lanka. *Research in Coparative Education.* (12) 1, 76-94. https://www.ncbi.nlm. nih.gov/pmc/ articles/ PMC5477834/ Retrieved 2024.07.01

Gaul, A. (2014). Where are the minorities? *The elusiveness of multiculturalism and positive recognition in Sri Lankan history*

textbooks. Journal of Educational Media, Memory, and Society, 6(2), 87-105.

Gaul, A. (2017). *Security, sovereignty, patriotism - Sinhalese nationalism and the state in Sri Lankan History Textbooks. Ethnopolitics*, 16(2), 161-178.

Jayawardena, K. (1987). *Ethnic conflict in Sri Lanka and regional security.* Asia: Militarization and regional conflict, 144.

Little, A. W. (2010). *Education, conflict, and social cohesion*. Springer.

Nanayakkara, N. I. (2017). *History curricula for national reconciliation: An analysis of history textbooks in secondary schools in Sri Lanka*. e-Repository, Research and Publication, Sri Lanla: University of Colombo. http:// archive. cmb.ac.lk: 8080/research/handle/70130/4561 Retrieved 2024.07.01

Uyangoda, J. (2007). *Ethnic conflict in Sri Lanka: Changing dynamics.* Washington: East West Center.

Yi Huang, H., & Lin Chen, H. (2019). *Constructing collective memory for (de) colonization: Taiwanese images in History textbook,* 1950-1987. Paedagogica Historica, 55:1,101-120, *International Journal of the History of Education.*

SRI LANKAN JOURNAL OF EDUCATIONAL RESEARCH

Sri Lankan Journal of Educational Research 2024
Volume 17, Pages 58– 72
Department of Research and Development

අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා

කුමාර, ඩී. එල්. ආර්. ඒ.
ජාතික අධ්‍යාපන ආයතනය.
ruwanecon@gmail.com

සංක්ෂිප්තය: *අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා පරීක්‍ෂා කිරීම හා අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාධක පරීක්ෂා කිරීම යන පර්යේෂණ අරමුණු පදනම් කර ගෙන අධ්‍යයනය ප්‍රමාණාත්මක පර්යේෂණ සුසමාදර්ශය ඔස්සේ කරන ලදි. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයෙහි නියැදි සමීක්‍ෂණ පර්යේෂණ ක්‍රමය පර්යේෂණයට යොදා ගැනිණි. අහඹු නියැදි ක්‍රමය අනුව සබරගමුව පළාතේ කෑගල්ල අධ්‍යාපන කලාපයේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන සිසුන් 100 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගත් අතර, දත්ත රැස් කිරීමට සිසු ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදි. විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයට ගෙන දත්ත විශ්ලේෂණය කෙරිණි. අධ්‍යයන අනාවරණ අනුව කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා සිසුන් සංඛ්‍යාව ක්‍රමානුකූල ව පහළ වැටී ඇත. අ.පො.ස (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ශිෂ්‍යයන් සංඛ්‍යාවට සාපෙක්ෂ ව ඉහළ අගයක් ගනී. අ.පො.ස (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා සිසුන් වැඩි පිරිසක් සිටින්නේ ජාතික පාසල්වල වන අතර අඩු පිරිසක් සිටින්නේ 1C පාසල්වල ය. ග්‍රාමීය පාසල්වල අ.පො.ස (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගත් සිසුන් පහළ වැටී ඇති ප්‍රතිශතය නාගරික පාසල්වලට සාපෙක්ෂ ව ඉහළ අගයක් ගනී. සමාජ පන්තිය, අ.පො.ස (සා.පෙ.) විභාගයේ ගණිත විෂයයට ලබා ඇති සම්මාන සාමර්ථ්‍යය, විෂයයට පවතින කැමැත්ත, අනාගත අපේක්ෂණ හා ආර්ථික විද්‍යාවට ඉහළ Z අගයක් පැවතීම යන සාධක අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාධක දෙමාපියන්ගේ බලපෑම, පාසලෙන් ලබා දුන් උපදෙස්, මිතුරන්ගේ බලපෑම හා ජනමාධ්‍ය යන සාධක අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බල නොපාන සාධක ලෙසත් අනාවරණ කර ගත හැකි විය.*

මුඛ්‍ය පද: ***අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව, ආර්ථික විද්‍යාව, විෂය තෝරා ගැනීම***

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ලෙස කොටස් දෙකකට වෙන් කරනු ලැබේ (අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, 1999). මෙයින් ද්විතීයික අධ්‍යාපනය කණිෂ්ඨ ද්විතීයික හා ජ්‍යෙෂ්ඨ ද්විතීයක ලෙස ප්‍රධාන අදියර දෙකකි. කණිෂ්ඨ ද්විතීයික අදියරට පාසල් අධ්‍යාපනයේ 6 වන ශ්‍රේණියේ සිට 9 වන ශ්‍රේණිය දක්වා ඉගෙනීමේ නිරත සිසුන් අයත් වන අතර ජ්‍යෙෂ්ඨ ද්විතීයික අදියරට පාසල් අධ්‍යාපනයේ 10 වන ශ්‍රේණිය සිට 13 වන ශ්‍රේණිය දක්වා සිසුහු අයත් වෙති (අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, 1999). ඒ අනුව අ.පො.ස. (උ.පෙ.) සිසුහු ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන කාණ්ඩයට අයත් වෙති. අ.පො.ස. (උ.පෙ.) විෂය ධාරා අතරින් පැරණි ම විෂය කාණ්ඩය ලෙස කලා විෂය ධාරාවයි. මෙම විෂය ධාරාවට විෂයයන් 24ක් (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2012) ඇතුළත් වන අතර, ඒ යටතේ භාෂා, සෞන්දර්ය විෂය, ආගම් හා සමාජීය විද්‍යා ලෙස පොදු විෂය කාණ්ඩ කිහිපයකි (අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, 1999).

භාෂා විෂය යටතට සිංහල භාෂාව, දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව, ප්‍රංශ භාෂාව, ජපන් භාෂාව, චීන භාෂාව, හින්දි භාෂාව සහ රුසියන් භාෂාව යන භාෂා අයත් වේ. ආගම් ලෙස බෞද්ධ ආගම, හින්දු ආගම, ක්‍රිස්තියානි ආගම සහ මුස්ලිම් ආගම ඇතුළත් කර ඇත. සමාජීය විද්‍යා ලෙස ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව සහ තර්ක ශාස්ත්‍රය යන විෂය ඇතුළත් වේ. සෞන්දර්ය විෂයයන් ලෙස චිත්‍රකලාව, නර්තනය, පෙරදිග සංගීතය, අපරදිග සංගීතය සහ නාට්‍ය හා රංගකලාව යන විෂයයන් දැක්විය හැකි ය (අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, 1999). කලා විෂය ධාරාව යටතේ ඉහත දක්වූ සෑම විෂයයක් ම අධ්‍යයනය කිරීම වැදගත් වන අතර මෙම විෂය අතරින් ආර්ථික විද්‍යාව විෂයය අධ්‍යයනය පුද්ගලයන්ට හා සමාජයට ඉතා වැදගත් වේ.

සමාජීය විද්‍යා විෂය මිනිසුන් සමාජයේ හැසිරෙන ආකාරයට විවිධ දෘෂ්ටිකෝණවලින් අධ්‍යයනය කරනු ලබන අතර, මිනිසුන්ගේ ආර්ථික හැසිරීම් පිළිබඳ අධ්‍යයනය කෙරෙන ආර්ථික විද්‍යාව සමාජීය විද්‍යා විෂය අතරින් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි (අතපත්තු, 2009). සමාජයක ජීවත් වන සෑම පුද්ගලයකු ම කටයුතු කරන්නේ තම අවශ්‍යතා වුවමනා ඉටු කර ගැනීමට ය. මෙම වුවමනා අසීමිත වන අතර එම වුවමනා සාක්ෂාත් කර ගැනීමට පවතින සම්පත් සීමා සහිත වේ. මෙලෙස සීමිත සම්පත් තුළින් අසීමිත මිනිස් වුවමනා ඉටු කර ගැනීමට කටයුතු කරන ආකාරයට අධ්‍යයනය කිරීම ආර්ථික විද්‍යාව විෂයයෙන් සිදු වේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). මේ නිසා මිනිස් ජීවිතයට ඉතා සමීප විෂයයක් ලෙස ආර්ථික විද්‍යාව හැඳින්විය හැකි ය (අතපත්තු, 2009).

2016 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 4.4%ක් වන අතර එම අගය 7% දක්වා වර්ධනය කර ගැනීම ශ්‍රී ලංකා රජයේ අභිප්‍රාය විය (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2016). මේ සඳහා ආර්ථික වර්ධනයට සක්‍රිය ව දායක වන පුරවැසියන් අවශ්‍ය වේ. එමෙන් ම යහපත් ආකල්ප හා ප්‍රායෝගික කුසලතා ඇති පුරවැසියන් රටේ තිරසර සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන අතර ඒ සඳහා රජය විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටී (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2016). දැනුම, ආකල්ප හා කුසලතාවලින් හෙබි තාර්කික පුරවැසියකු ලෙස ශ්‍රී ලංකා ආර්ථිකයේ සංවර්ධන කාර්යයට දායක වීමට හැකි පුරවැසියන් බිහි කිරීම ආර්ථික විද්‍යා විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණයි (ජාතික අධ්‍යාපන ආයතනය, 2017).

අධ්‍යයන ගැටලුව

අ.පො.ස. (උ.පෙ.) කලා, වාණිජ, සහ තාක්ෂණික විෂයධාරා අතර පවතින ඉතා වැදගත් ප්‍රායෝගික විෂයයක් ලෙස ආර්ථික විද්‍යාව හැඳින්විය හැකි ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2017). නමුත් පසුගිය වසර කිහිපය තුළ දී සමස්තයක් ලෙස අ.පො.ස. (උ.පෙ.) උක්ත විෂයධාරා යටතේ ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස තෝරා ගන්නා ශිෂ්‍යයින් සංඛ්‍යාව අඩු වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. 2017 වර්ෂයේ දී අ.පො.ස. (උ.පෙ.) විභාගයට ආර්ථික විද්‍යාව විෂයයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 74647කි (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2014). එම සිසුන් සංඛ්‍යාව 2012 වර්ෂයේ දී 66310 දක්වා අඩු වී නැවත 2013 වර්ෂයේ දී 74667 ලෙස වර්ධනය වී නැවත ක්‍රමයෙන් අඩු වී 2017 වර්ෂය එම සිසුන් සංඛ්‍යාව 64591 ලෙස පෙන්නුම් කරයි (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2014). ඒ අනුව අ.පො.ස. (උ.පෙ.) විභාගයට ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස තෝරා ගන්නා සිසුන් ප්‍රමාණය අඩු වී ඇත.

අ.පො.ස. (උ.පෙ.) කලා විෂයධාරා යටතේ පවතින වැදගත් සහ ප්‍රායෝගික විෂයයක් ලෙස ද ආර්ථික විද්‍යාව විෂයය හඳුනා ගත හැකි ය. එම විෂය ධාරාව

යටතේ ද ආර්ථික විද්‍යාව විෂයය සිසුන් තෝරා ගැනීමේ ප්‍රවණතාවෙහි අඩු වීමක් ඒ පිළිබඳ විමසා බැලීමේ දී නිරීක්ෂණය විය. 2010 වර්ෂයේ දී අ.පො.ස. (උ.පෙ.) විභාගයට කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව විෂයයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 18447ක් වන අතර එය ක්‍රමයෙන් අඩු වී 2017 වර්ෂයේ දී එම සිසුන් සංඛ්‍යාව 8018ක් වී ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන් අ.පො.ස. (උ.පෙ.) විෂය ධාරා යටතේ සිසුන් ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස තෝරා ගැනීම සැලකිය යුතු මට්ටමකින් අඩු වීම, ගැටලුකාරී තත්ත්වයකි. මෙම ගැටලුවට හේතු සාධක පිළිබඳ ව පරීක්ෂා කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය කරන ලදි.

අධ්‍යයනයේ වැදගත්කම

එක් එක් සමාජය මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය ඒ අනුව බිහි වී ඇති ආර්ථික පද්ධති පිළිබඳ අධ්‍යයනය ආර්ථික විද්‍යාව විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණකි (ජාතික අධ්‍යාපන ආයතනය, 2017). මේ නිසා ආර්ථික විද්‍යාව විෂය අධ්‍යයනය සිසුන්ට වැදගත් වේ.

විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වන සිසුන් විෂය තෝරා ගැනීමේ දී ඔවුන් ලබා ගන්නා සාමර්ථ්‍ය සේ ම ඔවුන් උපයා ගත් Z අගය ද ඉතා වැදගත් වේ (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2017). අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ පවතින විෂයයන් අතරින් ඉහළ Z අගයක් ආර්ථික විද්‍යා විෂයයට හිමි වන බැවින් (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, 2017), වෙනත් විෂයයක් තෝරා ගන්නවා වෙනුවට ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා සිසුවකුට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට වැඩි අවස්ථාවක් හිමි වේ. එබැවින් අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ඉගෙනීමේ නිරත සිසුන්ට ආර්ථික විද්‍යාව විෂයය ඉතා වැදගත් වේ.

මෙම විෂයයේ දී අධ්‍යයනය කෙරෙන සූක්ෂ්ම හා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාජ්‍ය පාලනයේ දී ප්‍රායෝගික ව වැදගත් වේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). එබැවින් මෙම අධ්‍යයනය, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකයින්ට, ගුරුවරුන් මෙන් ම සිසුන්ට ද ඉතා වැදගත් වේ.

න්‍යායාත්මක පසුබිම

විෂය තෝරා ගැනීම සම්බන්ධ ව වන විවිධ න්‍යාය පවතින අතර මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් එලී ගින්ස්බර්ගේ තේරීමේ න්‍යාය පිළිබඳ ව සලකා බැලිනි. එම න්‍යායය වෘත්තීය තේරීම්වලට මෙන් ම විෂය තේරීමේ න්‍යායයක් ලෙස ද හැඳින්වේ. Anake ඇතුළු පිරිස (2018) දක්වන පරිදි එලි ගින්ස්බර්ගේ අනුව වෘත්තීය නො වන විෂයයක් තේරීම දිගු කාලීන ක්‍රියාවලියකි. උක්ත න්‍යායයට අනුව වෘත්තීය තේරීම අදියර තුනක් යටතේ සිදු වේ.

- අවුරුදු 1 - 11ත් අතර - මනඃකල්පිත තේරීම් සිදු කරන අවධිය
- අවුරුදු 11 - 17ත් අතර - අත්හදා බැලීමෙන් තේරීම් කරන අවධිය
- අවුරුදු 17න් පසු ව - යථාර්ථය තේරුම් ගෙන තේරීම් කරන අවධිය

ඉහත කරුණු පාදක ව අවුරුදු 11 - 17 අතර සිසුහු අත්හදා බැලීමෙන් තේරීම් සිදු කරති. අ.පො.ස. (උ.පෙ.) හදාරණ සිසුන්ගේ වයස සාමාන්‍යයෙන් අවුරුදු 16ට වැඩි ය (අධ්‍යාපන අමාත්‍යාංශය, 2020). ඒ අනුව අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ සිසුන් ද විෂයයන් තෝරා ගනු ලබන්නේ අත්හදා බැලීමෙන් වන අතර විෂයයේ යථා ස්වභාවය පිළිබඳ ඔවුන්ට ඇත්තේ අඩු අවබෝධයකි. මේ නිසා

සිසුන් විෂයයන් තෝරා ගැනීමේ දී ගුරුවරුන් සහ දෙමාපියන් සිසුන්ට සහාය දැක්විය යුතු ය.

අධ්‍යාපන මනෝවිද්‍යාව අනුව අවුරුදු 16 - 17 අතර සිසුන් අයත් වන්නේ නව යොවුන් වියට (අතුකෝරළ සහ අතුකෝරළ, 1990) වන අතර අ.පො.ස. (උ.පෙ.) හදාරන සිසුන් අයත් වන්නේ නව යොවුන් වියටයි. පියාජේ බුද්ධි වර්ධන න්‍යායය අනුව අවුරුදු 11 - 18 අතර ළමයින් අයත් වන්නේ විධිමත් ක්‍රියාකාරී චින්තන අවධියට ය (අබේපාල, 2010). ඒ අනුව මෙම අධ්‍යයනයට පාත්‍ර වන සිසුන් අයත් වන්නේ විධිමත් ක්‍රියාකාරී චින්තන අවධියටයි. ළමා විය ඉක්මවා වැඩි වියට පත් වන සංක්‍රාන්ති සමයක් ලෙස මෙම අවධිය හැඳින්විය හැකි අතර වැඩිහිටියකු බවට පත්වීමට අවශ්‍ය කායික වර්ධනය මෙන් ම මානසික වර්ධනය ද මෙම අවධියේ දී සිදු වේ. පියාජේගේ බුද්ධි වර්ධන න්‍යායය අනුව කායික වර්ධනය මෙන් ම වියුක්ත චින්තන හැකියාව ද මෙම අවධියේ දී පහළ වේ (අබේපාල, 2010). එම නිසා මෙම අවධියේ සිසුන් වගකීම් ගැනීම හා ස්වාධීන ව කටයුතු කිරීමට වැඩි කැමැත්තක් දක්වන අතර ඔවුන්ගේ බහුවිධ චින්තනය හා තර්කනය වර්ධනය වේ. ඒ අනුව අ.පො.ස. (උ.පෙ.) විෂයයක් තෝරා ගැනීමේ දී එම සිසුන් ද ඔවුන්ගේ කැමැත්ත, ස්වාධීනත්වය අනුව තේරීම කරයි.

සාහිත්‍යය විමර්ශනය

Whiteley සහ Porter (1998) පාසල්වල සිසුන් පිළිබඳ අධ්‍යයනයක් කරමින් විෂය තේරීමට බලපාන සාධක පෙන්වා දී ඇත.

1. පුද්ගලික සාධක
2. සමාජ සාධක
3. මිතුරන්ගේ බලපෑම
4. පාසල් පරිසරය
5. බාහිර අත්දැකීම්
6. පාරිසරික සාධක

ඒ අනුව අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව තෝරා ගැනීම සඳහා ද ඉහත සාධකවල බලපෑම් සිදු විය හැකි බැවින් එම සාධක පිළිබඳ ව ද මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරිණි.

Rodeiro (2007) එංගලන්තයේ අ.පො.ස. (උ.පෙ.) සිසුන් විෂය තෝරා ගැනීම බලපාන සාධක පිළිබඳ කරන ලද අධ්‍යයනයේ දී පහත සඳහන් සාධක සිසුන්ගේ විෂයයක් තේරීමට බලපාන බව අනාවරණය කර ගෙන ඇත.

1. හැකියාව
2. ආචාර ධර්ම
3. සමාජ පන්ති
4. පාසල් වර්ගය

ඉහත ඉදිරිපත් කර ඇති උසස් පෙළ විෂයයක් තේරීම සඳහා බලපාන හේතු සාධක, කලා විෂය ධාරාවේ සිසුන්ට ද පොදුවේ බලපාන සාධක ලෙස මෙම පර්යේෂණයට යොදා ගත හැකි ය.

Jin ඇතුළු පිරිස (2010) එංගලන්තයේ අවු 14 - 16 අතර ළමයින් විෂය තෝරා ගැනීම සහ පාඨමාලා තෝරා ගැනීම පිළිබඳ ව කරන ලද පර්යේෂණයට අනුව ඉහළ ආදායම් ලබන පවුල්වල සිසුහු වැඩි වශයෙන් විද්‍යා විෂයයන් තෝරා

ගැනීමට වැඩි කැමැත්තක් දක්වති. එසේ ම වයස අවුරුදු 9ට වැඩි ළමයි අනාගතය පිළිබඳ ව හොඳ දැක්මක් ඇති ව කටයුතු කරන අතර අනගතයේ තමා කිරිමට බලාපොරොත්තු වන වෘත්තියට ගැළපෙන පාඨමාලා හා විෂයයන් තෝරා ගනිති. මෙහි සඳහන් කරන පරිදි පුද්ගල ආදායම් මට්ටම හා විෂයයන් තෝරා ගැනීම අතර සම්බන්ධයක් පවතී. එම කරුණු මෙම පර්යේෂණයට දායක කර ගත හැකි බැවින් ඒ පිළිබඳ ව ද අවධානය යොමු කරන ලදි.

පර්යේෂණ ක්‍රමවේදය

1. අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා පරීක්‍ෂා කිරීම
2. අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාධක පරීක්ෂා කිරීම

අධ්‍යයනය ප්‍රමාණාත්මක පර්යේෂණ සුසමාදර්ශය ඔස්සේ නියැදි සමීක්‍ෂණ පර්යේෂණ ක්‍රමය යටතේ ක්‍රියාත්මක කෙරිණි. පර්යේෂණ පිරිසැලසුම 1 වන වගුවෙහි දැක්වේ.

පර්යේෂණයේ සංගහනය වූයේ ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යාව හදාරන සියලු ම සිසුන් ය. 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල අ.පො.ස. (උ.පෙ.) සමත් සිසුන් ප්‍රමාණයේ සාමාන්‍ය අගය මුළු සිසුන් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස 12.3%කි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2017). 2012 වර්ෂයේ දී කොළඹ, මුලතිව් හා කැගල්ල දිස්ත්‍රිකවල අ.පො.ස. (උ.පෙ.) සමත් සිසුන් ප්‍රමාණයේ සාමාන්‍ය අගය මුළු සිසුන් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් 18%ක්. 6%ක් හා 12.%කි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2017). මේ අනුව කැගල්ල දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උ.පෙ.) සමත් සිසුන් ප්‍රමාණයේ සාමාන්‍ය අගය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල අ.පො.ස. (උ.පෙ.) සමත් සිසුන් ප්‍රමාණයේ සාමාන්‍ය අගයට ආසන්න අගයක් ගෙන ඇත. එබැවින් මෙම පර්යේෂණයේ ඉලක්ක සංගහනය වූයේ සබරගමුව පළාතේ කැගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 ශ්‍රේණියේ පන්තිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන් 125කි.

1 වන වගුව

පර්යේෂණ පිරිසැලසුම

පර්යේෂණ අරමුණු	දත්ත මූලාශ්‍රය	දත්ත ලබා ගන්නා ආකාරය	දත්ත ලබා ගන්නා මිනුම් උපකරණ
1. අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා පරීක්‍ෂා කිරීම	1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව 2. කැගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 වන ශ්‍රේණියේ පන්තිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන් 100ක නියැදිය	1. ලේඛනගත වාර්තා 2. ප්‍රශ්නාවලි	1. ලේඛනගත වාර්තා 2. සිසු ප්‍රශ්නාවලිය

2. අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාධක පරීක්‍ෂා කිරීම	1. කෑගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 වන ශ්‍රේණියේ පංතිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන් 100ක නියැදිය	1. ප්‍රශ්නාවලි 2. ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා	1. සිසු ප්‍රශ්නාවලිය 2. ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලය

Krejcie & Morgan (1970) ඉදිරිපත් කරන පරිදි මොර්ගන් වගුව අනුව පර්යේෂණයේ ඉලක්ක සංගහනය 500ට වඩා අඩු නම් ඉලක්ක සංගහනයෙන් 80% වන ලෙස නියැදිය තෝරා ගත යුතු ය. ඒ අනුව නියැදිය සඳහා සබරගමුව පළාතේ කෑගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 වන ශ්‍රේණියේ පන්තිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන් 100ක් අහඹු නියැදිකරණය යටතේ තොරා ගන්නා ලදි. එහි දී පාසල් වර්ගය (ජාතික පාසල්, 1 AB, 1 C) සහ පාසල්හි ග්‍රාමීය - නාගරික ස්වභාවය, ආවරණය වන පරිදි නියැදිය තෝරා ගැනීමට සැලකිලිමත් විය (2 වන වගුව).

2 වන වගුව

පර්යේෂණ නියැදිය

ග්‍රාමීය පාසල්වල සිසුන් ගණන - 33	ජාතික පාසල්වල සිසුන් ගණන	15
	1 AB පාසල්වල සිසුන් ගණන	09
	1 C පාසල්වල සිසුන් ගණන	09
නාගරික පාසල්වල සිසුන් ගණන - 67	ජාතික පාසල්වල සිසුන් ගණන	53
	1 AB පාසල්වල සිසුන් ගණන	14
	1 C පාසල්වල සිසුන් ගණන	0
නියැදියට අයත් මුළු සිසුන් ගණන		100

දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස ප්‍රශ්නාවලි සහ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලයක් භාවිතයට ගත් අතර ද්විතීයික දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස ලේඛන වාර්තා භාවිත කෙරිණි. අධ්‍යයනයේ පළමුවන පර්යේෂණ අරමුණ වන කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා පරීක්ෂා කිරීමට අවශ්‍ය දත්ත කෑගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 වන ශ්‍රේණියේ පන්තිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන්ට ලබා දුන් ප්‍රශ්නාවලියෙන් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්තා මගින් ලබා ගන්නා ලදි.
දෙවන පර්යේෂණ අරමුණ වන කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාධක පරීක්‍ෂා කිරීමට කෑගල්ල කලාපයේ කලා විෂය ධාරාව යටතේ 13 වන ශ්‍රේණියේ පන්තිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන්ට ලබා දුන් ප්‍රශ්නාවලිය හා ව්‍යුහගත සිසු සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලය භාවිතයෙන් දත්ත ලබා ගැනිණි.

සිසු ප්‍රශ්නාවලිය හා ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලය සකස් කිරීමේ දී Whiteley සහ Porter (1998) දී ඉදිරිපත් කරන ලද පාසල්වල සිසුන් විෂයයන් තේරීමට බලපාන සාධක හා Rodeiro (2007) දී එංගලන්තයේ අ.පො.ස. (උ.පෙ.) සිසුන් විෂයයන් තෝරා ගැනීම බලපාන සාධක අදාළ කර ගත් නිසා දත්තවල වලංගුතාව ආරක්ෂා වන ලදි. දත්තවල නිර්වද්‍යතාව ආරක්ෂා කිරීමට මහරගම පාසලක කලා විෂය ධාරාව යටතේ 13 ශ්‍රේණියේ පංතිවල ආර්ථික විද්‍යාව හදාරන සිසුන් පස් දෙනෙකු යොදා ගෙන සිසු ප්‍රශ්නාවලිය හා ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලය පිළිබඳ ව පෙර පරීක්ෂණයක් පවත්වන ලදි.

දත්ත ඉදිරිපත් කිරීම විශ්ලේෂණය හා අර්ථකථනය

අ.පො.ස (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමේ ප්‍රවණතා

කෑගල්ල අධ්‍යාපන කලාපයේ පාසල්වල 2014 වර්ෂයේ දී කලා විෂය ධාරාව යටතේ විෂයය තෝරා ගත් සිසුන් ප්‍රමාණය 195කි. නමුත් 2014 වර්ෂයට සාපේක්ෂ ව 2015, 2016, 2017 හා 2018 වර්ෂවල දී ප්‍රතිශතාත්මක ව එම අගය පහළ වැටී ඇත. එය 3 වන වගුවෙන් නිරූපණය වේ.

3 වන වගුව

විෂයය තෝරා ගත් සිසුන් ගණන ප්‍රතිශතාත්මක ව වෙනස් වන ආකාරය

වර්ෂය	විෂය තෝරා ගත් සිසුන් ගණන	සිසුන් ප්‍රතිශතාත්මක ව වෙනස් වී ඇති ආකාරය
2014	195	
2015	165	-15.38%
2016	166	-14.87%
2017	143	-26.66%
2018	125	-35.89%

කෑගල්ල අධ්‍යාපන කලාපයේ පාසල්වල 2014 වර්ෂයේ දී කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගත් මුළු සිසුන් සංඛ්‍යාව 195ක් වූ අතර ශිෂ්‍යාවන් සංඛ්‍යාව 119ක් සහ ශිෂ්‍යයින් ප්‍රමාණය 76කි. පුම්තිරිභාවය අනුව විෂයය තෝරා ගත් සිසුන් ප්‍රමාණය අඩු වී ඇති ප්‍රතිශත 4 වන වගුවේ දැක්වේ. ඒ අනුව 2014 වර්ෂයට සාපෙක්ෂ ව 2018 වර්ෂය වන විට ශිෂ්‍යාවන්ට වඩා ශිෂ්‍යයින් 50%ක ප්‍රතිශතයක් විෂයය තෝරා ගැනීම පහළ වැටී ඇත.

2014 වර්ෂයේ දී ජාතික පාසල්වල කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගත් සිසුන් ප්‍රමාණය 109ක්, 1AB පාසල්වල සිසුන් ප්‍රමාණය 77ක් සහ 1C පාසල්වල සිසුන් 09ක් වශයෙන් විය. පාසල් වර්ගය අනුව විෂයය තෝරා ගන්නා සිසුන්ගේ ප්‍රවණතා 5 වන වගුවෙහි දක්වා ඇත. ඒ අනුව 2014 වර්ෂයට සාපෙක්ෂ ව 2018 වර්ෂය වන අධ්‍යයනය කරන සිසුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විෂයය තෝරා ගැනීම පහළ වැටී ඇත්තේ 1AB පාසල්වල ය. 1C පාසල්වල කලා විෂය ධාරාව යටතේ අධ්‍යයනය කරන සිසුන්ගෙන් විෂයය තෝරා ගැනීම ප්‍රතිශතාත්මක ව වර්ධනය වුව ද 2018 වර්ෂයේ දී සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රතිශතාත්මක ව පහළ වැටී ඇත. නමුත් 2018 වර්ෂය වන විට එය නැවතත් 2014 වර්ෂයේ අගය දක්වා පහළ වැටී ඇත.

4 වන වගුව

ප්‍රමිතිරි භාවය අනුව විෂයය තෝරා ගැනීම

වර්ෂය	විෂය තෝරා ගත් ශිෂ්‍යාවන් ගණන	වෙනස් වී ඇති ප්‍රතිශතය	විෂය තෝරා ගත් ශිෂ්‍යයින් ගණන	වෙනස් වී ඇති ප්‍රතිශතය
2014	119	-	76	-
2015	99	16.8%	66	13.15%
2016	103	13.44%	63	17.10%
2017	89	25.21%	54	28.94%
2018	87	26.8%	38	50%

5 වන වගුව

පාසල් වර්ගය අනුව විෂයය තෝරා ගත් සිසුන් වෙනස් වී ඇති ප්‍රතිශතය

වර්ෂය	ජාතික පාසල්වල සිසුන් ගණන	වෙනස් වී ඇති ප්‍රතිශතය	1AB පාසල්වල සිසුන් ගණන	වෙනස් වී ඇති ප්‍රතිශතය	1C පාසල්වල සිසුන් ගණන	වෙනස් වී ඇති ප්‍රතිශතය
2014	109	-	77	-	09	-
2015	90	-17.43%	60	-22%	15	66.66%
2016	96	-11.9%	54	-29.87%	16	77.77%
2017	85	-22%	39	-49.35%	19	111%
2018	83	-23.85%	33	-57.14%	09	0%

2014 වර්ෂයේ දී කෑගල්ල අධ්‍යාපන කලාපයේ ග්‍රාමීය පාසල්වල කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා සිසුන් ප්‍රමාණය 135ක් වූ අතර නාගරික පාසල්වල එම ප්‍රමාණය 60කි. ග්‍රාමීය සහ නාගරික පාසල් වර්ගය අනුව විෂයය තෝරා ගත් සිසුන් වෙනස් වී ඇති ප්‍රතිශත 6 වන වගුවෙන් නිරූපිත ය. 2014 වර්ෂයට සාපෙක්ෂ ව 2015 හා 2016 වර්ෂවල දී නාගරික පාසල්වල විෂයය තෝරා ගත් සිසුන් ප්‍රතිශතය 5.92%කින් වර්ධනය වී ඇති අතර 2017 හා 2018 වර්ෂවල දී එම ප්‍රතිශතය පහළ වැටී ඇත. ග්‍රාමීය පාසල් අනුව ආර්ථික විද්‍යා විෂයය තෝරා සිසුන් ප්‍රතිශතය 2014 වර්ෂයට සාපෙක්ෂ ව 2015, 2016, 2017 හා 2018 වර්ෂවල දී පිළිවෙළින් 11.66%, 16.66%, 28.33% හා 56.66%කින් පහළ වැටී ඇත.

6 වන වගුව

ග්‍රාමීය සහ නාගරික පාසල් අනුව ආර්ථික විද්‍යා විෂයය තෝරා ගත් සිසුන් වෙනස් වී ඇති ප්‍රතිශතය

වර්ෂය	විෂයය තෝරා ගත් සිසුන් ගණන	නාගරික පාසල්වල සිසුන් වෙනස් වී ඇති	විෂයය තෝරා ගත් සිසුන් ගණන	ග්‍රාමීය පාසල්වල සිසුන් වෙනස්

		ප්‍රතිශතය		වී ඇති ප්‍රතිශතය
2014	135	-	60	-
2015	143	5.92%	53	-11.66%
2016	143	5.92%	50	-16.66%
2017	103	-23.7%	43	-28.33%
2018	99	-26.6%	26	-56.66%

අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපාන සාදක

1. සමාජ පන්තිය, විෂයය තෝරා ගැනීමට බලපාන ආකාරය

පර්යේෂණයට යොදා ගත් නියැදියේ සිසුන්ගෙන් දෙමාපියන් අයත් සමාජ පන්තිය පිළිබඳ දත්ත පහත දැක්වේ (1 වන රූපය). නියැදියේ සිසුන්ගෙන් දෙමාපියන් අයත් සමාජ පන්තිය අනුව 11% ප්‍රතිශතයක් ඉහළ සමාජ පන්තිය ද, 65%ක් මධ්‍යම සමාජ පන්තිය ද, 24%ක් පහළ සමාජ පන්තිය ද අයත් වේ. ඒ අනුව ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා සිසුන්ගෙන් 89%ක ප්‍රතිශතයක් ඉහළ සමාජ පන්තිවලට අයත් සිසුන් නො වන බව පැහැදිලි ය.

1 වන රූපය

සිසුන්ගෙන් දෙමාපියන් අයත් සමාජ පන්තිය



2. අ. පො. ස. (සා.පෙ.) ගණිතය විෂයට ලබා ඇති සාමර්ථ්‍යය කලා විෂය තෝරා ගැනීමට බලපාන ආකාරය

පර්යේෂණයට යොදා ගත් නියැදියේ සිසුන්ගේ අ. පො. ස. (සා.පෙ.) පෙළ ගණිතය විෂයයට ලබා ඇති සාමර්ථ්‍යය (2 වන රූපය) අනුව නියැදියේ සිසුන්ගෙන් අ. පො. ස. (සා.පෙ.) ගණිතය විෂයයට ලබා ඇති සාමර්ථ්‍යය අනුව මුළු සිසුන්ගේ A සාමර්ථ්‍යය ලබා ගත් සිසුන් ප්‍රතිශතාත්මක ව 37%ක්, B සාමර්ථ්‍යය ලබා ගත් සිසුන්

20%ක්, C සාමර්ථ්‍යය ලබා ගත් සිසුන් 19%ක්, S සාමර්ථ්‍යය ලබා ගත් සිසුන් 23%ක් සහ ගණිතය අසමත් සිසුන් 1%ක් වශයෙන් විය. උක්ත දත්ත අනුව අ.පො.ස (සා.පෙ.) විභාගයේ ගණිත විෂයයට සම්මාන සාමර්ථ්‍යය ලබා ඇති මුළු සිසු ප්‍රතිශතය 76%කි. ඒ අනුව අ.පො.ස. (සා.පෙ.) ගණිතය විෂයයට ලබා ඇති සාමර්ථ්‍යය කලා විෂය ධාරාව හදාරන සිසුන් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීමට බලපා ඇත.

2 වන රූපය

නියැදියේ සිසුන් අ. පො. ස. (සා.පෙ.) ගණිතය විෂයට ලබා ඇති සාමර්ථ්‍යය



සිසු ප්‍රශ්නාවලියේ ආර්ථික විද්‍යා විෂයය තේරීම සම්බන්ධ ව පංච ලක්ෂ්‍ය පරිමාණය යටතේ ආර්ථික විද්‍යා විෂයය තේරීමට බලපාන කරුණු 12ක් සිසුන්ට ඉදිරිපත් කරන ලදි. එහි 1 සිට 5 දක්වා අගයයන් ලබා දී රැස් කරන ලද දත්ත පරිගණක මෘදුකාංග යොදා ගෙන පහත පරිදි විශ්ලේෂණය කරන ලදි.

1. විෂයට පවතින දැඩි කැමැත්ත නිසා තෝරා ගැනීම

ආර්ථික විද්‍යා විෂයයට පවතින දැඩි කැමැත්ත නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 40%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ප්‍රතිචාර දැක්වූ අතර සිසුන් 29%ක් එකඟ වන බවට ද 24%ක් මධ්‍යස්ථ ව ද සිසුන් 7%ක් එකඟ නො වන බවට ද ප්‍රතිචාර දක්වා ඇත. එම ප්‍රතිචාරවල මධ්‍යයනය 3.96ක් වන අතර එය 4ට ආසන්න නිසා 4 වන පරිමාණය වන එකඟ වෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව ආර්ථික විද්‍යා විෂයයට පවතින දැඩි කැමැත්ත නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ වී ඇත.

2. විෂයය පහසු නිසා තෝරා ගැනීම

ආර්ථික විද්‍යා විෂයය පහසු නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 1%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ප්‍රතිචාර දැක්වූ අතර 24%ක් එකඟ වන බවට ද 44%ක් මධ්‍යස්ථ ව ද 27%ක් එකඟ නො වන බවට ද 4%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එම ප්‍රතිචාරවල මධ්‍යයනය 2.91ක් වන අතර එය 3ට ආසන්න නිසා තෙවන පරිමාණය වන මධ්‍යස්ථයි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව ආර්ථික විද්‍යා විෂයය

පහසු නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් මධ්‍යස්ථ ව අදහස් දක්වා ඇත.

3. උසස් අධ්‍යාපනයට යොමු වීමේ අරමුණින් තෝරා ගැනීම

උසස් අධ්‍යාපනයට යොමු වීමේ අරමුණින් තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 28%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 55%ක් එකඟ වන බවට ද 11%ක් මධ්‍යස්ථ ව ද 6%ක් එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. සිසුන් ලබා දුන් ප්‍රතිචාරවල මධ්‍යයනය 4.05ක් වන අතර එය 4ට ආසන්න නිසා හතර වන පරිමාණය වන එකඟ වෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව උසස් අධ්‍යාපනයට යොමු වීමේ අරමුණින් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ වී ඇත.

4. **විෂයට ඉහළ Z අගයක් පවතින නිසා තෝරා ගැනීම**

ආර්ථික විද්‍යා විෂයයට ඉහළ Z අගයක් පවතින නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 39%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 55%ක් එකඟ වන බවට ද 2%ක් මධ්‍යස්ථ ව ද 4%ක් එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එම ප්‍රතිචාරවල මධ්‍යයනය 4.2ක් වන අතර එය 4ට ආසන්න නිසා හතර වන පරිමාණය වන එකඟ වෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව ආර්ථික විද්‍යා විෂයයට ඉහළ Z අගයක් පවතින නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ වී ඇත.

5. ගුරුවරුන්ගේ උපදෙස් නිසා විෂයය තෝරා ගැනීම

ගුරුවරුන්ගේ උපදෙස් නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 4%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ප්‍රතිචාර දැක්වූ අතර සිසුන් 31%ක් එකඟ වන බවට ද 25%ක් මධ්‍යස්ථ ව ද 27%ක් එකඟ නො වන බවට ද 16%ක් එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. සිසුන් ලබා දුන් ප්‍රතිචාරවල මධ්‍යයනය 2.86ක් වන අතර එය 3ට ආසන්න නිසා තෙවන පරිමාණය වන මධ්‍යස්ථයි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව ගුරුවරුන්ගේ උපදෙස් නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් මධ්‍යස්ථ ව අදහස් දක්වා ඇත.

6. **දෙමාපියන්ගේ බලපෑම නිසා විෂයය තෝරා ගැනීම**

දෙමාපියන්ගේ බලපෑම නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 2%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 12%ක් එකඟ වන බවට ද 13%ක් මධ්‍යස්ථව ද 45%ක් එකඟ නො වන බවට ද 28%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. සිසුන් ලබා දුන් ප්‍රතිචාරවල මධ්‍යයනය 2.15ක් වන අතර එය 2ට ආසන්න නිසා දෙවන පරිමාණය වන එකඟ නොවෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව දෙමාපියන්ගේ බලපෑම නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ නොවෙමි ලෙස අදහස් දක්වා ඇත.

7. පාසලෙන් ලබා දුන් උපදෙස් නිසා විෂයය තෝරා ගැනීම

පාසලෙන් ලබා දුන් උපදෙස් නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 1%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 20%ක් එකඟ වන බවට ද 24%ක් මධ්‍යස්ථ ව ද 45%ක් එකඟ නො වන බවට ද 10%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ද ප්‍රතිචාර දක්වා ඇත. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව පාසලෙන් ලබා

දුන් උපදෙස් නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ නොවෙමි ලෙස අදහස් දක්වා ඇත.

8. මිතුරන්ගේ බලපෑම නිසා විෂයය තෝරා ගැනීම

මිතුරන්ගේ බලපෑම නිසා විෂයය තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් දැඩි ලෙස එකඟ වන බවට ප්‍රතිචාර දක්වා නැති අතර සිසුන් 2%ක ප්‍රතිශතයක් එකඟ වන බවට ද 9%ක් මධ්‍යස්ථ ව ද 43ක් එකඟ නො වන බවට ද 46%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ද ප්‍රතිචාර දක්වා ඇත. සිසුන් ලබා දුන් ප්‍රතිචාරවල මධ්‍යයනය 1.67ක් වන අතර එය 2ට ආසන්න නිසා දෙවන පරිමාණය වන එකඟ නොවෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව මිතුරන්ගේ බලපෑම නිසා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ නොවෙමි ලෙස අදහස් දක්වා ඇත.

9. අ. පො. ස. (උ.පෙ) අනෙකුත් විෂයන්වලට ගැලපෙන නිසා විෂයය තෝරා ගැනීම

අ.පො.ස (උ.පෙ.) අනෙකුත් විෂයන්වලට ගැලපෙන නිසා විෂයය තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 6%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 47%ක් එකඟ වන බවට ද 26%ක් මධ්‍යස්ථ ව ද 19%ක් එකඟ නො වන බවට ද 2%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ද ප්‍රතිචාර දක්වා ඇත. ප්‍රතිචාරවල මධ්‍යයනය 3.36කි. එය 3ට ආසන්න නිසා තෙවන පරිමාණය වන මධ්‍යස්ථයි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව අ.පො.ස (උ.පෙ.) අනෙකුත් විෂයන්වලට ගැලපෙන නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් මධ්‍යස්ථ ව අදහස් දක්වා ඇත.

10. සමාජයේ පවතින ගැටලු පිළිබඳ ව අවබෝධයක් ලැබීමේ අරමුණින් තෝරා ගැනීම

සමාජයේ පවතින ගැටලු පිළිබඳ ව අවබෝධයක් ලැබීමේ අරමුණින් තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 6%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 39%ක් එකඟ වන බවට ද 32%ක් මධ්‍යස්ථ ව ද 21%ක් එකඟ නො වන බවට ද 2%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එම ප්‍රතිචාරවල මධ්‍යයනය 3.26ක් වන අතර එය3 ට ආසන්න නිසා තෙවන පරිමාණය වන මධ්‍යස්ථයි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව සමාජයේ පවතින ගැටලු පිළිබඳ ව අවබෝධයක් ලැබීමේ අරමුණින් ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් මධ්‍යස්ථ ව අදහස් දක්වා ඇත.

11. එදිනෙදා ජීවිතයේ තීරණ ගැනීමට වැදගත් වන නිසා විෂයය තෝරා ගැනීම

එදිනෙදා ජීවිතයේ තීරණ ගැනීමට වැදගත් වන නිසා විෂයය තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 1%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ද 24%ක් එකඟ වන බවට ද 44%ක් මධ්‍යස්ථ ව ද 27%ක් එකඟ නො වන බවට ද 4%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ද ප්‍රතිචාර දක්වා ඇත. ප්‍රතිචාරවල මධ්‍යයනය 3.5ක් වන අතර එය 3ට ආසන්න නිසා තෙවන පරිමාණය වන මධ්‍යස්ථයි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව එදිනෙදා ජීවිතයේ තීරණ ගැනීමට වැදගත් වන නිසා ආර්ථික විද්‍යා විෂයය තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් මධ්‍යස්ථ ව අදහස් දක්වා ඇත.

12. ජනමාධ්‍යවලින් ආර්ථික විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කළ කරුණු නිසා තෝරා ගැනීම

ජනමාධ්‍යවලින් ආර්ථික විද්‍යාව විෂයය පිළිබඳ ඉදිරිපත් කළ කරුණු නිසා තෝරා ගැනීම යන ප්‍රකාරයට සිසුන් 5%ක ප්‍රතිශතයක් දැඩි ලෙස එකඟ වන බවට ප්‍රතිචාර දක්වා ඇති අතර 14%ක් එකඟ වන බවට ද 17%ක් මධ්‍යස්ථ ව ද 49%ක් එකඟ නො වන බවට ද 15%ක් දැඩි ලෙස එකඟ නො වන බවට ප්‍රතිචාර දක්වා ඇත. එම ප්‍රතිචාරවල මධ්‍යයනය 2.45ක් වන අතර එය 2ට ආසන්න නිසා දෙවන පරිමාණය වන එකඟ නො වෙමි යන්නට ආසන්න වේ. එම නිසා මෙම විශ්ලේෂණයට අනුව ජනමාධ්‍යවලින් ආර්ථික විද්‍යාව විෂයය පිළිබඳ ව ඉදිරිපත් කළ කරුණු නිසා තෝරා ගැනීම ප්‍රකාරයට සිසුන් එකඟ නො වන බවට අදහස් දක්වා ඇත.

නිගමන

- අ.පො.ස (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා ගන්නා සිසුන් සංඛ්‍යාව ක්‍රමානුකූල ව පහළ වැටී ඇත
- ග්‍රාමීය පාසල්වල විෂයය තෝරා ගත් සිසුන් පහළ වැටී ඇති ප්‍රතිශතය නාගරික පාසල්වලට සාපෙක්ෂ ව ඉහළ අගයක් ගනී
- විෂයය තෝරා ගන්නා ශිෂ්‍යාවන් සංඛ්‍යාව වැඩි අගයක් ගන්නා අතර තෝරා ගන්නා ශිෂ්‍යයන් සංඛ්‍යාව අඩු අගයක් ගනී
- සිසුන් වැඩි පිරිසක් සිටින්නේ ජාතික පාසල්වල වන අතර අඩු පිරිසක් සිටින්නේ 1C පාසල්වල ය
- විෂයය තෝරා ගැනීමට සමාජ පන්තිය, ආර්ථික විද්‍යා විෂයයට පවතින දැඩි කැමැත්ත, උසස් අධ්‍යාපනයට යොමු වීමේ අරමුණ හා ආර්ථික විද්‍යා විෂයයට ඉහළ Z අගයක් පැවතීම යන සාධක බලපා ඇත
- දෙමාපියන්ගේ බලපෑම, පාසලෙන් ලබා දුන් උපදෙස්, මිතුරන්ගේ බලපෑම හා ජනමාධ්‍යවලින් ආර්ථික විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කළ කරුණු යන විෂයය තෝරා ගැනීමට බලපා නැත
- ආර්ථික විද්‍යා විෂයය පහසු නිසා තෝරා ගැනීම, ගුරු උපදෙස්, අ.පො.ස (උ.පෙ.) අනෙකුත් විෂයවලට ගැළපෙන නිසා තෝරා ගැනීම, සමාජයේ පවතින ගැටලු පිළිබඳ ව අවබෝධයක් ලැබීමේ අරමුණ හා එදිනෙදා ජීවිතයේ තීරණ ගැනීමට වැදගත් වන නිසා තෝරා ගැනීම යන සාධක මධ්‍යස්ථ ව බලපා ඇත

යෝජනා

1. අ.පො.ස. (උ.පෙ.) කලා විෂයධාරාව යටතේ පවතින ඉතා වැදගත් ප්‍රයෝගික විෂයයක් ලෙස ආර්ථික විද්‍යාව හැඳින්විය හැකි නිසා එම විෂයය අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ ව පාසල් සිසුන් ගුරුවරුන් දෙමාපියන් ඇතුළු සමස්ත ප්‍රජාව ම දැනුවත් කිරීම

2. මුද්‍රිත මාධ්‍යයෙන් හා විද්‍යුත් මාධ්‍යයෙන් සමස්ත සමාජය ම දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු ය

3. අ.පො.ස. (සා.පෙ.) විෂයමාලාවට නව විෂයයක් ලෙස ආර්ථික විද්‍යාව විෂයයක් ලෙස ඇතුළත් කිරීම

4. අ.පො.ස. (උ.පෙ.) කලා විෂය ධාරාව යටතේ ආර්ථික විද්‍යා විෂයය තෝරා සිසුන් සංඛ්‍යාව ක්‍රමානුකූල ව පහළ වැටී ඇති නිසා එය ප්‍රවර්ධනය කිරීමට විෂයමාලා නවීකරණය කිරීම

5. අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තෝරා ගැනීම පිළිබඳ අ.පො.ස (සා.පෙ.) මට්ටමින් සිසුන් දැනුවත් කිරීම

ආශ්‍රිත ග්‍රන්ථ

අතුකෝරළ, ඩී. ආර්., සහ අතුකෝරළ, එම්.එන්. (1990). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා.* ශික්‍ෂා මන්දිර ප්‍රකාශන.

අතපත්තු, ඩී. (2009). *ආර්ථික විද්‍යා ප්‍රවේශය I.* මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

අබේපාල, ආර්. (2010). *අධ්‍යාපන මනෝවිද්‍යාත්මක පදනම.* කොට්ටාව: සාර ප්‍රකාශන.

ජාතික අධ්‍යාපන ආයතනය (2017). *ආර්ථික විද්‍යාව විෂයනිර්දේශය.* මහරගම:ජාතික අධ්‍යාපන ආයතනය.

ජාතික අධ්‍යාපන ආයතනය (2018). *ආර්ථික විද්‍යාව 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (1999). *1998 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස්පෙළ.* පානළුව: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (1999). *1999 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන ද්විතීයික අධ්‍යාපනය (6 -11) ශ්‍රේණි.* පානළුව: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (2014). *අ.පො.ස උසස් පෙළ ඇගයීම් වාර්තාව - 2014 ආර්ථික විද්‍යාව.* බත්තරමුල්ල: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (2018). *අ.පො.ස උසස් පෙළ ඇගයීම් වාර්තාව" 2017 ආර්ථික විද්‍යාවග* බත්තරමුල්ල: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා මහ බැංකුව (2017). *ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව.* කොළඹ: එම්.ඩී. ගුණසේන.

ශ්‍රී ලංකා මහ බැංකුව (2016). *ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව.* කොළඹ: එම්.ඩී. ගුණසේන.

Anake, P.M., Goodluck, K. U., & Odike, E. L. (2018). *An Appraisal of Eli Ginzberg and Associates Theory of Career Development;* Retrieved from: [(PDF) An Appraisal of Eli Ginzberg and Associates Theory of Career Development. (researchgate.net)]

Jin,W., Muriel, A., & Sibieta, L. (2010). *Subject and course choices at ages 14 and 16 amongst young people in England*; Retrieved from:https://assets.publishing.service.gov.uk/media/5a7af357ed915d71db8b3a93/DFE-RR160.pdf

Krejcie, R.V., & Morgen, D.W. (1970). *Determining Sample Size for Reserch Article. Educational and Psychological Measurment;* Retrieved from: (PDF) Sample Size Determination Using Krejcie and Morgan Table (researchgate.net)

Ministry of Education (2020). *National Curriculum Framework for Secondary Education in Sri Lanka* ; Retrieved from: https://educationforum.lk/wp-content/uploads/2021/08/MoE_Framework_SecondaryEducation_2020Nov.pdf

Rodeiro, C.V. (2007). *A. Level subject choice England*; Retrieved from: 111069-a-level-subject-choice-in-england-patterns-of-uptake-and-factors-affecting-subject preferences.pdfcambridgeassessment.org.uk

Whiteley, S., & Porter, J. (1998). *Tertiary Entrance Procedures Authority (TEPA) Student Perceptions of Subject Selection: Longitudinal Perspectives from Queensland Schools*; Retrieved from: https://www.researchgate.net/publication/251287191STUDENT_PERCEPTIONS_OF_SUBJECT SELECTION_LONGITUDINAL_PERSPECTIVES_FROM_QUEENSLAND_SCHOOLS

ප්‍රකාශක:
පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව